
වාර්ෂික වාර්තාව
வருடாந்த அறிக்கை
Annual Report

2020
ජනවාරි - දෙසැම්බර්

අංක 45, නාවල පාර, නාරාහේන්පිට,
කොළඹ 05

මිල්කෝ (ප්‍රයිවට්) ලිමිටඩ්
மில்கோ (தனி) நிறுவனம்
Milco (Pt) Ltd



Highland

අපගේ දැක්ම

මිල්කෝ සමාගම ශ්‍රී ලංකාවේ විශිෂ්ඨතම පෝෂ්‍යදායී ආහාරපාන සමාගම බවට පත්කිරීම.

අපගේ මෙහෙවර

දේශීය කිරි ගොවියා ශක්තිමත් කරමින් නැවුම් කිරි නිෂ්පාදනයේ ඉලක්ක ගත වර්ධනය සාක්ෂාත් කර ගැනීමෙහිලා ක්‍රියාකාරී පාර්ශවකරුවකු වීම.

අපගේ වටිනා පාරිභෝගිකයන් හට දැරියහැකි මිලකට පෝෂ්‍යදායී ආහාරපාන සැපයීම වස් නවීන තාක්ෂණයෙන් හෙබි අඛණ්ඩ අභිවෘද්ධි ප්‍රවේශයක් අනුගමනය කිරීම.



අන්තර්ගතය

ආයතනික තොරතුරු	1
අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු සහ ජ්‍යෙෂ්ඨ කළමණාකාරිත්වය	2 - 3
සභාපති තුමාගේ පණිවිඩය	4
අධ්‍යක්ෂකවරුන්ගේ වාර්තාව	5 - 6
කාර්ය සාධනයේ විශේෂ අවස්ථා	7 - 8
සංස්ථාමය පාලනය	9
විගණන කමිටු වාර්තාව	10 - 11
මූල්‍ය තත්ව පිළිබඳ ප්‍රකාශනය	12
ආදායම් ප්‍රකාශනය	13
ස්කන්ධ වෙනස්වීම් ප්‍රකාශනය	14
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය	15 - 16
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්	17 - 51
විගණකාධිපතිවරයාගේ වාර්තාව	52 - 65
විශේෂ මූල්‍ය සිදුවීම්	66

DSSPI - Tel: 2847042 / 2849600 Fax: 2851348

සංස්ථානික තොරතුරු

සමාගමේ නම	-	මිල්කො (පුද්ගලික) සමාගම
නෛතික තත්ත්වය	-	1982 අංක 17 දරන සමාගම් පනතේ විධි විධාන යටතේ ශ්‍රී ලංකාවේ ස්ථාපිත සහ 2007 අංක 07 දරන සමාගම් පනතෙන් නැවත ලියාපදිංචි කළ සීමිත වගකීම් සමාගමකි.
ලියාපදිංචි කාර්යාලය	-	අංක 45, නාවල පාර, නාරාහේන්පිට, කොළඹ 05
	-	දුර: 0112586174 ,0114500541
	-	ෆැක්ස් : 0112368082/ 0112577540/ 0114500555
	-	වෙබ් අඩවිය: www.milco.lk
	-	ඊමේල්: info@milco.lk
කර්මාන්තශාලා	-	කොළඹ කිරි කර්මාන්ත ශාලාව (CMF)
	-	අඹේවෙල විසිරි වියලන කිරි කර්මාන්ත ශාලාව (SDMF)
	-	දිගන කිරි කර්මාන්ත ශාලාව (DMF)
	-	පොළොන්නරුව උකු කිරි කර්මාන්ත ශාලාව (PMF)
ස්ථාපන දිනය	-	1996 මැයි 09
යළි ලියාපදිංචි දිනය	-	2008 මැයි 19
සමාගම් ලියාපදිංචි අංකය	-	N (PVS) 17159 (පැරණි)
	-	PV 2942 (නව)
සමාගම් ලේකම්වරු	-	ෆයිනෑන්ෂල් සර්විසස් ඇන්ඩ් කමර්ෂල් ඒජන්සීස් පුද්ගලික සමාගම අංක 300/3, නාවල පාර, නාවල
අධ්‍යක්ෂවරුන්	-	ලසන්ත වික්‍රමසිංහ මයා - සභාපති ඩබ්ලිව්.පී. මෙන්ඩිස් අබේසේකර මයා - අධ්‍යක්ෂ යූ.එම්. ඉන්දික අබේවික්‍රම මයා - අධ්‍යක්ෂ සංජීව ගුණවර්ධන මයා - අධ්‍යක්ෂ එච්. විජිත කුමාර මයා - අධ්‍යක්ෂ එච්. ඇන්තනිගේ අමරසේන මයා - අධ්‍යක්ෂ
විගණකවරු	-	අභ්‍යන්තර විගණක කළමනාකරු අයි.ඒ. කාරියවසම් මයා
	-	බාහිර - රජයේ විගණක විගණකාධිපති දෙපාර්තමේන්තුව
බැංකුකරුවන්	-	මහජන බැංකුව
	-	ලංකා බැංකුව

වයි.ජී.අයි. සමන් කුමාර මහතා (සභාපති)

කුමාර මහතා වර්තමානයේ දී මිල්කෝ පුද්ගලික සමාගමේ සභාපති ධුරය හොබවන අතර ඔහු රුහුණු විශ්වවිද්‍යාලයේ උපාධිධරයෙකි. එමෙන්ම, ඔහු රුහුණ විශ්වවිද්‍යාලයෙන් ප්‍රජා සංවර්ධනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ද, කැළණිය විශ්ව විද්‍යාලයෙන් පුරා විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ද, මොරටුව විශ්ව විද්‍යාලයෙන් අවකාශීය සැලසුම්කරණ කළමනාකරණය සහ සැලසුම් පිළිබඳ පශ්චාත් උපාධියක් ද ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් නිශ්චල දේපල කළමනාකරණය සහ තක්සේරු විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධියක් ද ලබා සිටී. ඔහු ලංකා විදුලි බල මණ්ඩලයේ උප සභාපති, හදබිම අධිකාරියේ සභාපති, ලංකා ධීවර වරාය සංස්ථාවේ කළමනාකරණ අධ්‍යක්ෂ යන තනතුරුවල සේවය කර ඇත

එච්.එම්.එම්. බණ්ඩාර හේරත් මහතා (විධායක නොවන අධ්‍යක්ෂ)

හේරත් මහතා ඉඩම් ගොඩකිරීමේ සංස්ථාවේ ක්‍රියාකාරී අධ්‍යක්ෂ, Remark Holdings හි කළමනාකාර අධ්‍යක්ෂ, Doodu International (Pvt) Ltd හි කළමනාකාර අධ්‍යක්ෂ, සීමාසහිත ජාතික තරුණ සේවා සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂ, සුගතදාස ක්‍රීඩාංගණයේ සහ සහ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙස ද කටයුතු කර ඇත.

එල්. එච්.එම්.එස්. ශාන්ත කුමාර මහතා (විධායක නොවන අධ්‍යක්ෂ)

කුමාර මහතා, රාජ්‍ය සේවයේ වසර 18 ක පළපුරුද්දක් සහිත නිලධාරියෙකි. වාරියපොළ කෘෂිකර්ම පාසලේ ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරිවරයා ලෙස සේවය කර ඇති ඔහු කොටවෙහෙර සහ බමුණකොටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සේවය කර ඇත.

අරෝෂ රුද්රිගු මහතා (විධායක නොවන අධ්‍යක්ෂ)

අරෝෂ මහතා එක්සත් රාජධානියේ වෝර්වික් විශ්ව විද්‍යාලයෙන් උපාධිය ලබා ඇත. ඔහු එක්සත් රාජධානියේ වරලත් ගණකාධිකාරීවරුන්ගේ සංගමයේ සහ ICAEW (එංගලන්තයේ සහ වේල්ස්හි වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය) ආශ්‍රිත සාමාජිකයෙක් ද වේ. තවද, ඔහු වී අලෙවි මණ්ඩලයේ, පරමාණුක බලශක්ති මණ්ඩලයේ, ලංකා ධීවර වරාය සංස්ථාවේ මෙන්ම ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙසද කටයුතු කර ඇත.

ජී.එස්.එම්. කැලුම් ගුණතිලක මහතා (විධායක නොවන අධ්‍යක්ෂ)

ගුණතිලක මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ උපාධිධරයෙකි. ඔහු ස්වාධීන රූපවාහිනී සේවයේ (ITN) ප්‍රවෘත්ති නිෂ්පාදකවරයෙකු ලෙස කටයුතු කර ඇති අතර රජයේ අමාත්‍යාංශ කිහිපයක මාධ්‍ය ලේකම්වරයෙකු ලෙසද කටයුතු කර ඇත.

ඩබ්.ඩී. රොහාන් ක්‍රිෂාන්ත මහතා (විධායක නොවන අධ්‍යක්ෂ)

ක්‍රිෂාන්ත මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ උපාධිධරයෙකි. ඔහු කොළඹ විශ්වවිද්‍යාලයෙන් තාක්ෂණවේදය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ද, ඕස්ට්‍රේලියාවේ ඕස්ට්‍රේලියානු ජාතික විශ්වවිද්‍යාලයෙන් ජාත්‍යන්තර ආර්ථික විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ද, කොළඹ විශ්වවිද්‍යාලයෙන් මූල්‍ය ආර්ථික විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධියක් ද ලබා ඇත. ක්‍රිෂාන්ත මහතා දැනට විදේශ ප්‍රතිසංස්කරණ දෙපාර්තමේන්තුවේ සේවය කරන අතර මිල්කෝ පුද්ගලික සමාගමේ භාණ්ඩාගාර නියෝජිත මණ්ඩල සාමාජිකයෙකු ලෙසද කටයුතු කරයි.

කේ.චමීන් දිනේෂ් මහතා (විධායක නොවන අධ්‍යක්ෂ)

දිනේෂ් මහතා යාන්ත්‍රික ඉංජිනේරු ක්ෂේත්‍රයේ උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාවක් (HNDE) දරයි. දැනට මාර්ග සංවර්ධන අධිකාරියේ යාන්ත්‍රික ඉංජිනේරුවරයා ලෙස සේවය කරන ඔහු, වරාය හා මහාමාර්ග අමාත්‍යාංශයේ සහ මගනැගුම මාර්ග ඉදිකිරීම් සහ උපකරණ සමාගමේ ප්‍රවාහන කළමනාකරු ලෙසද කටයුතු කර ඇත.

ජී. ඒ. අරුණ ප්‍රසන්න මහතා (විධායක නොවන අධ්‍යක්ෂ)

ප්‍රසන්න මහතා පාලනය, ප්‍රජාතන්ත්‍රවාදය සහ රාජ්‍ය ප්‍රතිපත්ති පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාවක් දරයි. ඔහු AMR Distribution (PVT)LTD හි අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙස සහ IDAPZ (PVT)LTD හි අලෙවි කළමනාකරු ලෙස ද සේවය කර ඇත.

අනු අංක:	ආමන්ත්‍රණය	නම	තනතුර
1	මහතා.	එම්.පී.කේ. ජයරත්න	වැඩ බලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී- මෙහෙයුම්
2	මහතා.	එච්.එම්.ඩබ්. රාජපක්ෂ	වැඩ බලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - පාලන සහ මූල්‍ය
3	මහතා.	යූ.ජී.ඒ.එම්.ඒ.ආර්.කේ. අතපත්තු	කර්මාන්තශාලා කළමනාකරු
4	මහතා.	ජී.ඒ.පී.ජේ. උදයකුමාර	කර්මාන්තශාලා කළමනාකරු
5	මහතා.	ජී.වයි.ජී. සමන්	කර්මාන්තශාලා කළමනාකරු
6	මහතා.	ආර්.ජී.එච් රණසිංහ	වැඩ බලන කර්මාන්ත ශාලා කළමනාකරු
7	මහතා.	පී.එල්. කේ. ලාල් කුරේ	වැඩ බලන කළමනාකරු - DD සහ MP
8	මහතා.	ප්‍රදීප් සේනාධීර	කළමනාකරු - ව්‍යාපෘති සහ ඉංජිනේරු
9	මහතා.	එම්.ජී.පී ප්‍රේමතිලක	මූල්‍ය කළමනාකරු
11	මිය	බී.කේ.යූ.බී රුද්‍රිගු	කළමනාකරු - නීති
12	මහතා.	එස්.එම්.එස්. වන්ද්‍රදාස	වැඩ බලන කළමනාකරු - මා.සම් හා පරිපාලන
13	මහතා.	ඩබ්.ඒ.ඩබ්.පී පෙරේරා	වැඩ බලන කළමනාකරු - අලෙවිකරණ සහ අලෙවි
14	මහතා.	අයි.ජී.ආර්.එස්. ගුණරත්න	වැඩ බලන කළමනාකරු - මිලදී ගැනීම්
15	මිය	එම්.පී.ජේ. එදිරිසිංහ	වැඩ බලන කළමනාකරු - තත්ත්ව පාලන, පර්යේෂණ සහ සංවර්ධන

සභාපතිතුමාගේ පණිවුඩය

ජාතික කිරි මණ්ඩලයේ අනුප්‍රාප්තික සමාගම වශයෙන් මේ වන විට ක්‍රියාත්මක වන මිල්කෝ සමාගමේ 2020 වසර සඳහා වන වාර්ෂික වාර්තාවට පණිවුඩයක් නිකුත් කරනුයේ ඉමහත් සතුටිනි. සමාගමේ පැවැත්ම මෙන්ම දේශීය කිරි කර්මාන්තයේ උන්නතිය පෙරදැරි කරගෙන ක්‍රියාත්මක වන මිල්කෝ සමාගම 2020 වර්ෂය වෙනුවෙන් රු. මිලියන 225 ක ශුද්ධ ලාභයක් පෙන්නුම් කර ඇත. කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් සංචරණ සීමා පනවා තිබූ වාතාවරණය තුළ වුවද මිල්කෝ සමාගම සිය මෙහෙයුම් කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යමින් ග්‍රාමීය කිරි ගොවි ජනතාවගේ කිරි අස්වනු මිලදී ගැනීම නොකඩවා සිදුකිරීමටත්, ඒ තුළින් ඔවුන්ගේ ආදායම් බිඳවැටීමකින් තොරව පවත්වාගැනීමටත්, පාරිභෝගික ජනතාව වෙත පෝෂ්‍යදායී කිරි ආහාර අඛණ්ඩව සැපයීමටත් සමත් වී ඇත.

තවද, 2020 වසර තුළ දී කිරි පට්ටි සංවර්ධන කටයුතු මෙන්ම ආයතනයේ දෛනික ක්‍රියාවලිය බිඳවැටීමකින් තොරව පවත්වාගැනීම උදෙසා මිල්කෝ සමාගම දැඩි පරිශ්‍රමයක් දරා ඇති බව දක්නට ලැබේ. මෙහිදී පහත සඳහන් සංවර්ධන ව්‍යාපෘති ප්‍රධාන වන්නේ ය.

- තෘණ වගා කිරීම සඳහා ගොවීන් 792කු වෙත පහසුකම් සලසා ඇත.
- නව ස්වයංපාලිත කිරි ගොවි සමිති 80 ක් ආරම්භ කර ඇත.
- දෛනික කිරි නිෂ්පාදන ධාරිතාවය ලීටර් 200 ක් බැගින් වන ගොවිපොළ 10ක්ද, දෛනික කිරි නිෂ්පාදන ධාරිතාවය ලීටර් 100ක් බැගින් වන ගොවිපොළ 16ක්ද දිවයිනේ විවිධ පළාත්වල ආරම්භ කර ඇත.
- කිරි දෙවීමෙන් තොරව නිදැල්ලේ සිටි දෙනුන් අතරින් තෝරාගත් දෙනුන් ගාල්කර කිරි දෙවීම ආරම්භ කිරීමට ගොවීන් පෙළඹවීම. මේ යටතේ ගොවීන් 32 දෙනෙකු කටයුතු කර ඇත.
- ජංගම පශු වෛද්‍ය සායන 294ක් පවත්වා ඇත.
- ස්වයංපාලිත කිරි ගොවි සමිතිවල ක්‍රියාත්මක ක්‍රමවේදය පිළිබඳව එම සමිතිවල නිලධාරීන් 1,041 දෙනෙකු එක් දින වැඩමුළු මගින් පුහුණු කර ඇත.
- ගොවිපොළ කළමනාකරණය පිළිබඳව කිරි ගොවීන් 4,022කට එක් දින වැඩමුළු මගින් පුහුණුවීම් ලබා දී ඇත.
- සවස එකතුකරන කිරි පසුදින තෙක් නරක් නොවී පවත්වා ගැනීම සඳහා, 'කිරි සිසිලකය' නමින් නව යන්ත්‍රයක් හඳුන්වාදී ඇත.

අපගේ පාරිභෝගික ජනතාව වෙත උසස් ප්‍රමිතියෙන් යුතු කිරි නිෂ්පාදන සැපයීම අරමුණු කරගනිමින් උසස් ප්‍රමිතියෙන් යුතු අමුකිරි හා අනෙකුත් අමුද්‍රව්‍ය පමණක් යොදාගැනීම වගකිව යුතු රාජ්‍ය ආයතනයක් වශයෙන් මිල්කෝ සමාගමේ ඇති සුවිශේෂත්වයයි. ප්‍රධාන වශයෙන් අමුකිරි මිලදී ගැනීමේ දී ප්‍රමිති නිර්ණායක මත පදනම් ව කිරි මිලදීගැනීම තුළින් නිමි නිෂ්පාදනවල ප්‍රමිතිය ආරක්ෂා කරගැනීමට කටයුතු කිරීම අගය කළයුතු කරුණකි. මිල්කෝ සමාගමේ නිෂ්පාදන ක්‍රියාවලියෙහි ප්‍රධාන අමුද්‍රව්‍යය වන අමුකිරි තොග සපයාගැනීම ක්‍රමයෙන් ගැටළුකාරී තත්ත්වයක් බවට පත්වෙමින් තිබේ. එහෙයින්, දෛනිකව මිලදී ගනු ලබන කිරි ප්‍රමාණය වැඩිකර ගැනීම සඳහා පවතින ක්‍රමවේදයන්ට අමතරව වෙනත් උපාය මාර්ගික ක්‍රමවේද අනුගමනය කිරීම අත්‍යවශ්‍ය වී ඇත.

2020 වර්ෂය තුළ දී මිල්කෝ ආයතනයේ මෙහෙයුම් කටයුතු තුළින් ශුද්ධ ලාභයක් ඉපයීමට උරදුන් කාර්ය මණ්ඩලය, කිරි ගොවි ජනතාව, බෙදාහැරීම් හා වෙළඳ ප්‍රජාව මෙන්ම අපගේ පාරිභෝගික ජනතාව ද කෘතවේදීව සිහිපත් කරමි.

ජානක ධර්මකීර්ති
සභාපති (වැ/බ)

මිල්කෝ (පුද්ගලික) සමාගමේ අධ්‍යක්ෂවරුන් 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා අධ්‍යක්ෂවරුන්ගේ වා ර්තා ව සහ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශය ඉදිරිපත් කරනු ලබන්නේ ඉතා සතුටිනි.

ප්‍රධාන කටයුත්ත

වර්ෂය තුළ සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම් වූයේ නැවුම් කිරි එකතු කිරීම, සැකසීම, ඇසුරුම් කිරීම, බෙදා හැරීම , සහ කිරි නිෂ්පාදන අලෙවිකරණය කිරීමයි.

දේපළ පිරියත සහ උපකරණ

සමාගමේ දේපල, පිරියත සහ උපකරණ සඳහා වර්ෂය තුළ සිදු කරන ලද එකතු කිරීම් රුපියල් මිලියන 58.1 ක් වන අතර වැඩිදුර විස්තර මූල්‍ය ප්‍රකාශනවල සටහන 03 හි දක්වා ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලය

2020.01.01 සිට පහත අධ්‍යක්ෂ මණ්ඩලය ක්‍රියාත්මක විය

ලසන්ත වික්‍රමසිංහ මයා - සභාපති
වලිමුනි ප්‍රසන්න මෙන්ඩිස් අබේසේකර මයා - අධ්‍යක්ෂ
උෂාන් මධුෂ ඉන්දික අබේවික්‍රම මයා - අධ්‍යක්ෂ
සංජීව ගුණවර්ධන මයා - අධ්‍යක්ෂ
හේමන්ත විජිත කුමාර මයා - අධ්‍යක්ෂ
හේවා අන්තෝනිගේ අමරසේන මයා - අධ්‍යක්ෂ

මණ්ඩලයට අදාළව පහත පත්වීම්/අස්වීම් පහත ආකාරයෙන් ක්‍රියාත්මක විය.

බියන්කා නිරෝශනී ගමගේ මෙය - 2020.01.11 දින සිට ක්‍රියාත්මක වන පරිදි එච්.වී කුමාර මහතා මගින් ප්‍රතිස්ථාපනය කෙරිණි.
බිමල් ප්‍රියංකර ජයසිරි මයා - 2020.01.15 දින සිට ක්‍රියාත්මක වන පරිදි එච්.ඒ.අමරසේන මයා මගින් ප්‍රතිස්ථාපනය කෙරිණි
සෙනරත් අතුල කුමරසිරි මයා - 2020.01.15 දින සිට ක්‍රියාත්මක වන පරිදි එච්.ඒ.අමරසේන මයා මගින් ප්‍රතිස්ථාපනය කෙරිණි
කාරියවසම් සිගප්පුලි තන්ත්‍රිගේ යසපාල මයා - 2020.01.31 දින සිට ක්‍රියාත්මක වන පරිදි එස්.ගුණවර්ධන මයා මගින් ප්‍රතිස්ථාපනය කෙරිණි
දීපාල් කුමාර ක්‍රිෂ්ණකුමාර වසන්ජී මයා - 2020.01.15 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඩබ්.පී.එම්.අබේසේකර මයා මගින් ප්‍රතිස්ථාපනය කෙරිණි
ආනන්ද දිසානායක මයා 2020.01.10 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉල්ලා අස් විය.

කොටස් තොරතුරු

සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනය සමාලෝචිත වසරේදී වටිනාකම 319,454,060. ක් විය

සංචිත

ඉදිරියට ගෙන ආ සමුච්චිත අලාභ වන රු. 145,248,000/= විස්තීරණ ආදායම් ප්‍රකාශයේ දක්වා ඇති වත්මන් වසරේ පාඩුව වන බදුවලින් පසු රු.28,787,324/= ට ගලපා ඇත.
වසර අවසානයේ සංචිතයට රු.25,000,000/= ක ප්‍රාග්ධන සංචිතය සහ රු.1,689,978/= නිදන් අරමුදල් අයත් වේ.

අධ්‍යක්ෂවරුන්ගේ ගිවිසුම්ගත සම්බන්ධතා

අධ්‍යක්ෂවරු සෘජුව හෝ වක්‍රව සමාගමේ කිසිදු ගිවිසුමකට සම්බන්ධ වී නැත.

ආයතනික පාලනය

අධ්‍යක්ෂ මණ්ඩලය යහපත් ආයතනික පාලනයක් සහතික කරයි. සමාගමේ අරමුණු මෙන්ම පා ර්ශවකරුවන්ගේ අරමුණු හා අපේක්ෂාවන්ට අනුකූලව කා ර්ය සාධනය සහතික කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ යුතුකමකි.

බදුකරණය

පොළී ආදායමෙන් පැන නගින ආදායම් බදු වගකීම, ගෙන එන ලද බදු පාඩුවලට හිලව් කරන ලදී. වසර තුළ දී සමාගම මෙහෙයුම් පාඩු ලබා ඇති අතර එමගින් මෙහෙයුම් කටයුතු වලින් බදු වගකීමක් වා ර්තා වී නොමැත.

ව්‍යවස්ථාපිත ගෙවීම්

රජයට, සේවක අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල වෙත ගෙවිය යුතු සියලුම ව්‍යවස්ථාපිත ගෙවීම් නිවැරදිව හා නියමිත වේලාවට ගෙවා ඇති බවට අධ්‍යක්ෂවරුන් ඔවුන්ගේ දැනුමෙන් හා විශ්වාසයෙන් උපරිම ලෙස සෑහීමකට පත්වේ.

අනුකූලතාව

සමාගම ශ්‍රී ලංකාවට හෝ වෙනත් තැනකට අදාළ වන නීති හෝ රෙගුලාසිවලට පටහැනි ක්‍රියාකාරකම්වල නිරත වී නොමැත.

අඛණ්ඩ පැවැත්ම

ඉදිරි අනාගතයේ දී සිය මෙහෙයුම් දිගටම කරගෙන යාමට සමාගමට ප්‍රමාණවත් සම්පත් තිබීම පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය සෑහීමකට පත්වේ. මෙය සැලකිල්ලට ගනිමින්, සමාගමේ ගිණුම් සකස් කිරීමේදී අඛණ්ඩ පැවැත්ම සංකල්පය අපි දිගටම ක්‍රියාත්මක කරමු.


විගණකවරුන් පත් කිරීම

2020 වසර සඳහා සමාගමේ විගණක වූයේ විගණකාධිපතිවරයා ය.
2020.12.31 න් අවසන් වන වසර සඳහා සමාගමේ විගණක වන්නේ විගණකාධිපතිවරයා ය.. අධ්‍යක්ෂවරුන් දන්නා පරිදි, විගණකවරුන්ට ඔවුන්ගේ ස්වාධීනත්වයට බලපෑමක් ඇති කරන අයුරින් සමාගම සමග කිසිදු සම්බන්ධයක් නොමැත.


අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන්,

.....


සමාගම් ලේකම්
ෆයිනෑන්ෂල් සර්විසස් ඇන්ඩ කමර්ෂල් ඒජන්සිස් පුද්ගලික සමාගම
(RCS2000074) අංක 300/3, නාවල පාර, නාවල




කිරි එකතු කිරීම පහත වැටීමෙන් පසුව, 2019 දී ආදායමට සැලකිය යුතු බලපෑමක් ඇති විය. කෙසේ වෙතත්, 2020 දී කිරි එකතු කිරීමේ මට්ටම තරමක් වැඩි වීම සහ නිෂ්පාදන මිල වලනයන් සමඟ එය යථා තත්ත්වයට පත් වීමට ආරම්භ වී තිබේ.




2018 සහ 2019 දී කිරිපිටි තොගයේ සාක්ෂාත් කරගත හැකි අගය පහත වැටීමත් සමගම GP අනුපාතයට සැලකිය යුතු බලපෑමක් එල්ල විය. (අලෙවි කළ නොහැකි තත්ත්වයේ) 2020 දී අසාමාන්‍ය ගනුදෙනුවක් වාර්තා නොවූ බැවින්, GP සාමාන්‍ය තත්ත්වයට පත්ව ඇත.




අලෙවි කළ නොහැකි කිරිපිටි තොග ඇගයුම් ගැලපීමෙන් පසුව, සමාගම 2018 සහ 2019 මූල්‍ය වර්ෂවල ශුද්ධ පාඩු වාර්තා කර ඇත. එය 2020 වසරේදී යථා තත්ත්වයට පත් වූ අතර එම කාලය සඳහා සමාගම රු.මි.225.76 ක ශුද්ධ ලාභයක් ලැබීය.





සැලකිය යුතු ලෙස ඉහළ ගිය ජාතික කිරි නිෂ්පාදනය හේතුවෙන්, 2017 සහ 2018 වසරවල වාර්ෂික එකතු කිරීමේ මට්ටම ලීටර් මිලියන 90 ඉක්මවීමට සමාගමට හැකි විය. කෙසේ වෙතත්, මෙම ප්‍රවණතාවය අඛණ්ඩව සිදු නොවීම සහ අධික තරහකාරිත්වය හේතුවෙන්, 2019 දී වාර්ෂික එකතු කිරීමේ මට්ටම ලීටර් මිලියන 66 දක්වා පහත වැටී ඇති අතර 2020 දී එය සුළු වශයෙන් ඉහළ ගොස් ඇත.





සමාලෝචනයට ලක්වන කාලසීමාව තුළ කිරිපිටි, රුපියල් බිලියන 3.12 ක ඉහළම විකුණුම් අගය වාර්තා කර ඇති අතර එය මුළු අලෙවියෙන් 28% කි. දියර කිරි සහ යෝගට් අලෙවිය ද සමස්ත අලෙවියට පිළිවෙළින් 26% සහ 22% දායකත්වයක් පෙන්නුම් කර ඇත. මෙම නිෂ්පාදන තුන මුළු අලෙවියෙන් 77% ක් හිමි කරගෙන ඇති අතර ඉතිරි අලෙවිය අයිස්ක්‍රීම් වර්ග, බටර්, කිරි, ගිතෙල්, උකු කිරි සහ චීස් වර්ග අලෙවියෙන් සමන්විත වේ.





ඉහත පෙන්වා දී ඇත්තේ එම කාලය තුළ නිෂ්පාදනය සඳහා කිරි භාවිතය පිළිබඳ විශ්ලේෂණයකි.

සමාලෝචිත වර්ෂයේදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මසකට එක් වරක් පදනමින් වාරික අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පවත්වන ලදී. මූල්‍ය පාලනය සහතික කිරීමේදී සහ පවත්වා ගැනීමේදී සංයුක්ත සැලැස්ම සහ වා ර්ෂික අයවැය ප්‍රධාන සාධන පත්‍ර වූ අතර මූල්‍ය වර්ෂය ආරම්භයේදී සියලු රේඛීය කළමනාකරුවන් විමසා ඒවා පිළියෙල කරනු ලදුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරනු ලැබීය.

මාසික කා ර්ය සාධන වා ර්තා පෙර මාසයේ වා ර්තා සමග සංසන්දනය කරනු ලබන අතර තදනන්තර මාසික රැස්වීම්වලදී අයවැය නිතිපතා සභාගත කරන ලදී. මෙම වා ර්තාව ඉලක්ක සහිතව මූල්‍ය සහ මෙහෙයුම් කා ර්ය සාධනය පිළිබඳ කාලීන වා ර්තා සපයන අතර සමාගමේ ලාභය සහ අලාභය සම්බන්ධයෙන් සුදුසු කළමනාකරණ තීරණ ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලයට හැකියාව ලබා දෙයි.

විගණන කමිටුව

භාණ්ඩාගාරය නියෝජනය කරන්නා වූ අධ්‍යක්ෂවරයා විගණන කමිටුවේ මුලසුන දැරිය යුතු අතර කමිටුව තවත් විධායක නොවන අධ්‍යක්ෂවරු දෙදෙනෙකු සහිතව ක්‍රියාත්මක වූ අතර එය අධ්‍යක්ෂ මණ්ඩලයේ අනු කමිටුවක් ලෙස කටයුතු කරන අතර වඩා ඉහළ ස්වාධීනත්වයක් සහතික කිරීම බාහිර ආයතනයකට පිරිනමා ඇති අභ්‍යන්තර විගණනය විසින් එයට සේවය සපයන ලදී.

අර්න්ස්ට් ඇන්ඩ් යං ඇඩ්වයිසරි සර්විසස් (පුද්) සමාගම වර්ෂය තුළදී අභ්‍යන්තර විගණකවරුන් ලෙස කටයුතු කරන ලදී. එම ආයතනය ප්‍රධාන කාර්යාලයට අමතරව කොළඹ, අඹේවෙල, පොලොන්නරුව හා දිගන යන කර්මා න්තශා ලා වල ශාඛා කා ර්යා ල පවත්වාගෙන යනු ලැබේ.

අභ්‍යන්තර විගණකවරුන් විසින් පිළියෙල කරනු ලබන විගණන සැලැස්මක් වර්ෂය ආරම්භයේදී විගණන කමිටුවේ අනුමතිය සඳහා ඉදිරිපත් කරනු ලබන අතර මෙම සැලැස්ම ප්‍රකාරව වසර පුරාම අභ්‍යන්තර විගණන විමසුම් හා පරීක්ෂාවන් සිදුකරනු ලබයි. විගණන අනාවරණයන් පිළිබඳ විස්තරාත්මක වා ර්තා පළමුව අදහස් සහ ප්‍රතිචාර සඳහා අදාළ කළමනාකරුවන් සහ දෙපා ර්තමේන්තු ප්‍රධානීන් සමග සාකච්ඡා කරනු ලැබේ. මෙම අදහස් මත පදනම්ව, සාරාංශ වා ර්තා වක් සකස් කොට විගණන කමිටුවේ සමාලෝචනය සහ පසු විපරම් ක්‍රියා මා ර්ග සඳහා ඉදිරිපත් කරනු ලැබේ. විගණන කමිටුව මසකට වරක් රැස්වේ.

ආයතනික කළමනාකරණය

තම කොටස්කරුවන්ට සාධාරණ නිරවද්‍යතාවයකින් යුතුව සමාගමේ මූල්‍ය තත්ත්වය නියෝජනය වන පරිදි නිසි විගණන වා ර්තා සමාගම පවත්වා ගන්නා බවට අධ්‍යක්ෂ මණ්ඩලය වග බලා ගනී. එසේම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති සහ සමාගම් පනතේ අවශ්‍යතාවන්ට අනුකූල වන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරනු ලබන බවට සහ ඉදිරිපත් කරනු ලබන බවට ඔවුන් සහතික වෙයි.

විගණන කමිටුවේ වාර්තාව

කමිටුවේ ප්‍රඥප්තිය

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත විගණන කමිටු ප්‍රඥප්තිය මගින් කමිටුවේ අරමුණු, අධිකාරය, සංයුතිය, රැස්වීම් සහ වගකීම් අර්ථ නිරූපණය කරයි.

විගණන කමිටුවේ අරමුණු වන්නේ:

1. මූල්‍ය වාර්තාකරණය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ සමස්ත වගකීම සැපිරීමේ ලා එයට සහය වීම.

2. අභ්‍යන්තර පාලන සහ අවදානම් කළමනාකරණ පද්ධතිය සමාලෝචනය කිරීම.

3. අභ්‍යන්තර විගණන ක්‍රියාකාරීත්වයේ ඵලදායීතාව අධීක්ෂණය සහ ඇගයීම.

4. නීති සහ රෙගුලාසි සමග අනුකූලතාව අධීක්ෂණය කිරීමේ සමාගම් ක්‍රියාවලිය සමාලෝචනය කිරීම.

5. බාහිර විගණකවරුන්ගේ ස්වාධීනත්වය සහ කාර්ය සාධනය සමාලෝචනය කිරීම.

සංයුතිය

කමිටුව විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් සමන්විත වේ. සංජීව ගුණවර්ධන මයා, උෂාන් අබේවික්‍රම මයා සහ කමිටුවේ සභාපති එස්.එච්.වී කුමාර මයා ඔවුන් තිදෙනා වෙති. විගණන කමිටුවේ සභාපතිවරයා වන්නේ භාණ්ඩාගාර නියෝජිතයා ය. සමාගම් ලේකම්වරයා විගණන කමිටුවේ ලේකම් ලෙස කටයුතු කරයි.

කමිටුවේ මූලික කාර්යයන් පහත දක්වා ඇත.

රැස්වීම්

සමාලෝචිත වර්ෂයේ පැවති කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් කමිටුව රැස්වූයේ එක් වරකි. සාමාන්‍යාධිකාරිවරයා, මූල්‍ය කළමනාකරු, රජයේ විගණන දෙපාර්තමේන්තුවේ විගණන නියෝජිත, අර්න්ස්ට් ඇන්ඩ් යන්ග් සමාගමේ විගණන කළමනාකරු සහ උපාය මාර්ගික ව්‍යාපාර ඒකකවල කෘත්ය ප්‍රධානීන් අවශ්‍ය වන විටක විගණන කමිටු රැස්වීම් සඳහා කැඳවන ලදී.

අභ්‍යන්තර විගණන සහ අවදානම් කළමනාකරණය

සමාගමේ අභ්‍යන්තර විගණන කටයුතු සිදු කිරීම අර්න්ස්ට් ඇන්ඩ් යන්ග් ආයතනය වෙත පවරා ඇත. කමිටුව විසින් අභ්‍යන්තර විගණන වාර්තා තුළ ඉස්මතු කරන ලද පාලන දුර්වලතා විමසුමට ලක් කළ අතර විගණන නිර්දේශ අනුව කළමනාකාරීත්වය විසින් ගන්නා ලද පසුවිපරම් ක්‍රියාමාර්ග ද සමාලෝචනය කරන ලදී. අභ්‍යන්තර විගණන කෘත්‍යයන්ගේ ඵලදායීතාව මෙන්ම අදාළ වසර තුළ විගණන අභ්‍යන්තර විගණන විෂය පථය සහ ක්‍රියාපටිපාටීන් සමාලෝචනය කළේ ය.

අභ්‍යන්තර පාලන

කමිටුව එහි රැස්වීම්වල දී අභ්‍යන්තර පාලන පද්ධතිවල ඵලදායීතාව සහ නිරවද්‍යතාව හා ව්‍යාපාර සහ මූල්‍ය අවදානම්වලට නිරාවරණය වීමේදී සමාගමේ එළඹුම සමාලෝචනය කළේ ය. සංවිධානයේ වත්කම් ආරක්ෂා කිරීමට සහ මූල්‍ය වාර්තා සැකසීමේදී සහ ඉදිරිපත් කිරීමේදී මූල්‍ය වාර්තාකරණ පද්ධතිය කෙරෙහි විශ්වාසය තැබිය හැකි බව තහවුරු කිරීමට ක්‍රියාවලීන් සකසා ඇත. ජ්‍යෙෂ්ඨ කළමනාකරණය විසින් සමාලෝචනය කෙරෙන සමාගමේ උපාය මාර්ගික ව්‍යාපාරික ඒකකවලට (SBU) අදාළ ප්‍රධාන කාර්ය සාධක නිර්ණායක සියල්ල ඉස්මතු කරමින් සෑම මාසයකම අවසානයේ විස්තීර්ණ කළමනාකරණ වාර්තාවක් සහ ගිණුම් සකසනු ලැබේ. SBU මණ්ඩල මාසික පදනමින් කාර්ය සාධනය සමාලෝචනය කරයි.

මූල්‍ය ප්‍රකාශන

කමිටුව, නිකුත් කිරීමට පෙර සමාගමේ මාසික මූල්‍ය ප්‍රකාශ, වාර්ෂික වාර්තා සහ ගිණුම්වල විස්වසනීය බව, ඒකීය බව සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් සහ 2007 අංක 7 දරණ

සමාගම් පනත ඇතුළු වෙනත් ව්‍යවස්ථාපිත අවශ්‍යතාවලට අනුකූල වන බව සමාලෝචනය කරයි. එමෙන්ම පළ කරන ලද මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කිරීමේ ප්‍රමාණවත් බවද සමාලෝචනය කළේ ය.

බාහිර විගණකවරු

සමාගමේ බාහිර විගණක කටයුතු රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව විගණකාධිපති විසින් සිදු කරනු ලැබේ. බාහිර විගණන කටයුතු ස්වාධීනව සහ කාර්යක්ෂමව සිදුවන බවට කමිටුව වගබලාගත් අතර විගණන ඵලදායීතම හා ක්‍රියා පටිපාටීන් සම්බන්ධයෙන් විගණකාධිපතිවරයාගේ නියෝජිතයන් සමග අඛණ්ඩ සම්බන්ධතාවක් පවත්වා ගත්තේ ය.

බාහිර විගණකවරු, වැදගත් සියලු කටයුතු පිළිබඳව සෑම විට විගණන කමිටුව දැනුවත් කළෝ ය. කමිටුව විගණකවරුන් හමු වී විගණනයෙන් මතුවන ගැටලු සහ අවශ්‍ය නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග සම්බන්ධව සාකච්ඡා කළේ ය.

නිගමනය

විගණන කමිටුව, සංවිධානය තුළ පවතින පාලන පරිසරය සම්බන්ධයෙන් සෑහීමකට පත්වන අතර සමාගමේ මූල්‍ය වාර්තාකරණයේ විශ්වසනීය බව, වත්කම් ආරක්ෂා කර ඇති බව සහ මිල්කෝ පුද්ගලික සමාගමේ ලැයිස්තුගත කිරීමේ රීති අනුගමනය කර ඇති බවට සාධාරණ සහතිකයක් ලබා දෙයි.

ඩබ්.ඩී. රොහාන් ක්‍රිෂාන්ත
විගණන කමිටු සභාපති
2024 අප්‍රේල් 29

වත්කම්	සටහන	2020 දෙසැම්බර් 31 වන දිනට රු:	2019 දෙසැම්බර් 31 වන දිනට රු:
ජංගම නොවන වත්කම්			
දේපළ, පිරියත සහ උපකරණ	2	5,630,047,816	6,065,801,089
භාවිත අයිතිය සහිත වත්කම්	3	48,315,935	-
නොනිමි ප්‍රාග්ධන වැඩ	4	12,536,392,498	12,588,158,537
මූල්‍ය උපකරණ -ක්‍රමක්ෂය වූ පිරිවැය	5	811,519,828	787,696,142
දීසර් කාලීන අත්තිකාරම්	6	139,152,682	139,152,682
මුළු ජංගම නොවන වත්කම්		19,165,428,759	19,580,808,449
ජංගම වත්කම්			
තොග	7	1,132,938,074	1,093,130,830
වෙළෙඳ සහ වෙනත් ලැබිය යුතු දෑ	8	1,075,106,153	1,191,235,517
ලැබිය යුතු ආදායම් බදු	9	121,164,639	212,514,712
මුදල් හා මුදල් සමාන දෑ	10	17,228,129	12,814,551
මුළු ජංගම වත්කම්		2,346,436,994	2,509,695,611
මුළු වත්කම්		21,511,865,754	22,090,504,060
ස්කන්ධ සහ බැරකම්			
ප්‍රකාශිත ප්‍රාග්ධනය සහ සංචිත			
ප්‍රකාශිත ප්‍රාග්ධනය	11	319,454,060	319,454,060
ප්‍රාග්ධන සංචිතය	12	25,000,000	25,000,000
ප්‍රත්‍යාගණන සංචිතය		336,454,463	336,454,463
නිදන් අරමුදල	13	1,689,978	1,689,978
රඳවාගත් ඉපැයුම්		(28,787,324)	(145,248,000)
කොටස් හිමියන්ගේ අරමුදල		653,811,177	537,350,500
ජංගම නොවන බැරකම්			
විලම්භිත බදු බැරකම	14	-	-
පොලී රහිත ණය ගැනීම්	15	2,108,063	2,108,063
පොලී සහිත ණය ගැනුම් - දීසර් කාලීන	15	18,449,096,221	18,572,055,438
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් - පාරිතෝෂික	16	841,552,796	651,565,041
විලම්භිත ආදායම - රජයේ ප්‍රදානය	17	20,081,884	29,079,994
මුළු ජංගම නොවන බැරකම්		19,312,838,963	19,254,808,536
ජංගම වගකීම්			
වෙළෙඳ සහ අනෙකුත් ගෙවිය යුතු දෑ	18	775,475,909	762,087,282
පොලී සහිත ණය ගැනුම් - කෙටි කාලීන	15	96,110,896	135,419,841
බැංකු අයිරා	19	673,628,809	1,400,837,901
මුළු ජංගම බැරකම්		1,545,215,614	2,298,345,024
මුළු ස්කන්ධ සහ බැරකම්		21,511,865,754	22,090,504,060

වරහන් තුළ ඇති සංඛ්‍යාවලින් දැක්වෙනුයේ අඩු කිරීමය

06 පිටුවේ සිට 35 පිටුව දක්වා වන ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අත්‍යවශ්‍ය කොටස් වේ.

මෙම මූල්‍ය ප්‍රකාශ 2007 අංක 07 දරන සමාගම් පනතේ අවශ්‍යතාවයන්ට අනුකූලව සකස් කරන ලද බවට සහතික කරමි.

.....
එම්.ජී.පී. ප්‍රේමතිලක
මූල්‍ය කළමනාකරු

මෙම මූල්‍ය ප්‍රකාශන සැකසීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධව අධ්‍යක්ෂ මණ්ඩලය වග කියනු ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අනුමත කොට අත්සන් කළේ 27.07. 2023

.....
මේඝුක පෙරේරා
සභාපති,
කොළඹ
දිනය :

.....
ඩබ්.ඩී. රොෂාන් ක්‍රිෂාන්ත
අධ්‍යක්ෂ

	සටහන	2020දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා රුපියල්	2019 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා රුපියල්
ආදායම	**20**	11,104,710,548	10,313,820,273
විකුණුම් පිරිවැය		(9,703,560,044)	(9,917,539,530)
දළ ලාභය		1,401,150,505	396,280,743
වෙනත් මෙහෙයුම් ආදායම	**21**	33,475,777	29,709,723
		1,434,626,282	425,990,466
පරිපාලන වියදම්		(798,515,146)	(688,427,005)
බෙදාහැරීමේ වියදම්		(336,890,593)	(399,206,715)
වෙනත් වියදම්		(6,696,851)	(55,158,791)
මෙහෙයුම්වලින් ලාභය/ (අලාභය)		292,523,692	(716,802,045)
මූල්‍ය ආදායම	**22**	52,972,581	49,926,845
මූල්‍ය වියදම්	**23**	(119,739,982)	(195,839,348)
බදුවලට පෙර ශුද්ධ ලාභය/(අලාභය)		225,756,290	(862,714,548)
වෙනත්			
ලාභයට හෝ පාඩුවට ප්‍රතිවර්ගීකරණය නොකෙරෙන අයිතමය:			
බදු අඩුකර නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් නැවත මැනීම		(109,295,614)	(67,714,812)
බදු අඩු කර වෙනත් මුළු විස්තීර්ණ ආදායම		(109,295,614)	(67,714,812)
මුළු විස්තීර්ණ ආදායම		116,460,676	(930,429,360)
කොටසකට මූලික ඉපයීම්/ (අලාභය)	**25**	3.65	(27.01)

වරහන් තුළ ඇති සංඛ්‍යාවලින් දැක්වෙනුයේ අඩු කිරීමය

06 පිටුවේ සිට 35 පිටුව දක්වා වන ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අත්‍යවශ්‍ය කොටස් වේ.

	ප්‍රකාශිත ප්‍රාග්ධනය රුපියල්	ප්‍රාග්ධනය සංචිතය රුපියල්	ප්‍රත්‍යාගණන සංචිතය රුපියල්	නිදන් අරමුදල රුපියල්	රඳවා ගත් ඉපයුම් රුපියල්	එකතුව රුපියල්
2018 දෙසැම්බර් 31 වන දිනට ශේෂය	319,454,060	25,000,000	336,454,463	1,689,978	785,181,360	1,467,779,860
වර්ෂයේ ශුද්ධ ලාභය	-	-	-	-	(862,714,548)	(862,714,548)
වෙනත් විස්තීරණ ආදායම	-	-	-	-	(67,714,812.00)	(67,714,812)
2019 දෙසැම්බර් 31 වන දිනට ශේෂය	319,454,060	25,000,000	336,454,463	1,689,978	(145,248,000)	537,350,500
වර්ෂයේ ශුද්ධ ලාභය	-	-	-	-	225,756,290	225,756,290
වෙනත් විස්තීරණ ආදායම	-	-	-	-	(109,295,614)	(109,295,614)
2020 දෙසැම්බර් 31 වන දිනට ශේෂය	319,454,060	25,000,000	336,454,463	1,689,978	(28,787,324)	653,811,176

වරහන් තුළ ඇති සංඛ්‍යාවලින් දැක්වෙනුයේ අඩු කිරීමය

06 පිටුවේ සිට 35 පිටුව දක්වා වන ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අත්‍යවශ්‍ය කොටස් වේ.

	2020 දෙසැම්බර් 31 වන දිනට	2019 දෙසැම්බර් 31 වන දිනට
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහ	රුපියල්	රුපියල්
බදුවලට පෙර ශුද්ධ ලාභය/(අලාභය)	225,756,290	(862,714,548)
පහත දෑ සඳහා ගැලපීම්;		
දේපළ, පිරියත සහ උපකරණ ක්ෂය වීම	521,879,592	527,623,340
ආයෝජනවලින් ආදායම	(52,972,581)	(49,926,845)
පොළී වියදම්	115,771,068	190,620,525
කල්බදු පොළිය	3,968,828	5,225,511
විලම්බිත ප්‍රදාන මත පිළිගත් ආදායම	(8,998,110)	(12,632,398)
හුවමාරු ලාභය	(14,127,003)	2,566,588
ප්‍රතිපාදන නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් - පාරිතෝෂික	116,410,264	98,254,612
අපහරණ ලාභය	(28,367)	(566,035)
ESC - කපා හැරීම්	91,350,074	15,364,873
කපා හරින ලද නොනිමි ප්‍රාග්ධන වැඩ	-	741,099
භාවිත අයිතිය සහිත වත්කම්	13,321,663	-
කාරක ප්‍රාග්ධන වෙනස්කම්වලට පෙර මෙහෙයුම් ලාභය	1,012,331,717	(85,443,279)
ඉන්වෙන්ට්‍රිවල (වැඩිවීම)/අඩුවීම	(39,807,244)	412,603,520
වෙළෙඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑවල (වැඩිවීම)/අඩුවීම	108,094,364	95,115,502
වෙළෙඳ සහ අනෙකුත් ගෙවිය යුතු දෑවල වැඩිවීම/(අඩුවීම)	13,388,626	(73,730,889)
මෙහෙයුම්වලින් උත්පාදිත මුදල්	1,094,007,463	348,544,854
ගෙවූ පොළිය	(115,771,068)	(190,620,525)
ගෙවූ බදු - ආර්ථික සේවා ගාස්තු සහ ආදායම් බද්ද	-	(52,893,933)
නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් ගෙවීම - පාරිතෝෂික	(35,718,123)	(41,712,485)
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල්/ (භාවිතා කළ)	942,518,272	63,317,912
ආයෝජන ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහය		
දේපළ, පිරියත සහ උපකරණ අත්පත් කරගැනීම	(58,157,140)	(87,503,835)
ඉදිකිරීම් කාර්යයන්හිදී දේපළ, පිරියත හා උපකරණවල ආයෝජන	(29,828,724)	(516,304,352)
වත්කම් අපහරණයෙන් ලැබූ මුදල්	51,352.70	665,582
ලැබූ පොළිය	52,972,581	49,926,845
නව /(මුදල් ආපසු ගැනීමේ) කෙටි කාලීන සහ දීර්ඝ කාලීන ආයෝජන (ශුද්ධ)	(9,696,683)	(20,999,289)
ආයෝජන ක්‍රියාකාරකම් තුළ භාවිත ශුද්ධ මුදල්	(44,658,613)	(574,215,049)
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහය		
ගෙවූ බදු වාරික	(23,426,318)	(30,448,356)
වසර තුළ ප්‍රදානය කළ ණය	-	509,141,829
ණය සහ ණයගැනුම් ආපසු ගෙවීම	(142,810,673)	(122,936,197)
මූල්‍ය ක්‍රියාකාරකම් තුළ භාවිත ශුද්ධ මුදල්	(166,236,991)	355,757,276
මුදල් සහ මුදලට සමාන දේවල ශුද්ධ වැඩි වීම	731,622,668	(155,139,861)
වසර ආරම්භයේ මුදල් සහ මුදල් සමානදෑ (සටහන අ)	(1,388,023,349)	(1,232,883,488)
වසර අවසානයේ මුදල් සහ මුදල් සමාන දෑ (සටහන ආ)	(656,400,681)	(1,388,023,349)

	2020 දෙසැම්බර් 31 වන දිනට - රුපියල්	2019 දෙසැම්බර් 31 වන දිනට - රුපියල්
වසර ආරම්භයේදී		
බැංකුවල ශේෂයන්	7,989,149	13,963,657
අතැති සුළු මුදල්	4,825,402	5,305,601
	12,814,551	19,269,258
බැංකු අයිරා	(1,400,837,901)	(1,252,152,747)
වසර අවසානයේදී		
බැංකුවල ශේෂයන්	12,456,380	7,989,149
අතැති සුළු මුදල්	4,771,749	4,825,402
	17,228,129	12,814,551
බැංකු අයිරා	(673,628,809)	(1,400,837,901)
	(656,400,681)	(1,388,023,350)

වරහන් තුළ ඇති සංඛ්‍යාවලින් දැක්වෙනුයේ අඩු කිරීම්ය

06 පිටුවේ සිට 35 පිටුව දක්වා වන ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අත්‍යවශ්‍ය කොටස් වේ.

1.1. **සංස්ථානික තොරතුරු**

1.1.1 **නෛතික සහ නිත්‍යවාස ස්වභාවය**
සීමාසහිත මිල්කෝ (පුද්ගලික) සමාගම (සමාගම) යනු ශ්‍රී ලංකාවේ සංස්ථාපිත සහ එහි නිත්‍ය වාසය සහිත සීමිත බැඳීම් සමාගමකි.

"සීමාසහිත ලංකා කිරියා කිරි කර්මා න්ත (පුද්) සමාගම" ලෙස මෙම සමාගම 1996 මැයි 09 දින සංස්ථාගත කර ඇත. සමාගමේ නම " සීමාසහිත මිල්කෝ (පුද්) සමා ගම" ලෙස 2001 ජූලි 23 වන දින වෙනස් කරනු ලැබීය. ශ්‍රී ලංකා රජය සහ ඉන්දියා නු ජා තික කිරි සංවර්ධන මණ්ඩලය අතර ඇතිකර ගත් ගිවිසුම ප්‍රකා රව, සීමා සහිත ලංකා කිරි නිෂ්පා දන සමා ගමට 1998 පෙබරවා රි 3 දින වන විට අයත් වූ සහ එම සමා ගම හා විතා කළ (ඉඩම් හැ ර) සියලු දේපළ, පිරියත හා උපකරණවල අයිතිය සහ සීමා සහිත ලංකා කිරි නිෂ්පා දන (පුද්) සමා ගම විසින් එම දිනය වන විට හා විතා කළ ඉඩම් සහ ගොඩනැ ගිලිවල බදු අයිතිය, 1998 පෙබරවා රි 04 වන දින සිට සමා ගම වෙත මා රුකර තිබේ. එසේ මා රු කරන ලද වත්කම්වල ශුද්ධ වටිනා කම රු 306,500,020 කි. තවද, 2000 අගෝ ස්තු 08 දිනැ ති ශ්‍රී ලංකා රා ජ්‍ය ව්‍යවසා ය ප්‍රතිසංස්කරණ කොා මිසමෙහි ලිපියට අනුව බදුගත් ඉඩම හා ගොඩනැ ගිලිවල වා ර්ෂික කල්බදු කුලිය වන රු. 20,427,900/- ක මුදල, ඒකා බද්ධ ව්‍යා පා රය බවට පත් කිරීමේ අමා ත්‍ය මණ්ඩල තීරණයට අනුව අත් හැ ර දමා ඇත.

සමාගමේ ලියාපදිංචි කාර්යාලය අංක 45, නාවල පාර, කොළඹ 05 යන ස්ථානයේ පිහිටා ඇති අතර, ප්‍රධාන ව්‍යාපාරික කටයුතු ද එම ස්ථානයේ සිදු කරනු ලබයි. සමාගමේ ප්‍රධාන කර්මාන්තශාලා නාරාහේන්පිට, අඹේවෙල, දිගන හා පොළොන්නරුව යන ස්ථානවල පිහිටා ඇති අතර 2020 දෙසැම්බර් 31 වන විට බඩල්ගම කම්හල ඉදිකෙරෙමින් පැවතිණි.

1.1.2 **ප්‍රධාන කටයුතු සහ මෙහෙයුම් ස්වභාවය**
වර්ෂය තුළ දී සමාගම විසින් සිදු කළ ප්‍රධාන ක්‍රියාකාරකම් වූයේ කිරි එකතු කිරීම, පිරිසැකසුම, ඇසිරීම, බෙදාහැරීම හා කිරි ආශ්‍රිත නිෂ්පාදන අලෙවි කිරීමයි.

1.1.3 **නිකුත් කිරීමට බලය ලබාදීමේ දිනය**
2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 27.07.2023 දින අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනාවකට අනුව නිකුත් කිරීම සඳහා බලය පවරන ලදී.

1.1.4 **මූල්‍ය ප්‍රකාශ සඳහා වගකීම**
මෙම මූල්‍ය ප්‍රකාශන සැකසීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධව අධ්‍යක්ෂ මණ්ඩලය වග කියනු ලැබේ.

1.2. **ප්‍රධාන ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය**

1.2.1 **පොදු ගිණුම්කරණ ප්‍රතිපත්ති**

1.2.1.1 **මූල්‍ය ප්‍රකාශන සැකසීමේ පදනම**
ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය විසින් නිකුත් කළ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (SLFRS / LKAS) අනුකූලව මූල්‍ය ප්‍රකාශ සකස් කර ඇත.

1.2.1.2 **මැනීමේ පදනම**
SLFRS / LKAS මගින් නියම කරන පරිදි සාධාරණ අගය අනුව ගණන් බැලූ ඇතැම් වත්කම් සහ වගකීම් හැරුණු විට මෙම මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික පිරිවැය සම්ප්‍රදාය යටතේ සකස් කර ඇත.

1.2.1.3 **කෘත්‍යාත්මක සහ නිරූපණ ව්‍යවහාර මුදල**
අදාළ අස්ථිත්වය ක්‍රියාත්මක වන මූලික ආර්ථික පරිසරයෙහි ව්‍යවහාර මුදල භාවිතා කොට මූල්‍ය ප්‍රකාශනවල අඩංගු අයිතම මනිනු ලැබේ. (කෘත්‍යාත්මක ව්‍යවහාර මුදල) සමාගමේ කෘත්‍ය සහ නිරූපණ ව්‍යවහාර මුදල වන ශ්‍රී ලංකා රුපියල්වලින් මූල්‍ය ප්‍රකාශයන් ඉදිරිපත් කර ඇත.

1.2.1.4 අනුකූලතාව පිළිබඳ ප්‍රකාශය

2020 දෙසැම්බර් 31 වන දිනට සමාගමෙහි මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය, විස්තීරණ ආදායම් ප්‍රකාශය, ස්කන්ධ වෙනස්වීම් සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ සමාගමේ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් (මූල්‍ය ප්‍රකාශ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරවරුන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (LKAS/ SLFRS) ප්‍රකාරව පිළියෙල කර ඇත.

1.2.1.5 අඛණ්ඩ පැවැත්ම

අඛණ්ඩ පැවැත්ම සඳහා සමාගමට ඇති හැකියාව පිළිබඳව සමාගමේ අධ්‍යක්ෂවරුන් විසින් ඇගයීමක් සිදු කරනු ලදුව, පූර්වාපේක්ෂිත අනාගතය තුළ ව්‍යාපාර කටයුතුවල නිරත වීමට අවශ්‍ය සම්පත් සමාගම සතු බවට සෑහීමට පත්විය. තවද සමාගමට අඛණ්ඩ පැවැත්මකට ඇති හැකියාව පිළිබඳව සැලකිය යුතු සැකයන් ඇති කරන වැදගත් අවිනිශ්චිතතාවක් කළමනාකාරීත්වයට දැනගන්නට නැත. එබැවින් අඛණ්ඩ පැවැත්ම පදනම් කොටගෙන තවදුරටත් මූල්‍ය ප්‍රකාශ සකස් කරනු ලැබේ.

1.2.1.6 සන්සන්දනාත්මක තොරතුරු

ගිණුම්කරණ ප්‍රතිපත්ති සමාගම විසින් නොවෙනස්ව යොදාගෙන ඇති අතර, එම ප්‍රතිපත්ති ඉකුත් වසරේ ප්‍රතිපත්තිවලට අනුරූපය. අවශ්‍ය විට ඉකුත් වසරේ අගයන් සහ පාඨ වර්තමාන වසරේ ඉදිරිපත් කිරීමට වර්ගීකරණයට ගැලපෙන පරිදි යළි සකසා ඇත.

1.2.1.7 විදේශීය මුදල් ගනුදෙනු

සියලු විදේශ විනිමය ගනුදෙනු, ගනුදෙනු කළ දිනයන්ට අදාළ විනිමය අනුපාතයෙන් වාර්තාකරණ මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කරනු ලැබේ.

විදේශ මුදලින් අගය දක්වා ඇති මුදල් වත්කම් සහ බැරකම් වසර අවසානයේ පවතින විදේශ විනිමය අනුපාතය භාවිතා කරමින් ශ්‍රී ලංකා රුපියල් වලින් සමාන මුදලට පරිවර්තනය කරනු ලබන අතර එහි ප්‍රතිඵල වශයෙන් සිදුවන ලාභ හෝ පාඩු විස්තීරණ ආදායම් ප්‍රකාශයෙහි ගිණුම්ගත කර ඇත.

මුදල්මය නොවන වත්කම් සහ බැරකම්, වටිනාකම් නිශ්චය කරන අවස්ථාවේ පැවති විනිමය අනුපාත යොදා ගනිමින් පරිවර්තනය කරනු ලැබේ. එහි ප්‍රතිඵලයක් ලෙස ඇතිවන ලාභ සහ අලාභ සඳහා හේතු අනෙකුත් විස්තීර්ණ ආදායමේ ගිණුම් ගත කොට ඇත.

1.2.1.8 ද්‍රව්‍යමය භාවය සහ සමූහනය

සමාන අයිතමයන්ගේ සෑම ද්‍රව්‍ය පංතියක්ම මූල්‍ය ප්‍රකාශවල වෙන් කර දක්වා ඇත. අසමාන ස්වභාවයක් ඇති හෝ කාර්ය භාරය අතින් අසමාන වන අයිතම, ද්‍රව්‍ය නොවන්නේ නම් වෙන වෙනම ඉදිරිපත් කර ඇත.

1.2.1.9 තීරණාත්මක ගිණුම්කරණ ඇස්තමේන්තු සහ විනිශ්චයන්

අ) විනිශ්චයන්

ගිණුම්කරණ ප්‍රතිපත්ති උපයෝගී කර ගැනීමේ ක්‍රියාදාමයේදී, මූල්‍ය ප්‍රකාශවල පිළිගත් ප්‍රමාණ කෙරෙහි වඩාත්ම වැදගත් බලපෑම් ඇතිකරන ඇස්තමේන්තු කිරීම් සම්බන්ධ ඒවා හැරුණු විට, කළමනාකාරිත්වය විනිශ්චයන් සිදු කොට ඇත.

ආ) ඇස්තමේන්තු සහ උපකල්පන

සමාගමේ මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී, වාර්තා කොට ඇති ආදායම්, වියදම්, වත්කම් සහ බැරකම් ප්‍රමාණ සහ වාර්තාකරණ දිනයට අසම්භාව්‍ය වගකීම් හෙළිදරව් කිරීම කෙරෙහි බලපාන්නා වූ විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන කළමනාකාරිත්වය සිදුකිරීම අවශ්‍ය වේ.

මීළඟ මුදල් වර්ෂය තුළ වත්කම් සහ බැරකම්වල ධාරණ අගයන්ට ප්‍රමාණාත්මක ගැලපුම් කිරීමට සිදුවන සැලකිය යුතු අවදානමක් සහිත, මූල්‍ය තත්වයේ දිනට ඇස්තමේන්තු අවිනිශ්චිතතාවේ අනාගතය සහ අනෙකුත් වැදගත් මූලාශ්‍රවලට අදාල වැදගත් උපකල්පන සැලකිල්ලට ලක් කර තිබේ.

1.3 වත්කම් සහ වත්කම් තක්සේරු කිරීමේ පදනම

1.3.1 දේපළ, පිරියත සහ උපකරණ

a) මිනුම

සියලු දේපළ පිරියත සහ උපකරණ, ආරම්භයේදී පිරිවැය අනුව සටහන් කරනු ලැබේ. අනතුරුව දේපළ, පිරියත සහ උපකරණ අයතමයන් ප්‍රත්‍යාගණනය කිරීමේදී එබඳු වත්කම් අයත්වන සම්පූර්ණ අයිතම පන්තිය ප්‍රත්‍යාගණනය කරනු ලැබේ.

එදිනෙදා සේවා පිරිවැය, අඩු සමුච්චිත ක්ෂයවීම් සහ වටිනාකමින් සමුච්චිත හානිය හැරුණු විට දේපල, පිරියත සහ උපකරණ පිරිවැය අනුව සඳහන් වේ. පිළිගැනීමට අවශ්‍ය නිර්ණායක සපුරා තිබේ නම් එම පිරිවැයට දේපළ, පිරියත සහ උපකරණවල කොටසක් ප්‍රතිස්ථාපනය කිරීමට සිදුවන අවස්ථාවේදී දරන්නට සිදුවන පිරිවැය ඇතුළත් වේ. දේපළ, පිරියත සහ උපකරණවල වැදගත් කොටස් කලින් කලට ප්‍රතිස්ථාපනය කිරීම අවශ්‍ය වන්නේ නම්, සමාගම එබඳු කොටස්, විශේෂිත ප්‍රයෝජ්‍ය ආයුකාලයක් සහිත තනි තනි වත්කම් සේ සලකා ඒ අනුව එම අයිතම ක්ෂය කරනු ඇත.

ප්‍රධාන පරීක්ෂණයක් සිදුකරනු ලබන විට, පිළිගැනීමේ නිර්ණායක සපුරා ඇත්නම්, එහි පිරිවැය දේපළ, පිරියත සහ උපකරණ ප්‍රතිස්ථාපනයක් ලෙස ධාරණ අගය තුළ පිළිගනු ලබනු ඇත. අනෙක් සියලු අළුත්වැඩියාවන් සහ නඩත්තු පිරිවැය, එම පිරිවැය දරනු ලැබූ අවස්ථාවේ ලාභ හෝ අලාභවල හඳුනාගනු ඇත.

දේපළ, පිරියත හෝ උපකරණ අයිතමයක් බැහැර කිරීම මත හෝ එය භාවිතයෙන් හෝ බැහැර කිරීමෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා නොකරන්නේ නම්, එම අයිතමය පිළිගැනීමක් නැති අයිතමයක් වනු ඇත. පිළිගැනීම බැහැර කිරීමෙන් ලැබෙන කිසියම් ලාභයක් හෝ පාඩුවක් (බැහැර කිරීමෙන් ලැබූ ආදායම සහ වත්කමෙහි ධාරණ අගය අතර වෙනස) වේ නම් එය වත්කම පිළිගැනීම අත්හිටවූ වර්ෂයේ විස්තීරණ ගිණුම් ප්‍රකාශයට ඇතුළත් කර ඇත.

b) දේපළ, පිරියත හා උපකරණවල ඵලදායී ආයුකාලය

සෑම වාර්තාකරණ දිනකටම වත්කමක ශේෂ අගය, ප්‍රයෝජනවත් ජීවිත කාලය සහ ක්ෂය කිරීමේ ක්‍රමවේද සමාගම විසින් සමාලෝචනය කරනු ලැබේ. මෙම අගයන්, අනුපාත සහ ක්‍රමවේද ඇස්තමේන්තු කිරීමේදී වෘත්තීය විශේෂඥයන්ගේ මතය අනුව කළමනාකාරිත්වය එළඹී විනිශ්චයන් ක්‍රියාවට නංවනු ලැබේ.

c) ක්ෂය වීම

දේපළ, පිරියත සහ උපකරණයක එක් එක් කොටසේ ඇස්තමේන්තුගත ඵලදායී ආයුකාලය පුරා සරල රේඛීය පදනම මත ලාභයේ හෝ පාඩුවේ ක්ෂයවීම හඳුනා ගනු ලබන අතර එසේ කරනුයේ වත්කමෙහි අන්තර්ගතවන අනාගත ආර්ථික ප්‍රතිලාභයන්හි පරිභෝජනය කිරීමේ අපේක්ෂිත රටාව, එම ක්‍රමය ඉතා සමීපව පිළිඹිබු කරන නිසාය.

මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ ලබාගෙන ඇති වත්කම් ක්ෂය කරනු ලබන්නේ කල්බදු කාල සීමාව හෝ එහි ප්‍රයෝජනවත් ජීවිත කාලය යන කාල දෙකින් අඩු කාලය මතය.

ඵලදායී ආයුකාලයන් පහත පරිදි වේ:

ගොඩනැගිලි	අවුරුදු 20 සිට 25 දක්වා
පිරියත සහ යන්ත්‍රෝපකරණ	අවුරුදු 04 සිට 30 දක්වා
ගෘහ භාන්ඩ සහ සවිකිරීම්	අවුරුදු 05
විද්‍යාගාර උපකරණ	අවුරුදු 05
මෝටර් වාහන	අවුරුදු 04
මෙවලම් සහ උපකරණ	අවුරුදු 05
කාර්යාල උපකරණ	අවුරුදු 05

බෝතල් හා ඇසුරුම් භාජන	අවුරුදු 04
පරිගණක	අවුරුදු 04
බෝතල් ශීතකරණ	අවුරුදු 04
මෘදුකාංග	අවුරුදු 03
කිරි භාජන	අවුරුදු 05

වත්කමක ක්ෂයවීම ආරම්භ වනුයේ එය ප්‍රයෝජනය සඳහා ගත හැකි අවස්ථාවේ සිට වන අතර ක්ෂයවීම නවතිනුයේ විකිණීම සඳහා යැයි වත්කම වර්ගීකරණය කළ දිනයේ හෝ වත්කම ඉවත් කරන දිනය යන දිනවලින් කලින් පැමිණෙන දිනයේය.

d) ප්‍රතිසාධන පිරිවැය

දේපළ, පිරියත සහ උපකරණ ඒවායේ කාර්ය සාධන ප්‍රමිතීන් ලෙස මුලින්ම අපේක්ෂිත ආර්ථික ප්‍රතිලාභ ප්‍රතිසාධනය කිරීම හෝ නඩත්තු කිරීම සඳහා කෙරෙන අලුත්වැඩියාවන් හෝ නඩත්තු කටයුතු සඳහා වැය වෙන වියදම.

e) ණය පිරිවැය

ඍජුවම, කිසියම් අපේක්ෂා කළ අරමුණ ඉටු කිරීම සඳහා හෝ විකිණීම සඳහා යම් කාලයක් ගන්නා සුදුසුකම් ඇති වත්කමක් අත්පත් කරගැනීම, ඉදිකිරීම හෝ නිෂ්පාදනයට සම්බන්ධ වන ණය ගැනීම් පිරිවැය අදාළ වත්කම්වල පිරිවැයේ කොටසක් ලෙස ප්‍රාග්ධනීකරණය කෙරේ. අනෙකුත් සියලු ණය ගැනීම් පිරිවැය ඒවා සිදුවෙන කාලය අනුව වැය සටහන් කර ඇත.

f) ශේෂ පත්‍රයෙන් ඉවත් කිරීම

දේපළ, පිරියත හෝ උපකරණ අයිතමයක් බැහැර කිරීම මත හෝ එය භාවිතයෙන් හෝ බැහැර කිරීමෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා නොකරන්නේ නම්, එම අයිතමය පිළිගැනීමක් නැති අයිතමයක් වනු ඇත. වත්කම පිළිගැනීම බැහැර කිරීමෙන් ලැබෙන කිසියම් ලාභයක් හෝ පාඩුවක් ගණනය කරනු ලබන්නේ බැහැර කිරීමෙන් ලැබූ ආදායම සහ වත්කමෙහි ධාරණ අගය අතර වෙනස ලෙසය.

1.3.2 අස්පෘශ්‍ය වත්කම්

වෙන වෙනම අත්පත් කර ගනු ලබන අස්පෘශ්‍ය වත්කම්, පිරිවැය අනුව මූලික පිළිගැනීම මත මනිනු ලැබේ. මූලික හඳුනාගැනීමෙන් පසුව, අස්පෘශ්‍ය වත්කම් පිරිවැය සමුච්චිත ක්‍රමක්ෂය හා සමුච්චිත හානිවීම් අලාභය අඩු කර ඉදිරියට ගෙන යනු ලැබේ.

සීමිත ආයුකාලයක් සහිත අස්පෘශ්‍ය වත්කම් ප්‍රයෝජනවත් ආර්ථික ආයුකාලය මත ක්‍රමක්ෂය කර ඇති අතර අස්පෘශ්‍ය වත්කම් දුර්වල විය හැකි බවට ඇඟවීමක් ඇති සෑම අවස්ථාවකදීම හානිය සඳහා තක්සේරු කරනු ලැබේ. සීමිත ඵලදායී ආයුකාලයක් සහිත අස්පෘශ්‍ය වත්කමක් සඳහා ක්‍රමක්ෂය කිරීමේ කාලය සහ ක්‍රමක්ෂය කිරීමේ ක්‍රමය අවම වශයෙන් සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේම සමාලෝචනය කෙරේ.

වත්කම් තුළ අන්තර්ගත වන අපේක්ෂිත ඵලදායී ආයුකාලයේ වෙනස්වීම් හෝ අපේක්ෂිත පරිභෝජන රටාව ගණනය කරනු ලබන්නේ ක්‍රමක්ෂය කිරීමේ කාල සීමාව හෝ ක්‍රමවේදය සුදුසු පරිදි වෙනස් කිරීමෙන් වන අතර ගිණුම්කරණ ඇස්තමේන්තු වල වෙනස්කම් ලෙස සලකනු ලැබේ. අස්පෘශ්‍ය වත්කම්වල ක්‍රමක්ෂය කිරීමේ වියදම අස්පෘශ්‍ය වත්කම්වල ක්‍රියාකාරිත්වයට අනුරූපව වියදම් කාණ්ඩයේ ලාභ හෝ අලාභ ප්‍රකාශය සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය මගින් හඳුනාගෙන ඇත.

1.3.3 SLFRS 16 යටතේ හඳුනාගත් භාවිත අයිතිය සහිත වත්කම්

a) භාවිත අයිතිය සහිත වත්කම්

අදාළ වන වත්කම භාවිතය සඳහා ලද හැකි වූ විට සමාගම භාවිත අයිතිය සහිත වත්කම් හඳුනාගනී. භාවිත අයිතිය සහිත වත්කම් පිරිවැයට මිනුම් කරනු ලබන අතර එයින් සමුච්චිත ක්ෂය වීම සහ අපහායන පාඩු අඩු කර බදු වගකීම්වල ප්‍රති මිනුම සඳහා ගලපනු ලැබේ. භාවිත අයිතිය සහිත වත්කම්වල පිරිවැයට ලැබුණු කල්බදු දිරිදීමනා අඩු කර පිළිගත් කල්බදු වගකීම් ප්‍රමාණය, ආරම්භක ඍජු පිරිවැය සහ ආරම්භක දිනට හෝ ඊට පෙර

සිදු කරන ලද කල්බදු ගෙවීම් ඇතුළත් වේ. කල්බදු කාල සීමාව අවසානයේ දී කල්බදු වත්කම්වල හිමිකාරිත්වය ලබා ගැනීමට සමූහයට සාධාරණ විශ්වාසයක් නොමැති නම්, පිළිගත් භාවිත අයිතිය සහිත වත්කම් එහි ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලය හෝ කල්බදු කාල සීමාව තුළ සරල රේඛා පදනමක් මත ක්ෂය කරනු ලැබේ. භාවිත අයිතිය සහිත වත්කම් අපහායනයට යටත් වේ.

මූල්‍ය කල්බද්දක් ප්‍රතිඵලය වන්නා වූ විකිණීම සහ බදු ගැනීමේ ගනුදෙනුවකට අදාල වත්කම්වල ධාරණ අගය මත කවර හෝ විකුනුම් ආදායම් අතිරික්තයක් බදු වාරය පුරා විලම්භිත කර ක්‍රමක්ෂය කරනු ලැබේ

b) කෙටි කාලීන කල් බදු සහ අඩු අගයන් සහිත වත්කම්

ආරම්භක දිනයේ සිට මාස 12ක් හෝ ඊට අඩු කල්බදු කාල සීමාවක් ඇති කල්බදු සඳහා සමූහය කෙටි කාලීන කල්බදු හඳුනාගැනීම නිදහස් කිරීම අදාළ කරයි. එය කෙටි කාලීන කල්බදු සඳහා අඩු වටිනාකමක් ඇති වත්කම් හඳුනාගැනීමේ කල්බදු ගෙවීමද යොදාගන්නා අතර අඩු වටිනාකමකින් යුත් වත්කම් බදු දීම, බදු කාලය තුළ සරල රේඛීය පදනමක් මත වියදම් ලෙස පිළිගනු ලැබේ.

1.3.4 මූල්‍ය නොවන වත්කම් අපහායනය

සෑම වාර්තාකරණ දිනයකදීම කිසියම් වත්කමක් අපහායනය වීමේ ඇඟවීමක් ඇත්දැයි නිශ්චිතව දැන ගැනීම සඳහා සමාගම විසින් ඇස්මේන්තු කරනු ලැබේ. එවැනි අපහායන ලක්ෂණ පවතින විට හෝ වත්කම් සඳහා වාර්ෂික අපහායන පරීක්ෂාවන් අවශ්‍ය විට සමාගම වත්කමෙහි නැවත අය කර ගත හැකි අගය ඇස්තමේන්තු කරනු ලැබේ. වත්කමක ආපසු අයකර ගත හැකි අගය යනු වෙනත් වත්කම් හෝ වත්කම් කාණ්ඩවලින් බෙහෙවින් පරිබාහිරව, එම වත්කම මුදල් ගලා ඒමක් සිදු නොකරන්නේ නම්. අදාළ වත්කමෙහි හෝ මුදල් ජනනය කරන ඒකකයෙහි, විකුණුමට වියදම් වන පිරිවැය සහ භාවිතයේ අගය අඩු කරන ලද සාධාරණ අගයයි. වත්කමක ධාරණ අගය එහි ආපසු අය කර ගත හැකි අගය ඉක්මවා යන විට වත්කම අපහායනය වී ඇති බව සලකන අතර එහි නැවත අය කර ගත හැකි අගය පහත හෙලනු ලැබේග භාවිතයේ පවතින වටිනාකම තක්සේරු කිරීමේදී මුදලේ කාල අගය හා වත්කමට විශේෂිත අවදානම්වල වර්තමාන වෙළඳපොල තක්සේරු නිරූපනය වන අයුරින් බදු පෙර වට්ටම් අනුපාත භාවිතා කොට ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහ වර්තමාන අගය තෙක් වට්ටම් කරනු ලැබේ.

අඛණ්ඩ මෙහෙයුම්වල අපහායන පාඩු, විස්තිරණ ආදායම් ප්‍රකාශයේ හානි වූ වත්කමේ කර්තව්‍ය හා සංගත වියදම් කාණ්ඩවල හඳුනාගනු ලැබේ.

කීර්තිනාමය හැර වත්කම් සම්බන්ධයෙන් සෑම වාර්තාකරණ දිනයකටම ඇගයීමක් සිදු කරන අතර ඒ තුලින් පෙර හඳුනාගත් අපහායන අලාභ තවදුරටත් නොපවතින බවට හා ඒවා අඩුවී ඇති බවට යම් නිරීක්ෂණ කර ඇත්දැයි විමසා බලයි. මණ්ඩලය විසින් වත්කමේ එවැනි නිරීක්ෂණයක් ඇත්නම් ආපසු එය අයකර ගත හැකි අගය ඇස්තමේන්තු කරයි.

කළින් හඳුනාගත් අපහායන අලාභයක් ප්‍රතිවර්ත කරනුයේ අවසන් අපහායන අලාභය හඳුනාගනු ලැබූ අවස්ථාවේ සිට වත්කමේ ආපසු අයකරගත හැකි අගය නිර්ණය කිරීම සඳහා භාවිතාකළ ඇස්තමේන්තුවල වෙනසක් සිදුව ඇත්නම් පමණි. එසේ සිදුව ඇති විටදී, වත්කමේ ධාරණ අගය එහි ආපසු අයකරගත හැකි අගය දක්වා ඉහළ නංවනු ලැබේ. ඉහළ නංවනු ලැබූ අගය, පෙර වසරවලදී වත්කම සඳහා අපහායන අලාභයක් හඳුනාගෙන නොමැති නම්, ක්ෂයවීම අඩුකොට නිර්ණය කරනු ලැබීමට ඉඩ තිබූ ධාරණ අගය "ඉක්මවා යාමට" නොහැක. එබඳු ප්‍රත්‍යාවර්තනයක් විස්තිරණ ආදායම් ප්‍රකාශයේ හඳුනාගනු ලැබේ.

1.3.5 නොනිමි ප්‍රාග්ධන වැඩ

වත්කම ප්‍රථම වරට උපයෝජනයට යොදවන විට, දැනට ඉටුවන ප්‍රාග්ධන වැඩ අදාළ වත්කම් ගිණුමට මාරු කරනු ලැබේ.

1.3.6 මූල්‍ය වත්කම්

පහත සඳහන් කාණ්ඩවලට සමාගම තම වත්කම් වර්ග කරනු ලබයි; ඒවා නම් ලාභය හා අලාභය මගින් සාධාරණ අගයක් ඇති මූල්‍ය වත්කම්, ණය සහ ලැබිය යුතු දෑ, විකිණීමට ඇති සහ කල්පිරීම දක්වා රඳවාගත් මූල්‍ය වත්කම් වේ. මූල්‍ය වත්කම් අත්කර ගනු ලැබූ කාර්යය මත වර්ගීකරණය රඳා පවතී. මූලික පිළිගැනීම මත සිය මූල්‍ය වත්කම්වල

වර්ගීකරණය කළමනාකාරිත්වය තීරණය කරන අතර, මෙම වර්ග නාමය සෑම වාර්තාකරණ දිනකදීම නැවැත ඇගයීමට පාත්‍ර කරයි.

1.3.6.1 මූලික හඳුනා ගැනීම සහ මැනීම

මූලික හඳුනාගැනීමේදී සංස්ථාව සිය මූල්‍ය වගකීම් වර්ගීකරණය තීරණය කරයි. මූල්‍ය වත්කම් මූලික වශයෙන් සාධාරණ අගයට හඳුනාගනු ලබන අතර, ලාභ හෝ පාඩු තුළින් සාධාරණ අගයක නොමැති වත්කම් ඇති විට එය ගනුදෙනු පිරිවැයට සෘජුවම සම්බන්ධ කෙරේ.

වෙළඳපොළ සම්ප්‍රදාය සහ නියෝග මගින් නියමිත කාලරාමුවක් තුළ භාරදිය යුතු මූල්‍ය වත්කම් මිලට ගෙන හෝ විකුණා ඇත්නම් ඒවා විකිණීම හෝ මිලට ගැනීම සිදුවූ දිනයේදී හඳුනාගනු ඇත. එනම් වත්කම මිලට ගැනීමට හෝ විකිණීමට සමාගම එකඟ වූ දිනයයි.

මුදල්, ස්ථිර තැන්පතු සහ වෙළඳාමෙහි සහ වෙනත් ලැබිය යුතු දේවල ආයෝජන සමාගමේ මූල්‍ය වත්කම්වලට අයත් වේ.

1.3.6.2 පසු ගණන මිනුම්කරණය

මූල්‍ය වත්කම් පසුකාලීනව මැනීම පහත පරිදි වර්ගීකරණය මත රඳා පවතී.

(a) ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයක් ඇති මූල්‍ය වත්කම්

ලාභය හෝ අලාභය හරහා සාධාරණ වටිනාකමට නම් කරන ලද මූල්‍ය වත්කම් සහ වෙළඳාම සඳහා තබා ඇති මූල්‍ය වත්කම්, ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගය සහිත මූල්‍ය වත්කම්වලට ඇතුළත් වේ. මූල්‍ය වත්කම් නුදුරු කාලීනව විකිණීම හෝ නැවත මිලදී ගැනීම සඳහා අත්පත් කර ගනු ලැබුවහොත් ඒවා වෙළඳාම් සඳහා රඳවා ඇති බව වර්ගීකරණය කරනු ලැබේ.

(b) ණය සහ ලැබීම්

ණය සහ ලැබීම් යනු ව්‍යුත්පන්න නොවන සහ සක්‍රිය වෙළෙඳපොළ තුළ දක්වා නොමැති ස්ථිර හෝ තීරණය කළ හැකි ගෙවීම් වේ. මූලික මැනීමෙන් පසුව එවැනි මූල්‍ය වත්කම්, ඵලදායී පොළී අනුපාත ක්‍රමය භාවිතා කර ක්‍රමක්ෂය පිරිවැය මගින් මනිනු ලැබේ. ක්‍රමක්ෂය පිරිවැය ගණනය කෙරෙන්නේ EIR හි අනන්‍ය කොටසක් වන ගාස්තු හෝ පිරිවැය සහ අත්පත්කරගැනීමේ වට්ටම් හෝ ආධික්‍යය සැලකිල්ලට ගෙනය. EIR ක්‍රමක්ෂය, ආදායම් ප්‍රකාශයේ මූල්‍ය පිරිවැය තුළ අන්තර්ගත වී ඇත.

(c) කල්පිරීම දක්වා රඳවාගත් ආයෝජන

ස්ථිර හෝ තීරණය කළ හැකි ගෙවීමක් සහ ස්ථිර කල්පිරීමක් ඇති මූල්‍ය වත්කම්, කල්පිරීම දක්වා රඳවාගත් ගනයට අයත් වන අතර එය කෙරෙන්නේ එම වත්කම් කල් පිරීම දක්වා රඳවා තබාගැනීමට සමාගමට හැකියාව සහ ධනාත්මක අදහස ඇති විටය. මූලික ගණනය කිරීමෙන් පසුව කල්පිරීම දක්වා රඳවා ගනු ලැබූ ආයෝජන හානි අඩු කොට සළුල පොලී ක්‍රමවේදය භාවිතා කරමින් තදනන්තරව ක්‍රමක්ෂිත පිරිවැය අනුව ගණනය කරනු ලැබේ. ක්‍රමක්ෂය පිරිවැය ගණනය කෙරෙන්නේ EIR හි අනන්‍ය කොටසක් වන ගාස්තු හෝ පිරිවැය සහ අත්පත්කරගැනීමේ වට්ටම් හෝ ආධික්‍යය සැලකිල්ලට ගෙනය. EIR ක්‍රමක්ෂය, ආදායම් ප්‍රකාශයේ මූල්‍ය පිරිවැය තුළ අන්තර්ගත වී ඇත. හානිය නිසා ඇති වන පාඩු මූල්‍ය පිරිවැයේ විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ හඳුනාගෙන ඇත.

(d) විකිණීම සඳහා ඇති මූල්‍ය ආයෝජන

විකිණීමට ඇති මූල්‍ය ආයෝජනවලට ස්කන්ධ සහ ණය සුරකුම් ඇතුළත් වේ. විකිණීම සඳහා ලබා ගත හැකි ලෙස වර්ගීකරණය කර ඇති ස්කන්ධ ආයෝජන යනු ඒවා වෙළඳාම සඳහා තබා ඇති ලෙස වර්ගීකරණය කර නොමැති, ලාභය හෝ අලාභය තුළින් සාධාරණ වටිනාකමකින් නම් කර නොමැති ඒවා වෙයි. මෙම කාණ්ඩයේ ණය සුරකුම්පත් යනු අවිනිශ්චිත කාලයක් සඳහා පැවැත්වීමට අදහස් කරන ඒවා වන අතර ද්‍රවශීලතාවයේ අවශ්‍යතාවයන්ට ප්‍රතිචාර වශයෙන් හෝ වෙළඳපල තත්වයන්හි වෙනස්වීම් වලට ප්‍රතිචාර වශයෙන් විකුණනු ලබන ඒවා වෙයි.

මූලික මිනුම්කරණයෙන් පසු. විකිණීම සඳහා ඇති මූල්‍ය ආයෝජන තදනන්තරව සාධාරණ අගයට මනිනු ලැබේ.

උපලබ්ධි නොවූ ලාභ හෝ අලාභ, විකිණීම සඳහා පවතින ස්කන්ධ (වෙනත් විස්තීරණ ආදායම) යටතේ හඳුනා ගැනේ. ආයෝජනය බැහැර කරනු ලැබීමේදී, ස්කන්ධ යටතේ ඊට අදාළව පෙර හඳුනාගත් ලාභ හෝ අලාභ ආදායම් ප්‍රකාශයේදී 'වෙනත් මෙහෙයුම් ආදායම' යටතේ හඳුනා ගනී. සමාගම විසින් සමාන සුරැකුම්වලින් එක් ආයොජනයකට වඩා දරණ අවස්ථාවන්හිදී, ප්‍රථමයෙන් ලැබ ප්‍රථමයෙන් නිකුත් කරන පදනම යටතේ විකිණීමට නියමිතය. විකිණීම සඳහා පවතින මූල්‍ය ආයෝජන මගින් උපයනු ලබන පොළී ආදායම, සඵල පොළී අනුපාතය මත ගණනය කර පොලී ආදායම යටතේ ප්‍රකාශ කරනු ලැබේ. ලාභාංශ ලැබීමේ අයිතිය තහවුරු වූ පසු ආදායම් ප්‍රකාශයේ 'වෙනත් මෙහෙයුම් ආදායම' යටතේ හඳුනාගනී. එවැනි ආයෝජන අපහායනය මත වන අලාභ විස්තීරණ ආදායම් ප්‍රකාශයේ 'මූල්‍ය ආයෝජන මත අපහායන අලාභවල' හඳුනාගන්නා අතර විකිණීම සඳහ පවතින සංචිතයෙන් ඉවත් කරනු ලැබේ.

(ඇ) විකිණීම සඳහා ඇති මූල්‍ය ආයෝජන

විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම් කෙටි කාලිනව විකිණීමට ඇති හැකියාව සහ අභිලාෂය තවදුරටත් යෝග්‍ය ද යන්න විමසීම පිණිස සමාගම විකිණීමට ඇති සිය මූල්‍ය වත්කම්වල ඇගයීමක් සිදු කරයි. අක්‍රීය වෙළඳපොළ නිසා මෙම මූල්‍ය වත්කම් විකිණීමට සමාගමට නොහැකි වන කළ සහ විකිණීමට කළමනාකාරිත්වයෙහි අභිප්‍රාය පූර්වෙක්ෂිත අනාගතය තුළ වෙනස් වන කළ, දුර්ලභ අවස්ථානුගත තත්වයන් තුළ සමාගම මෙම මූල්‍ය වත්කම් නැවැත වර්ගීකරණය කිරීමට ඉඩ ඇත. මූල්‍ය වත්කම් ණය සහ ලැබිය යුතු දේවල නිර්වචනයට යෝග්‍ය වන කළ සහ කල්පිරීම දක්වා මෙම වත්කම් පූර්වෙක්ෂිත අනාගතය තුළ තබා ගැනීමට අභිලාශය සහ හැකියාව සමාගමට ඇති කල, ණය සහ ලැබිය යුතු දෑ හැටියට නැවත වර්ග කිරීම, සමාගමට එම වත්කම එලෙස තබා ගැනීමට අභිලාශය සහ හැකියාව ඇත්නම් පමණක් සිදු කළ හැක කල් පිරෙන තෙක් රඳවා ගත් කාණ්ඩයට නැවත වර්ගීකරණය කිරීමට අවසර දී ඇත්තේ ඒ අනුව මූල්‍ය වත්කම් රඳවා ගැනීමේ හැකියාව සහ අභිප්‍රාය ආයතනයට ඇති විට පමණි.

විකිණීම සඳහා ප්‍රතිවර්ගීකරණයට භාජන කිරීමෙන් පසු පවතින මූල්‍ය වත්කමක් සඳහා, ස්කන්ධවල හඳුනාගත් එම වත්කමට පෙරාතුව ලැබුණ පාඩුවක් හෝ ලාභයක් වේ නම්, එය සඵල පොළී අනුපාතය භාවිතා කොට ආයොජනයේ ඉතිරි ආයු කාලය සඳහා ක්‍රමක්ෂය කරනු ලැබේ. නව ක්‍රමක්ෂය පිරිවැය සහ අපේක්ෂිත මුදල් ප්‍රවාහය අතර වෙනස ද, වත්කමෙහි ඉතිරි ආයු කාලය සඳහා සඵල පොළී අනුපාතය උපයෝගී කොට ගෙන ක්‍රමක්ෂය කරනු ලැබේ. අනතුරුව වත්කම අපහරණය වූ බව නිර්ණය වේ නම්, ස්කන්ධවල වාර්තා වූ ප්‍රමාණය ප්‍රතිවර්ගීකරණය කොට විස්තරාත්මක ආදායම් ප්‍රකාශයට ඇතුළත් කරනු ලැබේ.

1.3.6.3 ශේෂ පත්‍රයෙන් ඉවත් කිරීම

මූල්‍ය වත්කමක් (හෝ, මූල්‍ය වත්කමක කොටසක් හෝ සමාන මූල්‍ය වත්කම් සමූහයක කොටසක් අදාළ වන විට) ශේෂ පත්‍රයෙන් ඉවත් කෙරෙන්නේ,

(a) වත්කමෙන් මුදල් ප්‍රවාහ ලැබීමේ අයිතිය කල් ඉකුත් වී ඇති විට

(b) සංස්ථාව වත්කම් වලින් මුදල් ප්‍රවාහ ලබා ගැනීමේ අයිතිය පවරා ඇති විට හෝ ලැබුණු මුදල් ප්‍රවාහයන් ද්‍රව්‍යාමය ප්‍රමාදයකින් තොරව තෙවන පාර්ශවයකට 'මිල වැඩි කිරීමෙන් වැඩි වූ පිරිවැය හිලව් කිරීමේ' විධිවිධානයක් යටතේ ගෙවීමට බැඳී සිටින විට; එක්කෝ

වත්කමෙහි සියලු අවදානම් ප්‍රතිඵල සහ ප්‍රදානයන් සමාගම විසින් මාරුකර තිබී හෝ වත්කමෙහි සියලු අවදානම් සහ පරිදාන සමාගම පවරා ඇති විට හෝ වත්කමේ සියලු අවදානම් සහ ප්‍රතිලාභ සමාගම සාරාතුකූලව පවරා හෝ රඳවා ගෙන නොමැති විට යි.

වත්කමකින් මුදල් ප්‍රවාහ ලබා ගැනීමේ අයිතිය සමාගම පවරා හෝ 'හරහා ගමන් කිරීමේ' වැඩපිළිවෙලකට එළඹ ඇති විටදී සහ වත්කමේ සියලු අවදානම් සහ පරිදාන සාරාතුකූලව පවරා හෝ රඳවා ගෙන හෝ එහි පාලනය පවරා නොමැති විටදී, සමාගම වත්කමේ අඛණ්ඩව සම්බන්ධව සිටින ප්‍රමාණයට වත්කම පිළිගනු ලැබේ.

එහිදී සමාගම ආශ්‍රිත වගකීමක් ලෙස හඳුනාගනු ලැබේ. සමාගම රඳවා ගෙන සිටින අයිතිවාසිකම් සහ බැඳීම් නිරූපණය වන පදනමකින් පැවැරූ වත්කම සහ සහ ආශ්‍රිත වගකීම මණිනු ලැබේ.

පවරන ලද වත්කම පිළිබඳව ඇපයක ස්වරූපය ගන්නා අඛණ්ඩ සම්බන්ධය, වත්කමේ මුල් ධාරණ වටිනාකමෙන් සහ සමාගම ආපසු ගෙවීමට අවශ්‍ය විය හැකි ප්‍රතිශ්ඨාවේ උපරිම ප්‍රමාණයෙන් වඩා අඩු දෙයට මණිනු ලැබේ.

1.3.6.4 මූල්‍ය වත්කම් අපහායනය

මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් දුර්වල වී ඇති බවට වෛෂයික සාක්ෂි තිබේද යන්න සමාගම සෑම වාර්තාකරණ දිනයකදීම තක්සේරු කරයි. මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් හානිවී, හානි අලාභ දැරීමට සිදුවනුයේ වත්කම් ආරම්භක පිළිගැනීමෙන් පසුව සිදුවන තනි හෝ බොහෝ සිද්ධීන්හි (අපහායන සිද්ධියක්) ප්‍රතිඵලයක් ලෙස හානියක් සිදුව ඇති බවට වාස්තවික සාක්ෂි ඇත්නම් සහ එම හානි සිද්ධිය හෝ සිද්ධි මූල්‍ය වත්කමෙහි හෝ මූල්‍ය වත්කම් සමූහයෙහි ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන්ට විශ්වාසනීය ලෙස මැනිය හැකි බලපෑමක් ඇති කරන්නේ නම් පමණි. හානිය පිළිබඳ සාක්ෂි අතරට, ණය ගැතියන් හෝ ණය ගැතියන් කණ්ඩායමක් සැලකිය යුතු මූල්‍ය දුෂ්කරතා, පොලී හෝ මූලික ගෙවීම් පැහැර හැරීම, ඔවුන් බංකොලොත් භාවයට හෝ වෙනත් මූල්‍ය ප්‍රතිසංවිධානයකට ඇතුළු වීමේ සම්භාවිතාව සහ මැනිය හැකි දත්ත ඇති බව යනාදී පෙන්නුම් කිරීම් ඇතුළත් වන අතර හිඟ වෙනස්වීම් හෝ පැහැර හැරීම් සමඟ සහසම්බන්ධ වන ආර්ථික තත්වයන් වැනි ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන්හි මැනිය හැකි අඩුවීමක් නිරීක්ෂණය කළ හැකි දත්ත වලින් පෙන්නුම් කෙරේ.

ක්‍රමක්ෂය පිරිවැයට ගෙන ආ මූල්‍ය වත්කම්

ක්‍රමක්ෂය පිරිවැය යටතේ සිදුකරන මූල්‍ය වත්කම් සඳහා, සමාගම මුලින් තක්සේරු කරන්නේ, හානිය පිළිබඳ වෛෂයික සාක්ෂි තනි තනිව වැදගත් වන මූල්‍ය වත්කම් සඳහා හෝ සාමූහිකව තනි තනිව වැදගත් නොවන මූල්‍ය වත්කම් සඳහා තිබේද යන්නයි. සැලකිය යුතු වුවත් නැතත්, තනි තනිව තක්සේරු කරන ලද මූල්‍ය වත්කමක් සඳහා හානිය පිළිබඳ වෛෂයික සාක්ෂි නොමැති බව සමාගම තීරණය කරන්නේ නම්, එයට සමාන ණය අවදානම් ලක්ෂණ සහිත මූල්‍ය වත්කම් සමූහයක වත්කම ඇතුළත් වන අතර ඒවා හානිය සඳහා සාමූහිකව තක්සේරු කරයි. හානිය සඳහා තනි තනිව තක්සේරු කර ඇති සහ හානියක් නැතිවීම හෝ අඛණ්ඩව හඳුනාගෙන ඇති වත්කම්, හානිය පිළිබඳ සාමූහික තක්සේරුවකට ඇතුළත් නොවේ.

හානියක් සිදුවී ඇති බවට වෛෂයික සාක්ෂි තිබේ නම්, අලාභයේ ප්‍රමාණය මනිනු ලබන්නේ වත්කම් ධාරක අගය සහ ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන්ගේ වර්තමාන වටිනාකම අතර වෙනස ලෙස ය (දැනට සිදුව නොමැති අනාගතයේදී අපේක්ෂිත ණය පාඩු හැර). ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන්ගේ වර්තමාන වටිනාකම මූල්‍ය වත්කම්වල මුල් ඵලදායී පොළී අනුපාතයට වට්ටම් කරනු ලැබේ. යම් ණයක විචල්‍ය ණය අනුපාතයක් තිබෙනම්, කිසියම් හානි අලාභ මැණිම සඳහා වට්ටම් අනුපාතය වනුයේ ගිවිසුම යටතේ නිශ්චය කර ඇති වත්මනෙහි ක්‍රියාත්මක පොළී අනුපාතයයි.

වත්කමේ ධාරණ අගය දීමනා ගිණුමක් භාවිතා කිරීම මගින් අඩුකරනු ලබන අතර අලාභයේ ප්‍රමාණය විස්තීරණ ආදායම් ප්‍රකාශයේ පිළිගනු ලැබේ. අඩු කරන ලද ධාරණ අගය මත අඛණ්ඩව පොළී උපචිත වන අතර අපහායන අලාභය මැණීමේ කාර්යය සඳහා අනාගත මුදල් ප්‍රවාහ වට්ටම් කිරීමට යොදා ගනු ලැබූ පොළී අනුපාතය භාවිතා කරමින් උපචය කරනු ලැබේ පොළී ආදායම විස්තීරණ ආදායම් ප්‍රකාශයෙහි මූල්‍ය ආදායමේ කොටසක් ලෙස වාර්තා කරනු ලැබේ. අනාගතයේදී ආපසු අයකර ගැනීමේ යථාර්තවාදී බලාපොරොත්තුවක් නොමැති විට සහ සියලු ඇප උපලබ්ධි වී ඇති විට හෝ සමාගමට පවරනු ලැබ ඇති විට ණය සහ ආශ්‍රිත දීමනා ලියා හරිනු ලැබේ. පසු වර්ෂයකදී, අපහායනය හඳුනා ගැනීමෙන් පසුව සිදුවන සිදුවීමක් නිසා ඇස්තමේන්තුගත අපහායන අලාභයේ ප්‍රමාණය වැඩිවුවහොත් හෝ අඩුවුවහොත්, දීමනා ගිණුම ගැලපීම මගින් කළින් පිළිගත් අපහායන අලාභය වැඩිකරනු හෝ අඩුකරනු ලැබේ. අනාගත කපා හැරීමක් පසුව අයකර ගනු ලැබුවහොත්, එම අයකර ගැනීම විස්තීරණ ආදායම් ප්‍රකාශයේ මූල්‍ය පිරිවැයට බැර කරනු ලැබේ.

අලෙවිය සඳහා ඇති මූල්‍ය වත්කම්

විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම් සඳහා, ආයෝජනයක් හෝ ආයෝජන කාණ්ඩයක් හානිවී ඇත්දැයි යන්න පිළිබඳව වාස්තවික සාක්ෂි තිබේදැයි ස්ථිරව දැන ගැනීම සඳහා එක් එක් වාර්තාකරණ දිනයේදී සමාගම ඇගයීමක් සිදු කරයි. ආයෝජනයේ සාධාරණ වටිනාකම එහි පිරිවැයට අඩුවෙන් සැලකිය යුතු ලෙස හෝ දීර්ඝ කාලීනව අඩුවීම විකිණීම සඳහා ඇති ස්කන්ධ ආයොජන සම්බන්ධයෙන් වාස්තවික සාක්ෂියක් වේ. 'සැලකිය යුතු' යන්න ආයෝජනයේ මුල් පිරිවැයට සාපේක්ෂව අගයනු ලබන අතර, 'දීර්ඝ කාලීනව' යන්න සාධාරණ වටිනාකම එහි මුල් පිරිවැයට පහළින් තිබූ කාලයට සාපේක්ෂව අගයනු ලැබේ. හානිවීම පිළිබඳ සාක්ෂි ඇති විටදී, විස්තීරණ ආදායම් ප්‍රකාශයේ කළින් හඳුනාගත් එම ආයෝජනයේ යම් අපහායන අලාභ අඩුකොට, අත්කර ගැනීමේ පිරිවැය සහ වත්මන් සාධාරණ වටිනාකම ලෙස මණිනු ලැබූ සමුච්චිත පිරිවැය, අනෙකුත් විස්තීරණ ආදායමෙන් ඉවත් කරනු ලබන අතර විස්තීරණ ආදායම් ප්‍රකාශයේ පිළිගනු ලබයි. විස්තීරණ ආදායම් ප්‍රකාශය තුළින් කොටස් ආයෝජන සඳහා වන අලාභ පාඩු ආපසු හරවනු නොලැබේ; අපහායනවලින් පසු ඒවායේ සාධාරණ අගය ඉහළ යාම් වෙනත් විස්තීරණ අදායම් තුළ සෘජුව හඳුනාගැනේ.

විකිණීම සඳහා ඇති ලෙස වර්ගීකරණය කොට ඇති ණය සාධනපත්‍ර ගත් විට, ක්‍රමක්ෂිත පිරිවැයට දක්වනු ලැබූ මූල්‍ය වත්කම් සඳහා යොදාගනු ලැබූ නිර්ණායකම මත පදනම්ව හානි අගයනු ලැබේ. කෙසේවෙතත්, අපහායනය සඳහා වාර්තා කරනු ලැබූ ප්‍රමාණය යනු විස්තීරණ ආදායම් ප්‍රකාශයේ කළින් හඳුනාගනු ලැබූ එම ආයෝජනයේ කිසියම් අපහායන අලාභයක් අඩු කොට ක්‍රමක්ෂිත පිරිවැය සහ වත්මන් සාධාරණ අගය අතර වෙනස ලෙස මණිනු ලැබේ.

අපහායන අලාභය මැනීමේ කාර්යය සඳහා අනාගත මුදල් ප්‍රවාහ වට්ටම් කිරීමට යොදාගනු ලැබූ පොළී අනුපාතය භාවිතා කරමින් වත්කමේ අඩුකරන ලැබූ ධාරණ වටිනාකම මත පදනම්ව, අනාගත පොළී ආදායම අඛණ්ඩව උපචිත වනු ඇත. පොළී ආදායම මූල්‍ය ආදායමේ කොටසක් ලෙස සටහන් කරනු ලැබේ. පසුකාලීන වර්ෂයකදී, ණය සාධන පත්‍රයක සාධාරණ වටිනාකම වැඩිවුවහොත් සහ එම වැඩිවීම විස්තීරණ ආදායම් ප්‍රකාශයේ අපහායන අලාභය හඳුනාගැනීමෙන් පසුව සිදුවන සිදුවීමකට වාස්තවිකව සම්බන්ධයක් ඇත්තේ නම්, විස්තීරණ ආදායම් ප්‍රකාශය හරහා අපහායන අලාභය ප්‍රතිවර්තනය කරනු ලැබේ.

1.3.7 මූල්‍ය වගකීම්

සමාගම සිය මූල්‍ය වගකීම්, උචිත පරිදි, ලාභ හෝ අලාභ හරහා සාධාරණ අගයට දැක්වෙන මූල්‍ය වගකීම් ලෙස හෝ අනෙකුත් මූල්‍ය වගකීම් ලෙස වර්ගීකරණය කරනු ලැබේ. වාර්තාකරණ දිනයට, ලාභ හෝ අලාභ හරහා සාධාරණ අගයට දැක්වෙන මූල්‍ය වගකීම් නොතිබුණි.

1.3.7.1 මූලික හඳුනා ගැනීම සහ මැනීම

සියලු මූල්‍ය වගකීම් ආරම්භයේදී සාධාරණ අගයට පිළිගනු ලැබේ. සෘජුවම ආරෝපණය කළ හැකි ගනුදෙනු පිරිවැය මෙයට ඇතුළත් වේ. සමාගමේ මූල්‍ය වගකීම්වලට ණය සහ ණය ගැනුම්, වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු මුදල් සහ බැංකු අයිරා අයත් වේ.

1.3.7.2 පසු ගණන මිනුම්කරණය

මූල්‍ය වගකීම මැනීම පහත පරිදි වර්ගීකරණය මත රඳා පවතී.

(a) ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයක් ඇති මූල්‍ය වගකීම්

ලාභය හෝ අලාභය හරහා සාධාරණ වටිනාකමට නම් කරන ලද මූල්‍ය වගකීම් සහ වෙළඳාම සඳහා තබා ඇති මූල්‍ය වගකීම්, ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගය සහිත මූල්‍ය වගකීම්වලට ඇතුළත් වේ. නුදුරු අනාගතයේදී විකිණීම සඳහා අත්පත් කරගත් මූල්‍ය වගකීම් විකිණීමට තබාගත් මූල්‍ය වගකීම් ලෙස වර්ගීකරණය කරනු ලැබේ.

(b) වෙනත් මූල්‍ය වගකීම්

මූලික පිළිගැනීමෙන් පසුව, අනෙකුත් මූල්‍ය වගකීම් සඵල පොළී අනුපාත ක්‍රමවේදය භාවිතා කරමින් ක්‍රමක්ෂිත පිරිවැයට පසුකාලීනව මනිනු ලැබේ. වගකීම් පිළිගැනීම බැහැර කළ විට මෙන්ම සඵල පොළී අනුපාත ක්‍රමවේද ක්‍රමක්ෂය ක්‍රියාදාමය හරහා ද විස්තීරණ ආදායම් ප්‍රකාශයේ ලාභ සහ අලාභ පිළිගනු ලැබේ. ක්‍රමක්ෂය පිරිවැය

ගණනය කෙරෙන්නේ EIR හි අනන්‍ය කොටසක් වන ගාස්තු හෝ පිරිවැය සහ අත්පත්කරගැනීමේ වට්ටම් හෝ ආධික්‍යය සැලකිල්ලට ගෙනය. EIR ක්‍රමක්ෂය විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ මූල්‍ය පිරිවැය තුළ අන්තර්ගත වී ඇත.

1.3.7.3 ශේෂ පත්‍රයෙන් ඉවත් කිරීම

වගකීම යටතේ වූ බැඳීම ඉටුකළ විට හෝ අවලංගු කළ විට හෝ කල් ඉකුත්වූ විට මූල්‍ය වගකීමේ ශේෂ පත්‍රයෙන් ඉවත් කරනු ලැබේ. පවතින මූල්‍ය වගකීමක්, සාරානුකූලව වෙනස් කොන්දේසි යටතේ එම ණය දෙන්නාගේම වෙනත් මූල්‍ය වගකීමකින් ප්‍රතිස්ථාපනය කරනු ලබන විට හෝ පවතින මූල්‍ය වගකීමක් ක්‍රමානුකූලව වෙනස් කරනු ලබන විට, එවැනි හුවමාරු කිරීමක් හෝ වෙනස් කිරීමක් මුල් වගකීම ඉවත් කිරීමක් හා නව වගකීම පිළිගැනීමක් සේ සලකනු ලබන අතර ධාරණ වටිනාකම්වල අදාළ වෙනස විස්තීරණ ආදායම් ප්‍රකාශයේ පිළිගනු ලැබේ.

1.3.7.4 මූල්‍ය සාධනපත්‍ර හිලව් කිරීම

මූල්‍ය වත්කම් සහ මූල්‍ය බැරකම් හිලව් කෙරෙන්නේ සහ මූල්‍ය තත්ව ප්‍රකාශයේ ශුද්ධ අගයන් වාර්තා කෙරෙන්නේ හදුනාගත් මුදල හිලව් කිරීමට නෛතිකව බලාත්මක අයිතියක් ඇති විට පමණක් වන අතර ශුද්ධ පදනමින් නිරවුල් කිරීමට හෝ වත්කම් හදුනාගෙන බැරකම් ඒ සමගම නිරවුල් කිරීමට අපේක්ෂා කෙරේ.

1.3.8 තොග

යල්පිනු සහ සෙමින් විකිණෙන අයිතම සඳහා නිසි වාසි ලබාදීමෙන් අනතුරුව, පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි අගයෙන් වඩා අඩු අගයට තොග මනිනු ලැබේ. ශුද්ධ උපලබ්ධි අගය යනු සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවලදී සම්පූර්ණ කිරීමේ ඇස්තමේන්තුගත පිරිවැය සහ විකිණීම සිදුකිරීමට අවශ්‍ය ඇස්තමේන්තුගත පිරිවැය අඩු කොට තොග විකිණිය හැකි මිලය.

තොග ඒවා වත්මනෙහි තිබෙන ස්ථානයට සහ තත්ත්වයට ගෙන ඒම සඳහා දරන ලද පිරිවැය පහත දැක්වෙන සූත්‍රය භාවිතා කරමින් ගිණුම්ගත කරනු ලැබේ.

අමු ද්‍රව්‍ය	-	බර තැබූ සාමාන්‍ය පදනම මත නිර්ණය කළ පිරිවැයට
නිමි භාණ්ඩ	-	සෘජු ද්‍රව්‍ය, සෘජු ශ්‍රම පිරිවැයට සහ සාමාන්‍ය මෙහෙයුම් ධාරිතාවයේ ස්ථාවර නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය මත තීරණය කළ උචිත සමානුපාතයකට
නොනිමි වැඩ	-	යෙදවුම් ද්‍රව්‍යවල පිරිවැයට
ඇසුරුම් ද්‍රව්‍ය	-	බර තැබූ සාමාන්‍ය පදනම මත නිර්ණය කළ පිරිවැයට
වෙනත් තොග	-	බර තැබූ සාමාන්‍ය පදනම මත නිර්ණය කළ පිරිවැයට
මාර්ගස්ථ භාණ්ඩ	-	සත්‍ය පිරිවැයට

1.3.9 වෙළෙඳ සහ වෙනත් ලැබිය යුතු දෑ

වෙළෙඳ ලැබිය යුතු දෑ ආරම්භයේදී සාධාරණ අගයට පිළිගනු ලබන අතර ඉන්පසුව ඒවා හානිවීම සඳහා වන ප්‍රතිපාදන අඩු කිරීමෙන් පසු සඵල පොළී ක්‍රමවේදය භාවිතා කරමින් ක්‍රමක්ෂිත පිරිවැයට මණිනු ලැබේ.

අනෙකුත් ලැබිය යුතු දෑ, අපහායනය සඳහා වන ප්‍රතිපාදන අඩු කොට ඒවා උපලබ්ධි කිරීමට ඇස්තමේන්තු කර ඇති ප්‍රමාණයන්ට හඳුනාගනු ලැබේ. ප්‍රතිපාදන ප්‍රමාණය විස්තීරණ ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගනු ලැබේ. කෙසේවුවද, සමාගමට අදාළ නොවැළැක්විය හැකි හේතු නිසා කාර්යමණ්ඩල ණය ක්‍රමක්ෂය පිරිවැය මත මනිනු ලබන්නේ නැත.

1.3.10 මුදල් හා මුදල් සමාන දෑ

මුදල් හා සමාන දේ වලට අතැති මුදල්, ඉල්ලුම් තැන්පතු ලෙස රඳවාගෙන ඇති තැන්පතු, මුලින් මාස තුනක කල්පිරීම් සහිත අනෙකුත් කෙටිකාලීන ඉහළ ද්‍රවශීල ආයෝජන ඇතුලත් වේ. බැංකු අයිරා මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයේ ජංගම බැරකම් තුළ පෙන්නුම් කරනු ලැබේ.

1.3.11 ප්‍රකාශිත ප්‍රාග්ධනය

(a) වර්ගීකරණය

මුදල් හෝ අනෙකුත් වත්කම් පැවරීමට බැඳීමක් නොමැති විටදී අභිමතානුසාරී ලාභාංශ සහිත සාමාන්‍ය කොටස් ස්කන්ධ ලෙස වර්ගීකරණය කරනු ලැබේ.

(b) ලාභාංශ

ලාභාංශ ලැබීමට කොටස් හිමියන්ගේ අයිතිය ස්ථාපිත කළ විටදී, ලාභාංශ පිළිගනු ලැබේ. ස්කන්ධ කොටස් හිමියන්ගේ අතුරු ලාභාංශ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ප්‍රකාශ කරනු ලැබේ. අවසාන ලාභාංශ ගෙවනු ලබනුයේ කොටස් හිමියන් විසින් වාර්ෂික මහා සම්මේලනයේදී අනුමත කරනු ලැබූ විටදීය.

1.3.12 ජංගම සහ විලම්භිත ආදායම් බදු

a) ජංගම බදු

වත්මන් සහ පූර්ව කාල සීමා සඳහා ජංගම ආදායම් බදු වත්කම් සහ බැරකම් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් අයකර ගැනීමට හෝ ගෙවීමට අපේක්ෂා කරනු ලබන ප්‍රමාණය මනිනු ලැබේ.

ආදායම් බදු සඳහා වන විධිවිධානය පදනම් වන්නේ මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කර ඇති සහ 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ විධි විධාන අනුව ගණනය කළ ආදායම් සහ වියදම් සංරචකයන් මතයි.

b) විලම්භිත බදුකරණය

බැරකම් ක්‍රමවේදය යොදා ගනිමින් විලම්භිත බදු සපයනු ලැබ ඇත්තේ, මූල්‍ය වාර්තාකරණ කාර්යයන් සහ බදු කාර්යයන් සඳහා භාවිතා කරනු ලබන ප්‍රමාණයන් සඳහා වත්කම් සහ බැරකම් අතර ධාරණ ප්‍රමාණවල තාවකාලික වෙනස්කම්වලට විධිවිධාන සලස්වමිනි.

සියලු තාවකාලික වෙනස්කම් සඳහා විලම්භිත බදු වත්කම් සහ බැරකම් පිළිගනු ලැබේ. සියලු අඩුකළ හැකි තාවකාලික වෙනස්කම් සහ අභාවිත බදු ණය සහ අභාවිත බදු අලාභ ඉදිරියට ගෙන යාම ප්‍රයෝජනයට ගත හැකි බදු අයකළ හැකි ලාභයක් තිබීමේ හැකියාව ඇති ප්‍රමාණයට සියලු අඩුකළ හැකි තාවකාලික වෙනස්කම්, අභාවිත බදු ණය සහ අභාවිත බදු අලාභ ඉදිරියට ගෙන යාම සඳහා විලම්භිත බදු වත්කම් පිළිගනු ලැබේ.

විලම්භිත බදුවල ධාරණ ප්‍රමාණය එක් එක් මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයේ දිනයට සමාලෝචනය කරනු ලබන අතර විලම්භිත බදු වත්කම්වල සියල්ල හෝ කොටසක් ප්‍රයෝජනයට ගැනීම සඳහා ඉඩ දීම පිණිස බදු අයකළ හැකි ප්‍රමාණවත් ලාභයක් පැවැතීම තවදුරටත් සම්භාවී නොවන ප්‍රමාණයට අඩු කරනු ලැබේ. හඳුනා නොගත් විලම්භිත බදු වත්කම් මූල්‍ය තත්ත්වය ප්‍රකාශයේ සෑම දිනයකම නැවත තක්සේරු කරනු ලබන අතර අනාගත බදු අය කළ හැකි ලාභය මඟින් විලම්භිත බදු වත්කම් ආපසු අයකර ගැනීමට ඉඩ සැලසෙන තරමට හඳුනාගෙන ඇත.

මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයේ දිනට පනවා ඇති හෝ පැනවීමට නියමිත බදු අනුපාත සහ බදු නීති මත පදනම්ව, වත්කම උපලබ්ධි වූ හෝ බැරකම පියවනු ලැබූ වර්ෂයට අදාළ කර ගැනීමට අපේක්ෂා කරනු ලබන බදු අනුපාතයන්ට අනුව විලම්භිත බදු වත්කම් සහ බැරකම් ගණනය කරනු ලැබේ.

ස්කන්ධ වශයෙන් සෘජුවම හඳුනාගෙන ඇති අයිතමවලට අදාළ ආදායම් බද්ද කොටස් වශයෙන් හඳුනාගෙන ඇත.

ජංගම බදු බැරකම් සහ වත්කම් හිලව් කිරීම පිණිස නෛතිකව බලාත්මක කළ යුතු හිමිකමක් වේ නම් සහ එම බදු අයකළ හැක අස්තිත්වයට එහා බදු අධිකාරීන් විසින්ම අයකරනු ලබන අදායම් බදුවලට ඒවා අදාළ වන්නේ නම් විලම්භිත බදු වත්කම් සහ බැරකම් හිලව් කරනු ලැබේ.

1.3.13 සේවක ප්‍රතිලාභ

(a) නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් - පාරිතෝෂික

LKAS 19 / 1983 අංක 12 දරන පාරිතෝෂික පනත අනුව විශ්‍රාම ප්‍රතිලාභ සඳහා විධි විධාන සලසා ඇත. වගකීම් සඳහා බාහිරව අරමුදල් සැපයෙන්නේ නැත. සිදුකරන ලද ආයුගණක ඇගයීම් මත පාරිතෝෂික බැරකම් පදනම් වේ. ආයුගණක ලාභ හෝ අලාභ ඒවා මතුවූ කාල සීමාවෙහි වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශයට වැය බරක් වනු ඇත නැතහොත් බැර කරනු ඇත.

සමාගමේ විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් ඇක්චූරියල් ඇන්ඩ් මැනේජ්මන්ට් කන්සල්ටන්ට් (පුද්) සමාගම විසින් සිදුකළ ආයුගණක ඇගයීම් මත පදනම් වේ. ආයුගණක ඇගයීම්, වට්ටම් අනුපාත සහ අනාගත වැටුප් වර්ධක පිළිබඳ උපකල්පන සිදුකිරීම් හා සම්බන්ධ වේ. තක්සේරුකරණයේ සංකීර්ණත්වය, පවතින උපකල්පන සහ එහි දිගුකාලීන ස්වභාවය, අර්ථ දක්වා ඇති ප්‍රතිලාභ බැඳීමක් මෙම උපකල්පනවල වෙනස්කම් වලට බෙහෙවින් සංවේදී වේ. සියලු උපකල්පන එක් එක් වාර්තාකරණ දිනයේදී සමාලෝචනය කරනු ලැබේ. ඇගයීමේදී භාවිතා කළ ප්‍රධාන උපකල්පන පිළිබඳ විස්තර 16 වන සටහනෙහි දැක්වේ. භාවිතා කළ ප්‍රධාන උපකල්පන වනුයේ මරණ අනුපාතය, දුබලතා අනුපාත සහ ආපසු ගැනීමේ අනුපාතයි. අවසන් වැටුප් විශ්‍රාම යෝජනා ක්‍රමයක් සඳහා ප්‍රතිපාදන සැලසීමේ වේගය නිර්ණය කිරීමේදී වට්ටම් අනුපාතය සහ වැටුප් අනුපාත පිළිබඳ උපකල්පන තීරණාත්මකව වැදගත් වේ.

(b) නිශ්චිත දායක සැලසුම- සේවක අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදල

අදාළ ප්‍රඥප්ති හා රෙගුලාසි වලට අනුකූලව සේවක අර්ථසාධක අරමුදල් දායකත්වය සහ සේවක භාර අරමුදල් දායකත්වය සඳහා සේවකයින් සුදුසුකම් ලබයි. සමාගම සේවකයන්ගේ දළ වේතනවලින් 12% ක් සහ 3% ක් සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල සඳහා අනුපිළිවෙලින් දායක කරයි.

1.3.14 ප්‍රදාන සහ සහනාධාර

ක්‍රමානුකූල පදනමක් මත වන්දි ගෙවීමට අදහස් කරන අදාළ පිරිවැය හා සැසඳීමට අවශ්‍ය කාල සීමාව තුළ විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට ප්‍රදාන සහ සහනාධාර බැර කරනු ලැබේ.

සාධාරණ අගයට කෙරෙන මූල්‍ය නොවන ප්‍රදාන ඇතුළු වත්කම් වලට අදාළ ප්‍රදානයන්, විලම්භිත ආදායම ලෙස මූල්‍ය තත්ව ප්‍රකාශය තුළ ඉදිරිපත් කර ඇති අතර වත්කමේ ඵලදායී ආයුකාලය මත ආදායම් ප්‍රකාශය තුළ හඳුනාගනු ලැබේ.

අදායමට අදාළ ප්‍රදානයන්, ඒවා ලැබුණු කාල සීමාව අනුව විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ හඳුනාගෙන ඇත.

1.3.15 වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු දෑ

වෙළෙඳ ගෙවීම් යනු සාමාන්‍ය ව්‍යාපාර ක්‍රියාවලිය තුළ සැපයුම්කරුවන්ගෙන් ලබාගත් සේවාවන්ට ගෙවිය යුතු මුදලයි. වසරක් තුළ හෝ ඊට අඩුවෙන් ගෙවීමට ඇති විට ජංගම වගකීම් ලෙස වර්ගීකරණය කර ඇති අතර එසේ නැතහොත් ඒවා ජංගම නොවන වගකීම් ලෙස ඉදිරිපත් කර ඇත.

වෙළෙඳ ගෙවිය යුතු දෑ ආරම්භයේදී සාධාරණ අගයට පිළිගනු ලබන අතර ඉන්පසුව ඒවා සඵල පොළී ක්‍රමවේදය භාවිතා කරමින් ක්‍රමක්ෂීත පිරිවැයට මණිනු ලැබේ. වට්ටම් කිරීමේ බලපෑම නොවැදගත් බැවින් ප්‍රකාශිත පොළී අනුපාතයක් රහිත කෙටි කාලීන ගෙවිය යුතු දෑ ආරම්භක ඉන්වොයිසි කළ ප්‍රමාණයට මනිනු ලැබේ.

1.3.16 ප්‍රතිපාදන

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස වත්මන් නෛතික සහ සම්මුතික බැඳීමක් මණ්ඩලය සතු විටදී එම බැඳීම පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ මූර්තිමත් කරමින් සම්පත් ගලායාමක් අවශ්‍ය වීම සිදුවිය හැකි විටකදී සහ බැඳීමේ

වටිනාකමට විශ්වාසනීය ඇස්තමේන්තුවක් සිදු කළ හැකි විටදී ප්‍රතිපාදන හඳුනාගනු ලැබේ. අනාගත මෙහෙයුම් අලාභ සඳහා ප්‍රතිපාදන හඳුනාගනු නොලැබේ.

එක හා සමාන බැඳීම් කිහිපයක් ඇතිවිටදී, බැඳීම් පංතිය සමස්තයක් ලෙස සලකා බැලීම මගින්, ඒවා පියවීම සඳහා මුදල් ගලායාමක් අවශ්‍ය කරනු ලැබීම පිළිබඳ භව්‍යතාව නිර්ණය කරනු ලැබේ. සමාන බැඳීම් පංතියක ඇතුලත් කොට ඇති කවර හෝ එක් අයිතමයකට අදාළ මුදල් ගලා යාමේ භව්‍යතාව සුළු වුවත් ප්‍රතිපාදනයක් පිළිගනු ලැබේ.

1.3.17 බැඳීම්

වාර්තාකරණ දිනය වන විට පැවැති සියලු ද්‍රව්‍යමය බැඳීම් හඳුනාගෙන ඇති අතර ඒවා මූල්‍ය ප්‍රකාශ සටහන්වල හෙළිදරව් කර ඇත.

1.3.18 ආශ්‍රිත පාර්ශව ගනුදෙනු

වෙනත් පාර්ශවයක මූල්‍ය හෝ මෙහෙයුම් ප්‍රතිපත්ති/ තීරණ පාලනය කිරීමට හෝ සැලකිය යුතු බලපෑමක් කිරීමට එක් පාර්ශවයකට හැකියාවක් ඇති විටදී, මිලක් ගෙවන්නේද නැද්ද යන්න නොසළකා, ගනුදෙනුවට අදාළ අනාවරණයන් කරනු ලැබේ. මව් සමාගම සහ පරිපාලිත සමාගම් අතර ගනුදෙනුවක් සිදුවූයේද නැද්ද යන්න නොතකා එම ආශ්‍රිත පාර්ශව අතර සබඳතාවය අනාවරණය කළ යුතුය.

1.3.19 ආදායම හඳුනාගැනීම

පාරිභෝගිකයින් සමග ගිවිසුම් වෙතින් ආදායම

පාරිභෝගිකයන් සමග ගිවිසුම්වලින් ලැබෙන ආදායම, එම භාණ්ඩ හෝ සේවා සඳහා හුවමාරු කර ගැනීමට සමාගම අපේක්ෂා කරන සලකා බැලීම පිළිබිඹු කරන මුදලකට භාණ්ඩ හෝ සේවා පාලනය පාරිභෝගිකයා වෙත පැවරෙන විට හඳුනා ගැනේ.

(a) යම් කාල ලක්ෂ්‍යයකදී මාරු කරන ලද භාණ්ඩ

SLFRS 15 යටතේ, කාර්ය සාධන වගකීමක් තෘප්තිමත් කිරීම මත ආදායම හඳුනා ගැනේ. සාමාන්‍යයෙන් භාණ්ඩ භාරදීමේදී වත්කම් පාලනය පාරිභෝගිකයා වෙත පැවරෙන මොහොතක ආදායම් හඳුනාගැනීම සිදුවේ.

(b) කාලයත් සමග පවරන ලද සේවාව

SLFRS 15 යටතේ, සමාගම විසින් කොන්ත්‍රාත්තුවේ ආරම්භයේදීම එය කාලයත් සමග හෝ යම් කාල ලක්ෂ්‍යයකදී කාර්ය සාධන වගකීම තෘප්තිමත් කරන්නේද යන්න තීරණය කරයි. කාලයත් සමඟ තෘප්තිමත් වන සෑම කාර්ය සාධන වගකීමක් සඳහාම, එම කාර්ය සාධන වගකීමේ සම්පූර්ණ තෘප්තිය සඳහා ප්‍රගතිය මැනීමෙන් සමාගම කාලයත් සමඟ ආදායම හඳුනා ගනී.

(c) පොළී ආදායම

සඵල පොලී ක්‍රම වේදය යොදා ගනිමින් පොලී ආදායම හඳුනාගනු ලැබේ.

(d) ලාභාංශ ආදායම

ගෙවීම් ලැබීමට ඇති අයිතිය තහවුරු වූ විට ලාභාංශ ආදායම හඳුනා ගැනේ.

(e) වෙනත් ආදායම්

වෙනත් ආදායම් උපචිත පදනමින් හඳුනාගනු ලබයි.

1.3.20 වියදම්

වියදම් හඳුනාගැනෙන්නේ උපචිත පදනමිනි. ව්‍යාපාරයේ එදිනෙදා කටයුතු පවත්වාගෙන යාමට සහ දේපල, පිරියත හා උපකරණ කාර්යක්ෂම තත්වයකින් පවත්වාගෙන යාම පිණිස දරන ලද සියලු වියදම් වසර සඳහා ලාභ කරා පැමිණීමේදී ආදායමට අය කර තිබේ.

විස්තීරණ ආදායම් ප්‍රකාශ තොරතුරු ඉදිරිපත් කිරීමේ කාර්යය සඳහා, වියදම් වර්ගීකරණය පිණිස වියදමේ ක්‍රියාකාරීත්ව ක්‍රමවේදය යොදා ගෙන ඇත.

2 දේපළ, පිරියත සහ උපකරණ

අ. ස්පෂ්ය වත්කම්

වත්කම් පිළිබඳ විස්තරය	ශේෂය 01.01.2020 දිනට රුපියල්	එකතුකිරීම් රුපියල්	පිරිවැය / ඇගයීම අපහරණයන් රුපියල්	මාරු කිරීම් රුපියල්	ශේෂය 31.12.2020 දිනට රුපියල්	ශේෂය 01.01.2020 දිනට රුපියල්	ක්ෂය වීම් ගාස්තුව වසර සඳහා රුපියල්	අපහරණයන් මත රුපියල්	මාරු කිරීම් රුපියල්	ශේෂය 31.12.2020 දිනට රුපියල්	ලියා හළ අගය 01.01.2020 දිනට රුපියල්	31.12.2020 දිනට රුපියල්
ඉඩම්	3,250,000				3,250,000	-				-	3,250,000	3,250,000
ගොඩනැගිලි	510,221,172	-		10,252,200	520,473,372	171,497,759	42,752,227			214,249,986	338,723,413	306,223,386
පිරියත සහ යන්ත්‍රෝපකරණ	7,433,197,173	21,743,572		71,342,562	7,526,283,307	1,928,755,287	399,987,611			2,328,742,898	5,504,441,887	5,197,540,409
ගෘහ භාන්ඩ සහ සවිකිරීම්	50,682,206	2,293,565			52,975,771	40,739,897	3,418,067			44,157,965	9,942,308	8,817,806
විද්‍යාගාර උපකරණ	82,516,268	2,627,546			85,143,815	60,605,481	7,928,980			68,534,460	21,910,788	16,609,354
මෝටර් වාහන	142,852,408			8,290,000	151,142,408	145,195,708	6,107,960		8,290,000	159,593,667	(2,343,300)	(8,451,259)
මෙවලම් සහ උපකරණ	333,746,966	15,757,447			349,504,412	270,438,034	27,366,284			297,804,319	63,308,931	51,700,094
බෝතල් හා ඇසුරුම් භාජන	355,310,326	12,297,091	(547,193)		367,060,224	323,424,055	17,787,422	(547,193)		340,664,284	31,886,271	26,395,940
පරිගණක උපකරණ	52,503,731	2,799,337			55,303,068	38,199,234	6,459,659			44,658,892	14,304,497	10,644,175
බෝතල් ශීතකරණ	152,100,544				152,100,544	142,633,301	3,470,647			146,103,948	9,467,243	5,996,596
කාර්යාල උපකරණ	10,197,986	629,583	(51,555)		10,776,014	7,987,370	929,827	(28,569)		8,888,627	2,210,616	1,887,387
කිරි භාජන	80,178,849	9,000			80,187,849	65,204,017	5,587,346			70,791,363	14,974,832	9,396,486
	9,206,757,629	58,157,140	(598,748)	89,884,762	9,354,200,784	3,194,680,142	521,796,030	(575,762)	8,290,000	3,724,190,410	6,012,077,486	5,630,010,374
ආ. අස්පෂ්ය වත්කම්												
පරිගණක මෘදුකාංග	2,837,209	-	-	-	2,837,209	2,716,204	83,562			2,799,766	121,005	37,443
ඇ. බදුකර වත්කම්												
මෝටර් වාහන	73,442,966	-	-	-	-	19,840,369	-		-	-	53,602,597	-
එකතුව	9,283,037,804	58,157,140	(598,748)	89,884,762	9,357,037,993	3,217,236,716	521,879,592	(575,762)	8,290,000	3,746,830,545	6,065,801,089	5,630,047,816

2.1 SLFRS-16 හි විධිවිධාන අනුව 2020.12.31 දින සිට භාවිත අයිතිය ඇති වත්කම් යටතේ මූල්‍ය කල්බදු යටතේ පෙන්වා ඇති වත්කම නැවත වර්ගීකරණය කර ඇත.

3 භාවිත අයිතිය සහිත වත්කම්

	ශේෂය 01.01.2020 දිනට	එකතුකිරීම්	වටිනාකම අපහරණයන්	මාරු කිරීම්	ශේෂය 31.12.2020 දිනට	ශේෂය 01.01.2020 දිනට	ක්‍රමක්ෂය ගාස්තුව වසර සඳහා	අපහරණයන් මත	මාරු කිරීම්	ශේෂය 31.12.2020 දිනට	ශුද්ධ අගය 01.01.2020 දිනට	31.12.2020 දිනට
මෝටර් වාහන	73,442,966	8,035,000	-	(8,290,000)	73,187,966	19,840,369	13,321,663	-	(8,290,000)	24,872,032	-	48,315,935
එකතුව	73,442,966	8,035,000	-	(8,290,000)	73,187,966	19,840,369	13,321,663	-	(8,290,000)	24,872,032	-	48,315,935

3.1 වසර තුළ ආදායම් ප්‍රකාශනයේ භාවිත අයිතිය සහිත වත්කම්වලට අදාළ පහත ප්‍රමාණයන් හඳුනාගෙන ඇත.

භාවිත අයිතිය සහිත වත්කම්වල ක්‍රමක්ෂය	13,321,663
කල්බදු වගකීම් මත පොළිය	3,968,828

		ශේෂය		ප්‍රාග්ධනීකෘත ගාස්තුව	ශේෂය
		01.01.2020 දිනට කාල සීමාව තුළ අය වූ			31.12.2020
		රුපියල්	රුපියල්	රුපියල්	රුපියල්
4	**නොනිමි ප්‍රාග්ධන වැඩ**				
	බඩල්ගම නව කිරි කර්මාන්ත ශාලාව ඉදිකිරීම (සටහන 15 බලන්න) *	11,671,726,295	565,227	-	11,672,291,523
	ගැටඹේ අලෙවිහල ඉදිකිරීම	150,000	-	-	150,000
	දිගන කිරි කම්හලේ කෝප්ප සහ කෝන් ෆිලරය ස්ථාපනය	15,445,587	-	-	15,445,587
	කර්මාන්තශාලා නවීකරණය - පොලොන්නරුව, අඹේවෙල සහ දිගන (සටහන 22 බලන්න)*	790,264,562	-	-	790,264,562
	අඹේවෙල කිරි කම්හලේ සංවර්ධන ව්‍යාපෘති	71,342,562	-	(71,342,562)	-
	පොළොන්නරුව කිරි කර්මාන්තශාලාවේ ශීතකරණ කාමරයක් ඉදි කිරීම	-	-	-	
	ප්‍රෝ-ෆිට් කළමනාකරණ තොරතුරු පද්ධතිය ක්‍රියාත්මක කිරීම	4,179,530	-	-	4,179,530
	ශීත මධ්‍යස්ථානයක් ඉදි කිරීම - පාලතෝප්පූර්	-	-	-	
	සංවර්ධනය කෙරෙන ලොරි වැසිය	17,714,550	-	-	17,714,550
	ශීත මධ්‍යස්ථානයක් ඉදි කිරීම - ලුණුගල	57,500	192,980	-	250,480
	අඹේවෙල කිරි කම්හල් ගොඩනැගිල්ල ඉදි කිරීම	7,055,125	3,197,074	(10,252,200)	-
	දිගන කිරි කම්හලේ කාර්යාල ගොඩනැගිල්ල ඉදි කිරීම	10,222,824	9,412,319	-	19,635,143
	දිගන කිරි කම්හලේ ශීත කාමරය ඉදි කිරීම	-	16,169,330	-	16,169,330
	ශීත මධ්‍යස්ථානයක් ඉදි කිරීම - මුන්දලම	-	291,793	-	291,793
		12,588,158,537	29,828,724	(81,594,762)	12,536,392,498

4.1 මෙම මූල්‍ය ප්‍රකාශනවල අංක 15 හි දක්වා ඇති පරිදි, ඉහත කර්මාන්තශාලා නවීකරණය කිරීම සහ නව කිරි කර්මාන්තශාලාව - බඩල්ගම ඉදිකිරීම සඳහා මූල්‍යනය කර ඇත්තේ ශ්‍රී ලංකා රජයේ භාණ්ඩාගාරය විසින් ලබා දී ඇති ණය මගිනි.

		2020 දෙසැම්බර් 31 දිනට රුපියල්	2019 දෙසැම්බර් 31 දිනට රුපියල්
5	**මූල්‍ය උපකරණ -ක්‍රමක්ෂය වූ පිරිවැය**		
5.1	**දීර්ඝ කාලීන ස්ථාවර තැන්පතු**		
	ස්ථාවර තැන්පතු -ලංකා බැංකුව - US $	606,519,828	578,599,135
	ස්ථාවර තැන්පතු - මහජන බැංකුව සහ පෑන් ඒෂියා බැංකුව	205,000,000	209,097,006
		811,519,828	787,696,142

මූල්‍ය ආයතනවලින් විවිධ මූල්‍ය ආධාර ලබා ගැනීම සඳහා ඇපකරයක් ලෙස ප්‍රතිඥා දී ඇති ආයෝජන මෙම මූල්‍ය ප්‍රකාශනවල අංක 30 සටහනේ අනාවරණය කර ඇත.

6 දීර්ඝ කාලීන අත්තිකාරම්

DESMI වෙත අත්තිකාරම් - CMF බඩල්ගමට ගෙනයාම

වසර ආරම්භයේදී ශේෂය	139,152,682	356,287,245
නොනිමි ප්‍රාග්ධන වැඩ වෙත මාරු කෙරිණි	-	(217,134,563)
වසර අවසානය ශේෂය	139,152,682	139,152,682

මෙම මූල්‍ය ප්‍රකාශනවල අංක 15 සටහනේ විස්තර කර ඇති පරිදි, බඩල්ගම කිරි කර්මාන්ත ශාලාව පිහිටුවීම සඳහා ශ්‍රී ලංකා රජයේ භාණ්ඩාගාරය විසින් ලබා දෙන ලද ණය මුදලකින් මුදල් සපයා ඇත. 22/10/2015 දින, ශ්‍රී ලංකා රජයේ භාණ්ඩාගාරය විසින් EURO 19,180,692 (කොන්ත්‍රාත් වටිනාකමින් 30%) ට සමාන මුදලක් අත්තිකාරම් ගෙවා ඇත.

7 ඉන්වෙන්ට්‍රි

අමුද්‍රව්‍ය සහ ඇසුරුම් ද්‍රව්‍ය	**7.1**	311,566,260	321,342,530
නොනිමි වැඩ		8,616,684	5,895,808
නිමි භාණ්ඩ		230,501,369	218,770,084
පරිභෝජන භාණ්ඩ	**7.2**	585,225,407	548,245,734
ප්‍රවාහනයේ ඇති භාණ්ඩ	**7.3**	9,124,716	10,973,035
ඉන්වෙන්ට්‍රි සඳහා ප්‍රතිපාදන	**7.4**	(12,096,362)	(12,096,362)
		1,132,938,074	1,093,130,830

7.1 අමුද්‍රව්‍ය සහ ඇසුරුම් ද්‍රව්‍ය

අමු ද්‍රව්‍ය - කිරි නිෂ්පාදනය	65,456,573	70,799,062
ඇසුරුම් ද්‍රව්‍ය	224,256,409	230,784,760
අමු කිරි තොග	14,816,775	12,722,205
බෝතල් ශීතකරණ තොග	3,496,313	3,496,313
ඖෂධ සහ අනෙක් තොග	3,540,190	3,540,190
	311,566,260	321,342,530

			2,020 දෙසැම්බර් 31 දිනට රුපියල්	2,019 දෙසැම්බර් 31 දිනට රුපියල්
7.2	**පරිභෝජන භාණ්ඩ**			
	පොදු ගබඩා		45,659,458	53,108,135
	ඉංජිනේරු ගබඩා		487,268,325	443,052,222
	මෝටර් ගබඩා		12,304,752	13,159,699
	ඉන්ධන සහ ස්නේහක ගබඩා		30,964,002	29,896,808
	කිරි කෑන් තොග		9,028,871	9,028,871
			585,225,407	548,245,734
7.3	**ප්‍රවාහනයේ ඇති භාණ්ඩ**			
	ප්‍රවාහනයේ ඇති නිමි භාණ්ඩ		7,984,541.78	5,151,487
	ප්‍රවාහනයේ ඇති භාණ්ඩ විද්‍යාගාර උපකරණ		125,798	125,798
	ප්‍රවාහනයේ ඇති අමු කිරි		537,476	4,827,551
	යෝගට් මුහුන්		476,900	868,200
			9,124,716	10,973,035
7.4	ඉන්වෙන්ට්‍රි සඳහා ප්‍රතිපාදන			
	ඇසුරුම් ද්‍රව්‍ය		(10,163,806)	(10,163,806)
	පොදු ගබඩා		(332,731)	(332,731)
	ඉංජිනේරු ගබඩා		(1,523,655)	(1,523,655)
	ඉන්ධන ගබඩා		(76,170)	(76,170)
			(12,096,362)	(12,096,362)

7.5 මූල්‍ය ආයතනවලින් විවිධ මූල්‍ය ආධාර ලබා ගැනීම සඳහා ඇපකරයක් ලෙස ප්‍රතිඥා දී ඇති තොග මෙම මූල්‍ය ප්‍රකාශනවල අංක 30 සටහනේ අනාවරණය කර ඇත.

8	**වෙළෙඳ සහ වෙනත් ලැබිය යුතු දෑ**			
	වෙළෙඳ ලැබිය යුතු දෑ	**8.1**	668,205,047	755,350,643
	ශ්‍රී ලංකා රජයෙන් ලැබිය යුතු දෑ	**8.2**	9,373,875	6,973,875
	වෙනත් ණයගැතියන්		46,400,866	48,852,088
	අත්තිකාරම්, තැන්පතු සහ පෙර ගෙවීම්		146,537,518	159,647,848
	කාර්ය මණ්ඩල ණයකරුවන්		164,864,339	161,476,069
	ආනයන පාලන		19,839,349	58,934,995
	ස්ථාවර තැන්පතු මත ලැබිය යුතු පොළිය		19,885,159	-
			1,075,106,153	1,191,235,517

		2020 දෙසැම්බර් 31 දිනට රුපියල්	2019 දෙසැම්බර් 31 දිනට රුපියල්
8.1	**වෙළෙඳ ලැබිය යුතු දෑ**		
	මුළු ණයගැතියන්	719,118,672	806,264,268
	අඩු කළා: අපහායන ප්‍රතිපාදනය	(50,913,625)	(50,913,625)
		668,205,047	755,350,643
8.2	**ශ්‍රී ලංකා රජයෙන් ලැබිය යුතු දෑ**		
	පශු සම්පත් සහ සංවර්ධන අමාත්‍යාංශයෙන් ලැබිය යුතු දෑ	9,279,542	6,879,542
	ශ්‍රී ලංකා රජයෙන් ලැබිය යුතු දෑ	278,981,206	278,981,206
	පාර්ලිමේන්තු කටයුතු වෙතින් ලැබිය යුතු දෑ	94,333	94,333
		288,355,081	285,955,081
	අඩු කළා: අපහායන ප්‍රතිපාදනය	(278,981,206)	(278,981,206)
		9,373,875	6,973,875
9	**ලැබිය යුතු ආදායම් බදු**		
	ලැබිය යුතු රදවා ගැනීම් බද්ද	9,038,230	9,038,230
	ලැබිය යුතු ආථර්ක සේවා බද්ද	112,126,408	203,476,482
		121,164,639	212,514,712
10	**මුදල් හා මුදල් සමාන දෑ**		
	බැංකුවල ශේෂයන්	12,456,380	7,989,149
	අතැති සුළු මුදල්	4,771,749	4,825,402
		17,228,129	12,814,551
11	**ප්‍රකාශිත ප්‍රාග්ධනය**		
	නිකුත් කළ හා පූර්ණව ගෙවන ලද කොටස් ගණන 31,945,406	319,454,060	319,454,060
12	**ප්‍රාග්ධන සංචිත**		
12.1	පිරියත සහ උපකරණ අත්පත්කර ගැනීම	25,000,000	25,000,000

ඉහත සඳහන් සංචිතය 2008/2009 වර්ෂය තුළ ආදායම් සංචිතයෙන් නිර්මාණය කර ඇති අතර එය විදුලි බලාගාර, විෂබීජහරණ යන්ත්‍රෝපකරණ වැනි බැර පිරියත සහ උපකරණ ලබා ගැනීමට යොදා ගැනේ.

		2020 දෙසැම්බර් 31 දිනට රුපියල්	2019 දෙසැම්බර් 31 දිනට රුපියල්
13	**නිදන් අරමුදල**		
	රඳවාගත් ඉපැයුම්වලින් පවරන ලද	1,689,978	1,689,978
		1,689,978	1,689,978

ගොවීන්ට විකුණනු ලැබූ කිරි බඳුන් වලින් ලත් මුදලින් නිදන් අරමුදල ගොඩනගා ඇත. අනාගතයේ ගොවීන්හට ආපසු අයකර ගැනීමේ පදනම මත නිකුත් කිරීමට අදහස් කරනු ලබන මිලදී ගැනීම්වල මූල්‍ය අවශ්‍යතා සපුරාලීමට එකී අරමුදල යොදා ගනු ඇත.

14	**විලම්භිත බදු බැරකම**		
	වසර ආරම්භයේදී	-	-
	විස්තීරණ ආදායම් ප්‍රකාශය (වෙත)/වෙතින් ගාස්තු	-	-
	වසර අවසානයේදී	-	-
14.1	බදු අය කළ හැකි තාවකාලික වෙනස්කම් මත බදු බලපෑම	890,599,613	784,548,101
	අඩු කළ හැකි තාවකාලික වෙනස්කම් මත බදු බලපෑම	(162,821,301)	(91,219,106)
	අඩු කළා: බදු අලාභ මත තාවකාලික වෙනස මත බදු බලපෑම	(1,046,468,637)	(949,598,697)
	භව්‍ය විලම්භිත බදු වගකීම	(318,690,324)	(256,269,701)

රු.318,690,324 ක් වන විලම්භිත බදු වත්කම් ප්‍රමාණවත් බදු අය කළ හැකි තාවකාලික වෙනස්කම් හෝ ප්‍රමාණවත් බදු අය කළ හැකි ලාභ ලබා ගත හැකි බවට ඒත්තු ගැන්වෙන සාක්ෂි නොමැති නිසා මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන නොමැත.

15	**ණය සහ ණයගැනීම්**				
15.1	**පොලී සහිත ණය ගැනීම්**				
	වසරක් තුල ගෙවිය යුතු	**15.1.1 සිට**	**15.1.4 දක්වා**	96,110,896	135,419,841
	වසරකින් පසු ගෙවිය යුතු	**15.1.1 සිට**	**15.1.4 දක්වා**	18,449,096,221	18,572,055,438
				18,545,207,117	18,707,475,279
15.1.1	**කෙටි කාලීන ණය**				
	පැන් ඒෂියා බැංකුවෙන් ගත් කෙටි කාලීන ණය			-	15,727,311
				-	15,727,311
15.1.2	**දළ කල්බදු ණය හිමියා**				
	වසර ආරම්භයේදී ශේෂය			45,373,000	48,772,108
	වසර තුළ එකතු කිරීම්			-	27,049,248
	වසර තුළ ගෙවීම්			(23,426,318)	(30,448,356)
	වසර අවසානය ශේෂය			21,946,682	45,373,000
	රඳවාගෙන ඇති පොලිය				
	වසර ආරම්භයේදී ශේෂය			6,871,776	5,860,539
	වසර තුල ලබාගත් කල්බදු පහසුකම් මත			-	6,236,748
	විස්තීරණ ආදායම් ප්‍රකාශයට පවරන ලද අගය			(3,968,828)	(5,225,511)
	වසර අවසානය ශේෂය			2,902,948	6,871,776
	ශුද්ධ වගකීම			19,043,734	38,501,224
	ජංගම කල්පිරීමේ කොටස			9,444,408	19,454,480
	දිගු කාලීන කල්පිරීමේ කොටස			9,599,326	19,046,744
				19,043,734	38,501,224

	2020 දෙසැම්බර් 31 දිනට රුපියල්	2019 දෙසැම්බර් 31 දිනට රුපියල්
15.1.3 බැංකු ණය සහ ණයගැනුම්		
වසර ආරම්භයේදී ශේෂය	238,749,870	361,686,067
වසර තුළ ලත්	-	-
අඩු කළා: වසර තුළ ගෙවීම්	(127,083,362)	(122,936,197)
වසර අවසානය ශේෂය	111,666,508	238,749,870
ජංගම කල්පිරීමේ කොටස	86,666,488	100,238,050
දිගු කාලීන කල්පිරීමේ කොටස	25,000,020	138,511,820
	111,666,508	238,749,870

ඉහත ණයවලට ඇප ලෙස උකස් කරන ලද වත්කම්, මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් 30 හි හෙළිදරව් කර ඇත.

15.1.4 ශ්‍රී ලංකා රජයේ භාණ්ඩාගාරයෙන් ණය ගැනුම්		
වසර ආරම්භයේදී ශේෂය	18,414,496,875	17,921,082,356
වසර තුළ ලත්	-	493,414,518
වසර අවසානය ශේෂය	18,414,496,875	18,414,496,875
ජංගම කල්පිරීමේ කොටස	-	-
දිගු කාලීන කල්පිරීමේ කොටස	18,414,496,875	18,414,496,875
	18,414,496,875	18,414,496,875

(a) සැකසුම් කර්මාන්ත ශාලා නවීකරණය (ව්‍යාපෘතිය) සඳහා යුරෝ මිලියන 33.7 ක වියදමක් ආවරණය කිරීමට මිල්කෝ (පුද්.) සමාගම 2009 දෙසැම්බර් මස 31 වනදා ඩෙන්මාර්කයේ ස්ථාපිත සමාගමක් වන Desmi Contracting A/S සමග ගිවිසුමකට එළඹෙන ලදී.

මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යවරයා විසින් "මිල්කෝ (පුද්ගලික) සමාගමේ සැකසුම් කර්මාන්ත ශාලා නවීකරණය' යන මැයෙන් ඉදිරිපත් කරන ලද අංක 12/1141/504/104 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව (2011 නොවැම්බර් 23 වනදින ගන්නා ලද අමාත්‍ය තීරණයේ සංශෝධනය) ඉදිරිපත් කරන ලද අතර 2012 අගෝස්තු 18 වනදා අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදුව මුදල් සහ ක්‍රමසම්පාදන අමාත්‍යාංශය විසින් එකඟවූ නියමයන් මත ඩෙන්මාර්කයේ අපනයන ණය අරමුදල (EKF) වෙතින් යුරෝ මිලියන 33.7 ක මුදලක් ණයට ගැනීමට විදේශ සම්පත් දෙපාර්තමේන්තුවට බලය පවරන ලදී. එමගින් මිල්කෝ (පුද්ගලික) සමාගම සමග තෙවන පාර්ශ්වයන්ට ණය ලබා දීමේ ගිවිසුමක් අත්සන්

අනතුරුව පහත කොන්දේසි යටතේ ශ්‍රී ලංකා රජය, ඉහත පාර්ශ්වයෙන් යුරෝ මිලියන 33.7 ක මුදලක් ලබාගැනීම සඳහා මිල්කෝ (පුද්) සමාගම සමග ගිවිසුමකට එළඹෙන ලදී.

i. මුල් මුදල, පොලිය, බැඳීම් ගාස්තුව, ව්‍යුහගත කිරීමේ ගාස්තුව සහ අනෙකුත් පිරිවැය ආපසු ගෙවීම ශ්‍රී ලංකා රජයේ භාණ්ඩාගාරයට රුපියල්වලින් සිදු කිරීම

ii. EKF චාරිකය ලෙස යුරෝ 2,274,016.40 ට සමාන මුදලක් ගෙවිය යුතුය.

iii. ගෙවීම් පැහැර හරින ලද්දේ නම් වාර්ෂිකව 2% ක ප්‍රමාද ගාස්තු ගෙවිය යුතුය.

(b) බඩල්ගම කිරි සැකසුම් අංගනය පිහිටුවීම (ව්‍යාපෘතිය) සඳහා යුරෝ මිලියන 63.9 ක වියදමක් ආවරණය කිරීමට මිල්කෝ (පුද්.) සමාගම 2015 මැයි 15 වනදා ඩෙන්මාර්කයේ ස්ථාපිත සමාගමක් වන Desmi Contracting A/S සමග ගිවිසුමකට එළඹෙන ලදී.

පශුසම්පත් සහ ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද "බඩල්ගම කිරි සැකසුම් අංගනයක් ස්ථාපිත කිරීම" යන මැයෙන් වූ අංක No.14/1399/511/001-i (2014 ඔක්තෝබර් 9 වන දින) අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව 2014 දෙසැම්බර් මස 17 වනදා අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද අතර ඒ අනුව පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය විසින් එකඟ වූ නියමයන් මත (Ref:MLRCD/03/15) ඩෙන්මාර්කයේ අපනයන ණය අරමුදල (EKF) වෙතින් යුරෝ මිලියන 63.9 ක් ණයට ගැනීමට විදේශ සම්පත් දෙපාර්තමේන්තුවට බලය ලබා දෙන ලදී.
ඉන් පසුව, ශ්‍රී ලංකා රජය මිල්කෝ පුද්ගලික සමාගම වෙනුවෙන් හොංකොං ෂැංහයි බෑන්කින්ග් ලිමිටඩ් (HSBC) සමග ණය ගිවිසුමකට අත්සන් තබා ඉහත සඳහන් පාර්ශවයෙන් පහත කොන්දේසි යටතේ යුරෝ මිලියන 3.9 ක ණයක් ලබා ගන්නා ලදී.

i. මුල් මුදල, පොලිය, බැඳීම් ගාස්තුව, ව්‍යුහගත කිරීමේ ගාස්තුව සහ අනෙකුත් පිරිවැය ආපසු ගෙවීම ශ්‍රී ලංකා රජයේ භාණ්ඩාගාරයට රුපියල්වලින් සිදු කිරීම

ii. (Eksport Kredit Fonden / අපනයන ණය අරමුදල) EKF වාරිකය ලෙස යුරෝ 2,234,919 ට සමාන මුදලක් ගෙවිය යුතුය.

iii. යුරෝ 19,180,692.30 (කොන්ත්‍රාත් වටිනාකමෙන් 30%) ට සමාන මුදලක් Desmi Contracting A/S වෙත මිල්කෝ (පුද්) සමාගම විසින් 2015 දී අත්තිකාරම් ගෙවීමක් ලෙස ගෙවා ඇත.

iv. ගෙවීම පැහැර හරින ලද්දේ නම් වාර්ෂිකව 2% ක ප්‍රමාද ගාස්තු ගෙවිය යුතුය.

2020 දෙසැම්බර් 31 වන විට ව්‍යාපෘතිය ක්‍රියාත්මක වෙමින් පැවති අතර, නැවිගත කිරීම් 43 ක් යුරෝ 36,630,705.55 ක් (නැවිගත කිරීමේ වටිනාකමෙන් 100% ක්) වෙත එලැඹී අතර කොන්ත්‍රාත්කරුට යුරෝ 21,721,006.23 ක් වූ ප්‍රධාන ගෙවීම් 14 ක් නිකුත් කර ඇත.
මිල්කෝ පුද්ගලික සමාගම ශ්‍රී ලංකා මහා භාණ්ඩාගාරය සමග අනුබද්ධ ණය ගිවිසුමකට අත්සන් තබා නැත.

		2020 දෙසැම්බර් 31 දිනට රුපියල්	2019 දෙසැම්බර් 31 දිනට රුපියල්
15.2	**පොළී රහිත ණය ගැනීම්**		
	දිගු කාලීන කොටස		
	ජාතික කිරි මණ්ඩලය	2,108,063	2,108,063
		2,108,063	2,108,063
16	**විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් - පාරිතෝෂිකය**		
	වසර ආරම්භයේදී ශේෂය	651,565,041	527,308,101
	ජංගම සේවා පිරිවැය	49,755,160	36,401,372
	පොළී පිරිවැය	66,655,104	61,853,240
	උපකල්පන වෙනස්වීම් වෙතින් (ලාභය)/පාඩුව	109,295,614	67,714,812
	වසර තුළ කළ ගෙවීම්	(35,718,123)	(41,712,485)
	වසර අවසානය ශේෂය	841,552,796	651,565,041

ඇක්චුරියල් ඇන්ඩ් මැනේජ්මන්ට් කන්සල්ටන්ට්ස් (පුද්) ආයුගණක සමාගම, 2020 දෙසැම්බර් 31 දිනට ප්‍රක්ෂේපිත ඒකක ණය ක්‍රමවේදය භාවිතා කරමින්, නිර්වචිත ප්‍රතිලාභ සැලසුම් පාරිතෝෂිකයේ ආයුගණක තක්සේරුව සිදුකරන ලදී. විශ්‍රාම ප්‍රතිලාභ පිරිවැය නිර්ණය කිරීමේදී, උචිත සහ අනුරූප උපකල්පන භාවිතා කරන ලදී.

භාවිතා කළ ප්‍රධාන උපකල්පනයන් පහත පරිදි විය:

අපේක්ෂිත වැටුප් වර්ධකය	වෂර්යකට 10%
වට්ටම් අනුපාතය	වෂර්යකට 7.39%
කාර්යමණ්ඩලය හැරයාමේ සාධක	වෂර්යකට 5%
උපරිම විශ්‍රාම වයස	අවුරුදු 60

ආයුගණක ඇගයීම තුළ භාවිතා කළ උපකල්පනයන්ගේ සංවේදීතාව

විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ සහ මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයේ සංවේදිතාව යනු වර්ෂය සඳහා ලාභය හෝ අලාභය මත වට්ටම් අනුපාතයේ සහ වැටුප් වර්ධක අනුපාතයේ සහ රැකියා ප්‍රතිලාභ බැඳීමෙහි උපකල්පිත වෙනසෙහි බලපෑම වේ.

විස්තීර්ණ ආදයම පිළිබඳ ප්‍රකාශයේ සහ මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයේ සංවේදිතාව යනු වර්ෂය සඳහා ලාභය හෝ අලාභය මත වට්ටම් අනුපාතයේ සහ වැටුප් වර්ධක අනුපාතයේ සහ රැකියා ප්‍රතිලාභ බැඳීමෙහි උපකල්පිත වෙනසෙහි බලපෑම වේ.

වට්ටම් අනුපාතයේ වැඩිවීම/(අඩුවීම)	වැටුප් වර්ධක අනුපාතයේ වැඩිවීම/(අඩුවීම)	විස්තීරණ ආදායම් ප්‍රකාශයේ වෙනස මත බලපෑම රුපියල්	සේවක ප්‍රතිලාභ බැඳීම් මත බලපෑම රුපියල්
1%	*	63,602,281	777,950,515
-1%	*	(72,643,133)	914,195,929
**	1%	(73,953,827)	915,506,623
**	-1%	66,014,112	775,538,684

* සමාගම සඳහා වැටුප් වර්ධක අනුපාතය 10%කි.

** වට්ටම් අනුපාතය 10.23% කි.

		2020 දෙසැම්බර් 31 දිනට රුපියල්	2019 දෙසැම්බර් 31 දිනට රුපියල්
17	**රජයේ දායකය**		
17.1	වසර ආරම්භයේදී ශේෂය	29,079,994.09	16,447,596
	වසර තුළ ලත් ප්‍රදානය	-	-
	වසර තුළ විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට හඳුනාගත් ප්‍රදාන		
		(8,998,110)	(12,632,398)
	වසර අවසානය ශේෂය	20,081,884	29,079,994
17.2	**විලම්භිත රජයේ ප්‍රදාන**		
	සමන්තුරෙයි ප්‍රදානය	618,801	764,401
	තිම්ලතිව් ප්‍රදානය	765,000	945,000
	කිරි බඳුන් ප්‍රදානය	114,392	114,392
	අලෙවි කුටි 14 ප්‍රදානය	468,750	543,750
	LCRD ප්‍රදානය	16,000,582	16,000,582
	සිසිල්කරණ ටැංකි ප්‍රදානය	727,792	6,086,091
	විදුලි තණකොළ කපන යන්ත්‍ර ප්‍රදානය	52,776	52,776
	සිසිල්කරණ ප්‍රදාන	1,333,793	4,573,003
		20,081,884	29,079,994
18	**වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු දෑ**		
	වෙළඳ ණය හිමියන්	262,896,321	222,900,853
	වියදම් ණය හිමියන්	346,801,069	424,278,363
	වෙනත් ගෙවිය යුතු දෑ	165,778,518	114,908,066
		775,475,909	762,087,282
19	**බැංකු අයිරා**		
	ලංකා බැංකුව	414,044,838	899,630,332
	මහජන බැංකුව	240,439,753	252,445,022
	පෑන් ඒෂියා බැංකුව	19,144,218	248,762,546
		673,628,809	1,400,837,901

		2020දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා	2019 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා
		රුපියල්	රුපියල්
20	**ආදායම**		
	දළ විකුණුම්	11,104,710,548	10,509,415,104
	ජාතිය ගොඩනැගීමේ බද්ද	-	(195,594,831)
		11,104,710,548	10,313,820,273
21	**වෙනත් ආදායම්**		
	අගරු වූ චෙක්පත් මත අධිභාර	2,363,316	6,415,722
	ආපසු නොගෙවන තැන්පතු	24,000	42,500
	ආපසු නොගෙවන ටෙන්ඩර් තැන්පතු	163,500	513,000
	විලම්භිත ආදායම	8,998,110	12,632,398
	සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම	3,248,000	3,572,000
	විවිධ ආදායම්	3,351,759	2,226,434
	හුවමාරු ලාභය	14,127,003	-
	දඩ සහ අධිභාර	434,922	1,159,556
	නිවාස කුලී	444,151	1,782,804
	සේවා කළ නොහැකි අයිතම අලෙවි කිරීම	292,648	579,231
	අපහරණ ලාභය	28,367	566,035
	ද්‍රව කිරි අලෙවි ආන්තිකය	-	220,042
		33,475,777	29,709,723
22	**මූල්‍ය ආදායම**		
	ඉල්ලුම්/ස්ථාවර තැන්පතු මත පොළිය - දේශීය	14,760,152	19,930,044
	ස්ථාවර තැන්පතු මත පොළිය - විදේශ විනිමය (ඇඩො)	31,134,260	23,178,274
	කාර්ය මණ්ඩල ණය මත පොළිය	7,078,169	6,818,527
		52,972,581	49,926,845
23	**මූල්‍ය පිරිවැය**		
	මූල්‍ය කල්බදු මත පොළිය	3,968,914	5,218,823
	ණය මත පොළිය	10,260,496	38,258,234
	බැංකු අයිරා මත පොළිය	105,510,572	152,362,290
		119,739,982	195,839,348

			2020 දෙසැම්බර් 31 දිනට රුපියල්	2019 දෙසැම්බර් 31 දිනට රුපියල්
24	**ආදායම් බදු වියදම්**			
	ජංගම ආදායම් බදු ප්‍රතිපාදනය	**24.1**	-	-
	වසර සඳහා විලම්බිත බදු ගාස්තුව	**14**	-	-
			-	-
24.1	බදුවලට පෙර ගිණුම්කරණ ලාභය		225,756,290	(862,714,548)
	අඩු කළා: වෙනම සලකා බැලූ ආදායම		(67,127,951)	(50,492,880)
	වෙළෙඳාම හෝ ව්‍යාපාර වෙතින් ලාභය		158,628,339	(913,207,428)
	අඩු කළා: බදු අරමුණු සඳහා ඉඩදෙනු ලබන හා ඉඩ නොදෙන ශුද්ධ වියදම්		790,669,720	(1,173,494,460)
	ව්‍යාපාර (පාඩුව)/ලාභය අදාළ බදුකරණය		949,298,059	-
	බදු අනුපාතය		18%	14%
	වෙනත් ආදායම් නිදහස් කරන්න		31,134,260	-
	වෙනත් බැරකම් වියදම්		949,298,059	49,926,845
	බදු අනුපාතය		18%	14%
	අය කළ හැකි ලාභය හෝ ආදායම මත බදු		170,873,651	6,989,758
	අඩු කිරීම මත බදු බලපෑම		(170,873,651)	(6,989,758)
	වසර සඳහා වන ප්‍රතිපාදන (ගැලපූ ආදායම මත බද්ද)		-	-

25 සාමාන්‍ය කොටසකට ඉපයුම්/(පාඩුව)

කොටසක මූලික ඉපැයීම් ගණනය කරනු ලබන්නේ සමාගමේ කොටස් හිමියන්ට ආරෝපණය කළ හැකි ශුද්ධ ලාභය / (අලාභය) නිකුතු සාමාන්‍ය කොටස්වල බරතැබූ සාමාන්‍ය සංඛ්‍යාවෙන් බෙදීමෙනි.

	2020 රුපියල්	2019 රුපියල්
සාමාන්‍ය කොටස්වලට ආරෝපණීය ශුද්ධ ලාභය/(පාඩුව)	116,460,676	(862,714,548)
නිකුතු සාමාන්‍ය කොටස්වල බරතැබූ සාමාන්‍ය සංඛ්‍යාව	31,945,406	31,945,406
	3.65	(27.01)

25.1 කොටසකට ඉපයුම

සමාගමේ විභව සාමාන්‍ය කොටස් නොමැති අතර එහි ප්‍රතිඵලයක් ලෙස එයද ඉහත දක්වා ඇති කොටසකට මූලික ඉපයුම (පාඩුව) හා සමාන වෙයි.

26 හඳුනා නොගත් ගිවිසුම්ගත බැඳීම්

පහත විස්තර කර ඇති පරිදි හැර, වාර්තා කරන දිනට ඉතිරිව ඇති ප්‍රාග්ධන බැඳීම් කිසිවක් ගිවිසුම්ගත වී නොමැති නමුත් මණ්ඩලය විසින් බලය පවරනු ලැබ ඇත.

27 අසම්භාව්‍ය වගකීම් සහ අසම්භාව්‍ය වත්කම්

27.1 අසම්භාව්‍ය වගකීම්

වාර්තාකරණ දිනයට පහත ඒවා හැර අසම්භාව්‍ය වගකීම් නොතිබුණි,

01 ඇතැම් සේවකයින් සහ පැරණි සේවකයින් වැටුප් ආපසු ඉල්ලා සිටීම, නැවත ස්ථාපිත කිරීම යනාදිය සම්බන්ධ බේරුම්කරණය මෙන්ම මූලික අයිතිවාසිකම් සම්බන්ධව සමාගමට එරෙහිව කම්කරු විනිශ්චය සභාවෙහි නඩු පවරා ඇත.
අනාගතයේදී පිටතට ගලා යාම සිදු විය හැකි මුදල් ප්‍රමාණය පිළිබඳ විශ්වාසදායක ඇස්තමේන්තුවක් කළ නොහැකි නිසාත්, ප්‍රතිඵලය නොදන්නා නිසාත්, ඉහත හදිසි අවස්ථා සම්බන්ධයෙන් ගිණුම්වල ප්‍රතිපාදන සපයා නොතිබුණි.

02 M/S Super Neat Technology (Pvt) Ltd සමාගම විසින් අඹේවෙල කිරි කම්හල වෙත UPS (අඛණ්ඩ බල සැපයුම) ප්‍රසම්පාදනය සඳහා 2018 වසරේදී රුපියල් 94,906,281.25ක් සඳහා ගිවිසුම්ගත වී ඇත. කෙසේ වෙතත්, පසුව 2019 දී, සැපයුම්කරුට ගෙවීමට මුදල් ප්‍රමාණවත් නොවීම සහ ප්‍රසම්පාදන ක්‍රියාවලියේ සටහන් වූ දෝෂ කිහිපයක් මත ටෙන්ඩරය අවලංගු කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර ඇත.

ඉහත කරුණු අනුගමනය කරමින්, සැපයුම්කරු වන M/S Super Neat Technology (Pvt) Ltd විසින් ටෙන්ඩරය අවලංගු කිරීම හේතුවෙන් තමන්ට සිදුවූ පාඩුව අයකර ගැනීම සඳහා 2019 වසරේ දී Milco (Pvt) Ltd සමාගමට එරෙහිව නඩුවක් ගොනු කළේ ය. වාර්තා කරන දිනය වන විට නීතිමය කටයුතු සිදු වෙමින් පවතින අතර විශ්වාසනීය ඇස්තමේන්තුවක් කළ නොහැකි බැවින් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සපයා නොමැත.

27.2 අසම්භාව්‍ය වත්කම්

වාර්තාකරණ දිනයට අසම්භාව්‍ය වත්කම් නොතිබුණි.

28 ආශ්‍රිත පාර්ශව අනාවරණ

28.1 සාරානුකූල කොටස් හිමිකම සහ අවසාන අයිතිය

සමාගම සම්පූර්ණ වශයෙන් රජයට අයත් සමාගමේ කොටස් 100% ක් දරන ව්‍යාපාරයක් වේ.

28.2 ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් පිළිබඳ තොරතුරු

ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් යනු සමාගමේ ඕනෑම අධ්‍යක්ෂවරයකු (විධායක හෝ වෙනත් ආකාරයකින්) ඇතුළුව සෘජුව හෝ වක්‍රව සමාගමේ ක්‍රියාකාරකම් සැලසුම් කිරීම, මෙහෙයවීම සහ පාලනය කිරීම සඳහා බලය සහ වගකීම ඇති පුද්ගලයින් ය.

වර්ෂය තුළ අධ්‍යක්ෂවරුන්ගේ සහ ප්‍රධාන කළමනාකරණයේ අනෙකුත් සාමාජිකයන්ගේ වේතනය පහත පරිදි වේ.

	2020දෙසැම්බර් සේ.නී.හා.අ. 2020	2019 සේ.නී.හා.අ. 2019
කෙටි කාලීන සේවක ප්‍රතිලාභ	2,527,657	3,957,907

28.3 ආශ්‍රිත පාර්ශව ගනුදෙනු

සමාගමේ අධ්‍යක්ෂවරුන් විසින් කරන ලද ප්‍රකාශයට අනුව, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව අනාවරණය කළ යුතු කාලය තුළ සැලකිය යුතු අදාළ පාර්ශවීය ගනුදෙනු කිසිවක් සිදු නොවීය.

29 සන්සන්දනාත්මක තොරතුරු

වත්මන් වර්ෂය සඳහා ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවන්ට අනුකූලව අවශ්‍ය අවස්ථාවල සංසන්දනාත්මක සංඛ්‍යා නැවත වර්ගීකරණය කර ඇත.

30 ඇප ලෙස ඔඩපණය කරන ලද වත්කම්

පහත වත්කම් ණයවලට ආරක්ෂණයන් ලෙස ඔඩපන කර ඇත

වගකීමේ ස්වභාවය බැංකුව	ලබාදුන් ණය/ පහසුකම රු:	ශේෂය හිඟ 31.12.2020 දිනට රු:	ශේෂය හිඟ 31.12.2019 දිනට රු:	නැවත ගෙවීම	ඔඩපනය කළ වත්කම්
ලංකා බැංකුවෙන් ප්‍රදානය කළ ණය මුදල	700,000,000	46,666,480	11,666,500	රු.5,833,335/- ක සමාන මාසික වාරික 120 කින් ගෙවිය යුතුය	ලංකා බැංකුවේ ඇ.ඩො 3,150,040.69 ක ස්ථාවර තැන්පතුව.
ලංකා බැංකුවෙන් ප්‍රදානය කළ ණය මුදල	120,000,000	15,000,000	45,000,000	රු.2,500,000/- ක සමාන මාසික වාරික 48 කින් ගෙවිය යුතුය	ලංකා බැංකුවේ ඇ.ඩො 3,150,040.69 ක ස්ථාවර තැන්පතුව.
ලංකා බැංකුවෙන් ප්‍රදානය කළ ණය මුදල	100,000,000	49,999,984	77,083,326	රු.2,083,334/-ක සමාන මාසික වාරික 48 කින් ගෙවිය යුතුය	ලංකා බැංකුවේ ඇ.ඩො 3,150,040.69 ක ස්ථාවර තැන්පතුව.
ලංකා බැංකුව විසින් සැපයූ බැංකු අයිරාව	600,000,000	312,267,147	629,192,300	ඉල්ලුම මත	වංචල වෙළෙඳ දේපළ තොග සහ, බස්නාහිර පලාතේ කොළඹ අංක 45, නාවල පාර, නාරාහේන්පිට ගබඩා කර ඇති ඇසුරුම් ද්‍රව්‍ය තොග සහ නිමි භාණ්ඩ හා වෙනත් වංචල දේපළ ඇතුළු බැඳීම් සහ සමාගමේ වර්තමාන හෝ අනාගත පොත් ණය.
මහජන බැංකුව විසින් සැපයූ බැංකු අයිරාව	189,500,000	177,426,763	187,669,547	ඉල්ලුම මත	රු.210,000,000 ක ස්ථාවර තැන්පතුව
ලංකා බැංකුව විසින් සපයන ලද පසුදාතම් වෙක්පත් වට්ටම් පහසුකම	75,000,000	4,500	58,983,395	ඉල්ලුම මත	වෙළෙඳාම හා සම්බන්ධ පසුදාතම් වෙක්පත් රඳවාගැනීම
පෑන් ඒෂියා බැංකුව විසින් සපයන ලද පසුදාතම් වෙක්පත් වට්ටම් පහසුකම	300,000,000	18,984,512	58,983,395	ඉල්ලුම මත	වෙළෙඳාම හා සම්බන්ධ පසුදාතම් වෙක්පත් රඳවාගැනීම
පෑන් ඒෂියා බැංකුව විසින් සැපයූ බැංකු අයිරාව	100,000,000	-	100,000,000	ඉල්ලුම මත	රු.50,000,000 ක් වන ස්ථාවර තැන්පතුව සහ පසු දාතම් කළ වෙළෙඳ වෙක්පත්

31 වාර්තාකරණ දිනයට පසු සිදුවීම්

පහත ඒවා හැර වාර්තාකරණ දිනය සහ මූල්‍ය ප්‍රකාශන නිකුත් කළ දිනය අතර මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් සිදුකිරීමට හෝ හෙළිදරව් කිරීමට අවශ්‍ය ද්‍රව්‍යමය සිදුවීම් සිදුව නොමැත.

කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් 2021.01.11 දිනැති අංක 21/0199/323/012 දරන "පොළොන්නරුව, අඹේවෙල සහ දිගන කිරි කර්මාන්තශාලා නවීකරණය" මැයෙන් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව 2021.02.08 දින අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

ඒ අනුව පහත අනුමැතීන් ලබාදෙන ලදී;

අ. මහා භාණ්ඩාගාරයේ කොටස් දායකත්වය ලෙස මිල්කෝ පුද්ගලික සමාගමට ණය දීම සඳහා ලබාගත් ණයකට පරිවර්තනය කිරීම.

ආ. 2020.12.31 වන විට හිඟ ණය පොළිය කපා හැරීම.

32 මූල්‍ය උපකරණවල සාධාරණ අගය

32.1 ක්‍රමක්ෂය කළ පිරිවැයට රැගෙන ආ මූල්‍ය උපකරණවල සාධාරණ අගය

පහත දැක්වෙන්නේ මූල්‍ය ප්‍රකාශනවල සාධාරණ අගයට නොගෙනා සමාගමේ මූල්‍ය උපකරණවල ධාරක අගයන් සහ සාධාරණ අගයන් පන්තිය අනුව සැසඳීමකි. මෙම වගුවට මූල්‍ය නොවන වත්කම් සහ වගකීම්වල සාධාරණ අගය ඇතුළත් නොවේ.

	ඉදිරියට ගෙන ගිය මුදල රුපියල්	සාධාරණ අගය රුපියල්
මූල්‍ය වත්කම්		
මූල්‍ය උපකරණ -ක්‍රමක්ෂය වූ පිරිවැය	811,519,828	811,519,828
වෙළෙඳ සහ වෙනත් ලැබිය යුතු දෑ	1,075,106,153	1,075,106,153
මුදල් හා මුදල් සමාන දෑ	17,228,129	17,228,129
මුළු මූල්‍ය වත්කම්	1,903,854,110	1,903,854,110
මූල්‍ය වගකීම්		
වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු දෑ	775,475,909	775,475,909
පොලී දරන ණය සහ ණය ගැනුම්	111,666,508	111,666,508
ශ්‍රී ලංකා මහා භාණ්ඩාගාරයට ගෙවිය යුතු	18,414,496,875	18,414,496,875
බැංකු අයිරාව	673,628,809	673,628,809
මුළු මූල්‍ය බැරකම්	19,975,268,100	19,975,268,100

32.1 මූල්‍ය වත්කම්වල සාධාරණ අගය සහ සාධාරණ අගයට නොගෙනා වගකීම්

මූල්‍ය ප්‍රකාශනවල සාධාරණ වටිනාකමකින් සටහන් නොවන මූල්‍ය උපකරණ සඳහා සාධාරණ අගයන් තීරණය කිරීම සඳහා භාවිතා කරන ක්‍රමවේදයන් සහ උපකල්පනයන් පහත දැක්වේ.

සාධාරණ අගය ඉදිරියට ගෙන යන අගයට සන්නිකර්ෂණය කළ වත්කම්

කෙටි කාලීනව කල්පිරී ඇති මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් සම්බන්ධව ඉදිරියට ගෙන යන මුදල ඒවායේ සාධාරණ අගයට සන්නිකර්ෂණය වී ඇති බවට උපකල්පනය කරනු ලැබේ. මෙම උපකල්පනය, නිශ්චිත කල්පිරීම් කාලයක් රහිත ඉල්ලුම් තැන්පතු සහ ඇමතුම් තැන්පතුවලටද අදාළ විය හැකිය.

33 මූල්‍ය අවදානම් කළමනාකරණ අරමුණු සහ ප්‍රතිපත්ති

33.1 හැඳින්වීම

අවදානම්, සමාගමේ ක්‍රියාකාරකම් වලට ආවේණික ලක්ෂණයක් වන නමුත් අවදානම් සීමාවන් සහ වෙනත් පාලනයන්ට යටත්ව අඛණ්ඩව හඳුනා ගැනීම, මැනීම සහ අධීක්ෂණය කිරීමේ ක්‍රියාවලියක් හරහා කළමනාකරණය වේ. අවදානම් කළමනාකරණයේ මෙම ක්‍රියාවලිය සමාගමේ අඛණ්ඩ ලාභදායිතාවයට අතිශයින් වැදගත් වන අතර සමාගම තුළ සිටින සෑම පුද්ගලයෙකුම ඔහුගේ හෝ ඇයගේ වගකීම්වලට අදාළ අවදානම් නිරාවරණ සඳහා වගකිව යුතුය.

අවදානම් කළමනාකරණ රාමුව

සමාගමේ අවදානම් කළමනාකරණ රාමුව ස්ථාපිත කිරීම සහ අධීක්ෂණය සඳහා සමස්ත වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ. මණ්ඩලය සිය බලය, සමාගමේ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති සංවර්ධනය කිරීම සහ අධීක්ෂණය කිරීම සඳහා වගකියනු ලබන ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ට පවරා ඇත.

ප්‍රධාන මූල්‍ය උපකරණ

සමාගම විසින් භාවිතා කරන මූල්‍ය උපකරණ අවදානම පැන නගින ප්‍රධාන මූල්‍ය උපකරණ පහත පරිදි වේ:

උපකරණ

-වෙළෙඳ ලැබිය යුතු දෑ

-මුදල් සහ මුදල් සමාන දෑ

-වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු දෑ

-බැංකු අයිරා

-බැංකු ණය

33.2 ණය අවදානම - පැහැර හැරීමේ අවදානම

ණය අවදානම යනු ප්‍රතිවිරුද්ධ පාර්ශ්වයට එහි බැඳීම් සැපිරීමට ඇති හැකියාවේ අවිනිශ්චිතභාවය නිසා ඇතිවන අවදානමයි. ණයගන්නා හට ණය නැවත ගෙවීමට නොහැකි වීම හෝ ගිවිසුම්ගත බැඳීමක් සැපිරීමට නොහැකි වීම මගින් ඇතිවිය හැකි මූලධන පාඩු අවදානම හෝ මූල්‍ය ප්‍රදාන පාඩුව.

33.3 ද්‍රවශීලතා අවදානම සහ අරමුදල් කළමනාකරණය

ද්‍රවශීලතා අවදානම යන්නෙන් අදහස් කරන්නේ සමාගමට එහි ගෙවීම් බැඳීම් සපුරාලීමට ප්‍රමාණවත් මුදල් නොමැති වීමයි. මෙය මූලික වශයෙන් පැන නගින්නේ සමාගමේ වත්කම් හා වගකීම් වල කල්පිරීමේ පැතිකඩෙහි නොගැලපීම් හේතුවෙනි. සමාගමේ මූල්‍ය කැපවීම සපුරාලීමට සහ වර්ධනය වන ව්‍යාපාර පරිමාවන්හි අතිරේක අරමුදල් අවශ්‍යතා සපුරාලීමට ප්‍රමාණවත් ද්‍රවශීලතාවයක් තබාගැනීම ඉතා වැදගත් වේ.

සමාගමේ ද්‍රවශීලතා අවදානම් කළමනාකරණයේ මූලික පරමාර්ථය වන්නේ වෙළඳපල චක්‍ර පුරාම තම ව්‍යාපාර සඳහා ප්‍රමාණවත් අරමුදල් සැපයීම සහතික කිරීමයි.

33.3.1 ඉතිරිව ඇති කොන්ත්‍රාත් කල් පිරීම්වලදී මූල්‍ය වත්කම් හා වගකීම් විශ්ලේෂණය කිරීම

සමාගම	ඉල්ලුම මත රුපියල්	මාස 2 කට අඩු රුපියල්	මාස 2 සිට 12 දක්වා රුපියල්	අවුරුදු 1 සිට 5 දක්වා රුපියල්	අවුරුදු 5 ට වැඩි රුපියල්	එකතුව රුපියල්
කල්පිරීම දක්වා රඳවාගත් මූල්‍ය උපකරණ	-	-	-	811,519,828	-	811,519,828
වෙළෙඳ සහ වෙනත් ලැබිය යුතු දෑ	-	1,075,106,153	-	-	-	1,075,106,153
මුදල් හා මුදල් සමාන දෑ	17,228,129	-	-	-	-	17,228,129
මුළු මූල්‍ය වත්කම්	17,228,129	1,075,106,153	-	811,519,828	-	1,903,854,110
මූල්‍ය වගකීම්						
වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු දෑ	-	775,475,909	-	-	-	775,475,909
පොලී දරන ණය සහ ණය ගැනුම්	-	14,444,415	72,222,073	25,000,020	-	111,666,508
	-	-	-	-	18,414,496,875	18,414,496,875
ශ්‍රී ලංකා මහා භාණ්ඩාගාරයට ගෙවිය යුතු දෑ						
බැංකු අයිරාව	673,628,809	-	-	-	-	673,628,809
මුළු මූල්‍ය බැරකම්	673,628,809	789,920,323	72,222,073	25,000,020	18,414,496,875	19,975,268,100
මුළු ශුද්ධ මූල්‍ය වත්කම්/(වගකීම්)	(656,400,681)	285,185,830	(72,222,073)	786,519,808	(18,414,496,875)	(18,071,413,991)

33.4 පොලී අනුපාත අවදානම

ණය පහසුකම් ලබා දීම, තැන්පතු භාර ගැනීම සහ ණය උපකරණ නිකුත් කිරීම වැනි මූලික ව්‍යාපාරික කටයුතුවලින් පැන නගින අනාගත පොලී අනුපාතයේ අහිතකර හා අනපේක්ෂිත වලනයන් හේතුවෙන් පොලී අනුපාත අවදානම සමාගමේ වෙළඳපල අවදානම් නිරාවරණයේ ප්‍රධාන අංගයකි,

වාර්තා කරන දිනය වන විට සමාගමට පොලී අනුපාත සංවේදී මූල්‍ය වත්කම් හෝ මූල්‍ය වගකීම් නොමැත.

	සටහන	2020 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා රුපියල්	2019 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා රුපියල්
ආදායම		11,104,710,548	10,313,820,273
විකුණුම් පිරිවැය	I	(9,703,560,044)	(9,917,539,530)
දළ ලාභය		1,401,150,505	396,280,743
වෙනත් මෙහෙයුම් ආදායම	II	33,475,777	29,709,723
		1,434,626,282	425,990,466
පරිපාලන වියදම්	III	(798,515,146)	(688,427,005)
බෙදාහැරීමේ වියදම්	IV	(336,890,593)	(399,206,715)
වෙනත් වියදම්	V	(6,696,851)	(55,158,791)
මෙහෙයුම්වලින් ලාභය/ (අලාභය)		292,523,692	(716,802,045)
මූල්‍ය ආදායම	VI	52,972,581	49,926,845
මූල්‍ය වියදම්	VII	(119,739,982)	(195,839,348)
බදුවලට පෙර ශුද්ධ ලාභය/ (අලාභය)		225,756,290	(862,714,548)
ආදායම් බදු වියදම්		-	-
බදුවලින් පසු වසරේ ශුද්ධ ලාභය/(අලාභය)		225,756,290	(862,714,548)

		2020 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා රුපියල්	2019 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා රුපියල්
I	**විකුණුම් පිරිවැය**		
	අමු කිරි මිලදී ගැනීමේ පිරිවැය	5,297,736,481	4,629,414,135
	ශීතකරණ පිරිවැය	412,909,018	425,531,416
	සංවර්ධන පිරිවැය	262,476,767	260,485,819
	බව්සර පිරිවැය	245,612,988	247,967,584
	අමුද්‍රව්‍ය මත ශුද්ධ තොග ගැලපුම	502,902	488,424
	අනෙකුත් අමුද්‍රව්‍ය සඳහා වන පිරිවැය	1,034,614,747	1,099,619,705
	අමුද්‍රව්‍ය සඳහා වන මුළු පිරිවැය	7,253,852,902	6,663,507,082
	ඇසුරුම් ද්‍රව්‍ය පිරිවැය	952,755,788	1,313,757,788
	සැකසුම් සහ ඇසුරුම් ශ්‍රමය සඳහා වන පිරිවැය	480,708,484	552,336,471
	ප්‍රාථමික පිරිවැය	8,687,317,174	8,529,601,341
	බලශක්ති පිරිවැය		
	උෂ්මක තෙල්	344,487,550	329,252,004
	විදුලි	147,063,404	141,676,555
	ඩීසල්	45,548,155	55,173,113
	ජලය	20,858,618	22,103,605
	වෙනත් බලශක්ති පිරිවැය	79,523	92,153
	මුළු බලශක්ති පිරිවැය	558,037,251	548,297,430
	වෙනත් පරිභෝජන ද්‍රව්‍ය		
	විද්‍යාගාර රසායනික	10,396,662	10,615,442
	ක්ෂාලක සහ පිරිසිදුකිරීම් ද්‍රව්‍ය	53,457,091	68,056,539
	කම්හල් කාර්ය මණ්ඩලයේ වේතන සහ සුබසාධනය	421,221,031	355,224,055
	ආන්තික පිරිවැය	9,730,429,209	9,511,794,807
	කම්කරු ආශ්‍රිත පොදු කාර්යාල පිරිවැය		
	ක්ෂය වීම් සහ ක්‍රමක්ෂය	463,178,689	459,788,527
	යන්ත්‍රෝපකරණ අලුත්වැඩියාව සහ නඩත්තුව	102,497,181	194,149,607
	ගොඩනැගිලි නඩත්තු කටයුතු සිදු කිරීම	43,835,774	9,643,643
	ප්‍රවාහන	4,352,162	3,591,535
	රක්ෂණය	20,465,782	30,730,303
	මුළු කම්කරු ආශ්‍රිත පොදු කාර්යාල පිරිවැය	634,329,589	697,903,615
	මුළු නිෂ්පාදන පිරිවැය	10,364,758,798	10,209,698,421
	ශුද්ධ තොග/නිමි භාණ්ඩවල හුවමාරු ගැලපුම්	(552,236,491)	(224,638,837)
	ආයුගණක උපකල්පන තුළ වෙනස්කම් සඳහා ගැලපුම්	(109,295,614)	(67,714,812)
	උපලබ්ධි නොවූ ලාභ ගැලපුම	333,351	194,758
		9,703,560,044	9,917,539,530

		2020 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා රුපියල්	2019 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා රුපියල්
II.	**වෙනත් ආදායම්**		
	අගරු වූ වෙක්පත් මත අධිභාර	2,363,316	6,415,722
	ආපසු නොගෙවන තැන්පතු	24,000	42,500
	ආපසු නොගෙවන ටෙන්ඩර් තැන්පතු	163,500	513,000
	විලම්භිත ආදායම	8,998,110	12,632,398
	සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම	3,248,000	3,572,000
	විවිධ ආදායම්	3,351,759	2,226,434
	හුවමාරු ලාභය	14,127,003	-
	දඩ සහ අධිභාර	434,922	1,159,556
	නිවාස කුලී	444,151	1,782,804
	සේවා කළ නොහැකි අයිතම අලෙවි කිරීම	292,648	579,231
	අපහරණ ලාභය	28,367	566,035
	ද්‍රව කිරි අලෙවි ආන්තිකය	-	220,042
		33,475,777	29,709,723
III.	**පුද්ගල වියදම්**		
	කාර්ය මණ්ඩල වැටුප්	253,748,355	229,043,057
	කාර්ය මණ්ඩල දීමනා	2,900,985	13,608,970
	සේවක අර්ථසාධක අරමුදලට දායක මුදල්	24,491,464	21,496,286
	සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට දායක මුදල්	6,017,764	5,360,949
	ප්‍රතිපාදන නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් - පාරිතෝෂික	54,799,645	40,298,106
	අතිකාල	15,522,679	13,037,938
	කාර්ය මණ්ඩල ප්‍රසාද දීමනා	12,809,704	13,952,543
	අනියම් වේතන	2,267,264	1,781,277
	අතිකාල	115,009	22,200
	සේ.අ.අ.	24,623	10,720
	සේ.භා.අ.	12,992	2,680
	දිරි දීමනා	2,941,500	1,220,359
	නිවාඩු ගෙවීම්	18,566,319	10,330,764
	ප්‍රවාහන දීමනා	3,759,069	3,853,696
	ඉන්ධන දීමනා	1,031,188	1,235,848
	කාර්ය මණ්ඩල පුහුණු	287,000	671,600
	වෛද්‍ය වියදම්	2,340,334	1,982,018
	මරණාධාර	220,000	280,000
	ත්‍යාග වවුචර් පත්	394,778	350,378
	කාර්ය මණ්ඩල සුබ සාධනය	25,866,278	13,497,107
	අතරමැදි දින දීමනා	345,632	359,010
	ක්ෂේත්‍ර දීමනා	493,400	560,600
	නිල ඇඳුම	31,052	243,935
	දුරකථන දීමනා	111,542	123,500
		429,098,577	373,323,541

		2020 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා රුපියල්	2019 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා රුපියල්
III.I	**පරිපාලන හා ආයතන වියදම්**		
	අළුත්වැඩියා සහ නඩත්තු	40,786,024	38,610,720
	අධ්‍යක්ෂවරුන්ගේ වියදම්	2,527,657	6,518,158
	ගමන් වියදම්	5,236,336	9,923,389
	උද්‍යාන නඩත්තු	8,983,635	11,617,039
	බැංකු ගාස්තු	2,773,782	2,685,539
	බංගලා වියදම්	173,163	1,480,378
	තත්ව පාලන වියදම්	1,584,579	1,622,190
	ක්ෂය වීම් සහ ක්‍රමක්ෂය	26,930,175	29,342,782
	නීති ගාස්තු	2,945,018	4,982,320
	මුද්‍රණ සහ ලිපිද්‍රව්‍ය	7,670,210	12,495,734
	ආරක්ෂක ගාස්තු	53,952,408	54,222,339
	පළිබෝධ පාලන	141,108	556,800
	අනියම් වියදම්	243,667	1,011,907
	විදුලිය වියදම්	15,711,861	13,900,139
	ජල වියදම්	656,940	718,818
	කුලී සහ වරිපනම්	20,609,735	20,959,813
	මුද්දර වියදම්	98,902	16,826
	තැපැල් ගාස්තු වියදම්	294,608	338,883
	වෙළෙඳ දැන්වීම්	373,923	546,171
	පුවත්පත් සහ වාර ප්‍රකාශන	405,470	524,480
	වාහන බලපත්‍ර	356,290	359,693
	වාහන කුලියට ලබා ගැනීම.	2,382,817	3,484,858
	ගිණුම්කරණ සහ විගණන වියදම්	6,272,366	8,628,939
	උපදේශන ගාස්තු	4,493,185	5,656,123
	රක්ෂණය	25,686,932	28,002,155
	ඉන්ධන වියදම්	27,604,847	29,320,421
	DESMI ව්‍යාපෘති වියදම්	14,195,695	3,004,165
	දුරකථන වියදම්	3,887,447	5,480,713
	ESC - කපා හැරීම්	91,350,074	15,364,873
	වෙනත් වියදම්	-	94,511
	විනෝදාස්වාද වියදම්	1,015,405	1,066,002
	හුවමාරු පාඩුව	-	2,566,588
	පුණ්‍ය කටයුතු සහ ආධාර	72,310	-
		369,416,568	315,103,463
	මුළු පරිපාලන වියදම්	798,515,146	688,427,005

		2020 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා රුපියල්	2019 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා රුපියල්
IV.	**විකුණුම් සහ බෙදාහැරීම් වියදම්**		
	වෙළෙඳ ප්‍රචාරණ සහ අලෙවි ප්‍රවර්ධන	66,855,441	68,377,727
	ප්‍රවාහන වියදම්	91,043,224	115,743,779
	අලෙවි කොමිස් මුදල්	26,710,818	28,282,771
	ගබඩා ගාස්තු	279,128	8,948,457
	වාහන කුලියට ගැනීමේ ගාස්තු	22,781,892	40,137,026
	අලෙවිසැල් වියදම්	115,307,573	124,688,644
	මෝටර් වාහන අලුත්වැඩියාව හා නඩත්තුව	(42,523)	476,827
	බෝතල් සිසිල්කරණ අළුත්වැඩියාව සහ නඩත්තුව	114,811	63,266
	ඉන්ධන	274,065	731,999
	නිමි භාණ්ඩ නොමිලේ නිකුත් කිරීම සහ කපා හැරීම	13,566,165	11,756,219
		336,890,593	399,206,715
V.	**වෙනත් වියදම්**		
	කිරි මාරුකිරීමේ පාඩුව	1,259,755	-
	නිමි භාණ්ඩ තොග කපා හැරීම්	5,437,096	47,180,280
	අමුද්‍රව්‍ය සහ ඇසුරුම් ද්‍රව්‍ය තොග කපා හැරීම්	-	7,978,511
		6,696,851	55,158,791
VI.	**මූල්‍ය ආදායම**		
	ඉල්ලුම්/ස්ථාවර තැන්පතු මත පොළිය	14,760,152	19,930,044
	ස්ථාවර තැන්පතු මත පොළිය - විදේශ විනිමය (ඇඩෝ)	31,134,260	23,178,274
	ආපදා ණය පොළිය	6,857,181	6,453,526
	යතුරු පැදි ණය පොළිය	183,569	204,218
	විශේෂ ණය පොළිය	37,419	160,782
		52,972,581	49,926,845
VII.	**මූල්‍ය පිරිවැය**		
	බැංකු අයිරා මත පොළිය	105,510,572	152,362,290
	කල්බදු පොළිය	3,968,914	5,218,823
	දේපළ ණය පොළී	10,260,496	38,258,234
		119,739,982	195,839,348



ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE



සභාපති,

මිල්කෝ පුද්ගලික සමාගම.

මිල්කෝ පුද්ගලික සමාගමේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **මතය විෂයෙහි**

මිල්කෝ පෞද්ගලික සමාගමේ ("සමාගම") 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය වියාවනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

1.2. මතය ව්‍යාචනය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 01 හි 32 ඡේදය ප්‍රකාරව ප්‍රමිතයෙහි ඉඩ දී ඇති අවස්ථාවලදී හැර වත්කම්, වගකීම්, ආදායම් හා වියදම් ශේෂ හිලව් කර මූල්‍ය ප්‍රකාශනයන්හි ඉදිරිපත් නොකළ යුතුය. ප්‍රධාන කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන වල එකතුව රු.4,170,475ක් වූ වෙළඳ ණය හිමි හර ශේෂද වෙනත් ගෙවිය යුතු ශේෂ අයිතම් 04ක ඇතුළත් එකතුව රු.24,654,488 ක් වූ හර ශේෂයන්ද ජංගම වගකීම්වලට හිලව් කර දක්වා තිබුණි. තවද ප්‍රධාන කාර්යාලය, දිගන හා කොළඹ කිරි කර්මාන්ත ශාලාවල පිළිවෙලින් රු.20,697,294ක්, රු.33,350,997 ක් හා රු.1,567,550ක් වූ ණය ගැති ශේෂ සහ අත්තිකාරම් තැන්පතු හා පෙර ගෙවීම් යන ජංගම වත්කම් අයිතම් වල එකතුව රු.6,679,409ක වටිනාකම් බැර ශේෂ ලෙස දැක්වීම යන හේතු නිසා සමස්ථයක් ලෙස ජංගම වගකීම් හා ජංගමවත්කම් ශේෂ පිළිවෙලින් රු.28,824,963ක් හා රු.62,295,250 ක් ඌන ලෙස දක්වා තිබුණි.

(ආ) සමාගමේ කර්මාන්තශාලා 4 ක් සහ ගව ආහාර නිෂ්පාදන අංශය සඳහා ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති 8 හි 13 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල ඛණ්ඩ වාර්තාකරණය සිදුකළ යුතු වුවත් එසේ සිදුකර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති අංක 09 හි 5.5.15 ඡේද අනුව වෙළඳ ණයගැති ශේෂය වන රු.719,118,672 සඳහා පසුකාලීන මැනීම් සඳහා අපේක්ෂිත ණය අලාභ ක්‍රමය භාවිතා කළ යුතු වුවත් ඒ අනුව ණයගැති ශේෂය ගණනය කර නොතිබුණු අතර විගණණයට ඉදිරිපත් කරන ලද උපලේඛන අනුව එම ශේෂය රු.712,258,436 වූයෙන් රු.6,860,236 ක වෙනසක් විය. තව ද, වෙනත් ණයගැති ශේෂය වූ රු.46,400,866 සඳහා කාල විශ්ලේෂණයක් විගණනයට ඉදිරිපත් නොවූ බැවින් විෂය පථය සීමා විය.

(ඈ) සමාගම විසින් කිරි ආශ්‍රිත නිෂ්පාදිත වෙළඳපලට නිකුත්කරන ප්‍රධාන ආයතනයක් වීම, එම නිෂ්පාදන සඳහා විශාල ඉල්ලුමක් පැවතීම හා ආයතනය පුද්ගලික සමාගමක් ලෙස සංස්ථාපනය කර තිබීම යනාදී කරුණු නිසා ප්‍රමානාත්මක බදු වන තාවකාලික වෙනසක් හෝ බදු වන ලාභයක් ඉපයීමට හැකි බවට තහවුරු කිරීමට තරම් සාක්ෂි නොමැති බව මූල්‍ය ප්‍රකාශනයන්හි දක්වා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 12 හි 37 ඡේදය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවල විලම්භීත බදු වත්කම් හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි.

(ඉ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16 හි 50 හා 51 ඡේද අනුව භාවිතයට ගනු ලබන වත්කම්වල ජීවකාලය වාර්ෂිකව සමාලෝචනය කර ඵලදායී ජීවකාලයක් ඇස්තමේන්තු කර ගිණුම්වල ඇස්තමේන්තු වෙනසක් ලෙස ගිණුම්ගත කළ යුතු විය. එසේ වුවත් එකතුව රු.470,817,829 ක් වූ ස්ථාවර වත්කම් අයිතම් 6,562 ක් සම්පූර්ණයෙන් ක්ෂය වී තිබුණ ද 2013 වර්ෂයේ සිට 2020 දෙසැම්බර් 31 දක්වා භාවිතා කරමින් පවතින නමුත් ප්‍රමිතිය ප්‍රකාරව ඵලදායී ජීවකාලය සමාලෝචනය කර නොතිබුණි.

(ඊ) කර්මාන්තශාලා නවීකරණ ව්‍යාපෘතිය සඳහා සමාගම හා විදේශ සම්පත් දෙපාර්තමේන්තුව සමඟ ඇතිකරගෙන තිබූ ගිවිසුමේ 2.04 ඡේදය අනුව ව්‍යාපෘතිය සම්බන්ධ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් දරන සියලු වියදම් ,එනම් විනිමය විචලනය ද සමාගම විසින් දැරිය යුතු විය. ඒ අනුව ඉහත ව්‍යාපෘතියට අදාළව 2020 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ණය ශේෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 21 හි 23 ඡේදය ප්‍රකාරව වර්ෂය අවසානයේ විදේශ විනිමය අනුපාතයට අගය කර ගිණුම්ගත කළ යුතු විය. මේ අනුව 2013 සිට 2020 වර්ෂය දක්වා ගිණුම්ගත කළ යුතු විදේශ විනිමය අනුපාත විචලනයේ අහිතකර බලපෑම වන රු.1,467,885,383ක් ගිණුම්ගත කර නොමැති බැවින් එම වටිනාකමට සමාන ප්‍රමාණයකින් සමාගමේ දිගුකාලීන ණය වගකීම ඌනගණනය වී ඇති අතර සමාලෝචිත වර්ෂයේ විදේශ විනිමය විචලනය වූ රු.71,197,063ක් ගිණුම්වල ගලපා නොමැති බැවින් වර්ෂයේ ලාභය ද එම ප්‍රමාණයෙන් අධිගණනය වී තිබුණි.

(උ) භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ අංක TO/REV/05/33/6 හා 2023 සැප්තැම්බර් 27 දිනැති ලිපිය අනුව කර්මාන්තශාලා නවීකරණ ව්‍යාපෘතිය යටතේ 2020 දෙසැම්බර් 31 දිනට සමාගම විසින් නැවත භාණ්ඩාගාරය වෙත ප්‍රතිපූර්ණය නොකළ ණය ශේෂය රු.6,487,344,117ක් වුවත් සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල එම ශේෂය රු.9,148,369.878ක් වූයෙන් රු.1,658,903,964ක් වැඩියෙන් ගිණුම්ගතකර තිබුණි. ඊට අදාළ සමුච්චිත ගෙවිය යුතු පොලී මුදල රු.944,267,259ක් වුවද එය ගිණුම්ගත කර නොතිබූ බැවින් ගෙවිය යුතු පොලිය එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 23 හි 12 ඡේදය ප්‍රකාරව ඉදිකිරීම් කාලපරිච්ඡේදය තුලදී ප්‍රාග්ධනික කළ යුතු ණය පොලි ප්‍රමාණය අදාළ කෙරීගෙන යන වැඩ ගිණුමට සමාලෝචිත වර්ෂය දක්වා ප්‍රාග්ධනික කර නොතිබුණු බැවින් කෙරීගෙන යන වැඩ ද අඩුවෙන් දක්වා තිබුණි.

(ඌ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 36 හි 12 (ඊ) ඡේදය ප්‍රකාරව නිෂ්ක්‍රියව පවතින යන්ත්‍ර සූත්‍ර සඳහා හානිකරණ ගැලපීම් සිදුකළ යුතු වුවද මණ්ඩලය විසින් රු.15,445,587ක් පිරිවැය වූ දිගන කිරි කර්මාන්තශාලාව වෙත භාරදී ඇති 2014 වර්ෂයේ මිලදීගත් අයිස් ක්‍රීම් කෝන් පිරවුම් යන්ත්‍රයත්, කොළඹ කර්මාන්තශාලාවේ සවි කිරීම සඳහා 2011 ජනවාරි 20 දින කල්බදු පදනමට මිලදීගත් රු.104,177,779 ක් වටිනා යෝගට් මිශ්‍ර කිරීමේ යන්ත්‍රයත්, කොළඹ කිරි කර්මාන්තශාලාවේ මුළු වටිනාකම රු.2,275,000 ක් වන යන්ත්‍ර 4 ත් සම්බන්ධයෙන් හානිකර ගැලපීම් සිදුකර නොතිබුණි.

(එ) අඹේවෙල කිරි කර්මාන්තශාලාවේ අඛණ්ඩ බල සැපයුම් ඒකකය (UPS) මිලදී ගැනීමේ ඇණවුම පිරිනැමීමෙන් පසු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එය අවලංගු කිරීම නිසා සැපයුම්කරු විසින් රු.මිලියන 40ක අලාභ ඉල්ලා සමාගමට එරෙහිව නඩු පවරා තිබුණු අතර ඒ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 37 හි 86 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල සටහන් මඟින් හෙළිදරව් කර නොතිබුණි.

(ඒ) සමාගමේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සටහන් අංක 02 අනුව සමාලෝචිත වර්ෂයේ ක්ෂය ප්‍රමාණය ලෙස රු.535,201,255ක් දක්වා තිබූ නමුත් වර්ෂයේ ක්ෂය ලෙස මූල්‍ය ප්‍රකාශනයේ එකතුව

(ඒ) සමාගමේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සටහන් අංක 02 අනුව සමාලෝචිත වර්ෂයේ ක්ෂය ප්‍රමාණය ලෙස රු.535,201,255ක් දක්වා තිබූ නමුත් වර්ෂයේ ක්ෂය ලෙස මූල්‍ය ප්‍රකාශනයේ එකතුව

රු.529,445,941 දක්වා තිබීම හේතුවෙන් වර්ෂයේ ක්ෂය සටහන් කිරීමේදී රු.5,755,314 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඔ) සමාගමේ කොළඹ, අඹේවෙල, දිගන හා පොළොන්නරුව යන කිරි කර්මාන්තශාලා , පොල්ගහවෙල ගව ආහාර නිෂ්පාදන ඒකකය හා ප්‍රධාන කාර්යාලය යන අංශ 06 හි එක් එක් අවසන් මූල්‍ය ප්‍රකාශනවල ශේෂ පත්‍රයන් වෙන වෙනම සැලකුවිට දේපළ, පිරියත හා උපකරණවල 2020 දෙසැම්බර් 31 දිනට සමුච්චිත ක්ෂය වටිනාකම රු3,720,476,766ක් වූ නමුත් සමාගමේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ සටහන් අංක 02 අනුව එය රු. 3,724,190,410 ක් වූ බැවින් රු. 3,713,644 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඕ) සමාගමේ දේපළ, පිරියත හා උපකරණ සම්බන්ධ ප්‍රතිපත්තිය අනුව ගොඩනැගිලිවල ඵලදායී ජීව කාලය අවුරුදු 20 සිට 25 දක්වාත් පිරියත හා උපකරණවල ඵලදායී ජීව කාලය අවුරුදු 04 සිට 30 දක්වාත් වශයෙන් පරාසයක දක්වා තිබීම හේතුවෙන් ආර්ථික ඵලදායී ජීව කාලය නිෂ්චිතව හඳුනාගත නොහැකි විය. තවද සමාගමේ සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් අංක 1.3.1.C හි අනුව ගෘහ භාණ්ඩ හා සවිකිරීම්, විද්‍යාගාර උපකරණ, මෝටර් වාහන, යතුරු හා උපකරණ, කාර්යාල උපකරණ, පරිගණක හා බෝතල් ශීතකරණ යන ස්ථාවර වත්කම් වල ක්ෂය කිරීමේ කාලය පෙර වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී වෙනස් කර තිබූ අතර එම වෙනස්කිරීම් පිළිබඳ මූල්‍ය ප්‍රකාශනයේ අවශ්‍ය හෙළිදරව් කිරීම් කර නොතිබුණි. තවද ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය හා හේතුව ද විගණනයට ඉදිරිපත් නොවිය.

(ක) සමාගමේ 2020 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එක් එක් කර්මාන්තශාලා වල අවසන් මූල්‍ය ප්‍රකාශනවල ශේෂ පත්‍ර අනුව වෙන වෙනම සැලකුවිට දේපළ, පිරියත හා උපකරණයන්හි පිරිවැය රු. 9,351,000,903 ක් වූ නමුත් සමාගමේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දේපළ, පිරියත හා උපකරණ සටහන අනුව පිරිවැය රු.9,354,200,784 ක් ලෙස දක්වා තිබූ හෙයින් පිරිවැයෙහි රු. 3,199,881 ක වෙනසක් නිරීක්ෂණය වී තිබුණි

(කා) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයේ රු. 5,630,010,374 ක දේපළ, පිරියත හා උපකරණ ශුද්ධ ශේෂයක් පෙන්නුම් කළ ද, දේපළ, පිරියත හා උපකරණ සම්බන්ධයෙන් භෞතික සත්‍යාපනයක් සමාගම විසින් සිදුකර නොතිබුණි. එසේම ප්‍රධාන කාර්යාලය සහ පොළොන්නරුව කිරි කර්මාන්ත ශාලාව හැර අනෙකුත් කර්මාන්තශාලා සඳහා නිසි පරිදි නඩත්තු කරන ලද ස්ථාවර වත්කම් ලේඛන ද සමාගම විසින් පවත්වා නොතිබූ බැවින් ස්ථාවර වත්කම්වල පිරිවැය, පැවැත්ම, අයිතිය, ක්ෂය ගණනය කිරීම්වල නිවැරදිතාවය, ඉවත් කරන ලද ස්ථාවර වත්කම්වල පිරිවැය, ක්ෂය සහ වර්ෂයේ එකතුකිරීම් යනාදියෙහි නිවැරදිතාවය විගණනයේදී පරීක්ෂා කිරීමට නොහැකි විය.

(කැ) සමාගමේ ඒකාබද්ධ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම නොවන වත්කම් යටතේ සමාලෝචිත වර්ෂයේ කෙරීගෙන යන වැඩසටහන් අංක 4 යටතේ අඹේවෙල කිරි කර්මාන්තශාලාවේ ඉදිකිරීම් සඳහා සමාලෝචිත වර්ෂයේ රු.3,197,074 ක් වියදම් කර තිබුණ ද එම පිරිවැය අඹේවල කිරි කර්මාන්ත ශාලාවේ මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා නොතිබුණි.

(කෑ) බඩල්ගම නව කිරි කර්මාන්තශාලාවේ ඉදිකිරීම් සඳහා සමාලෝචිත වර්ෂය තුළදී යන්ත්‍ර උපකරණ අමතර කොටස් ගෙන්වීම් වෙනුවෙන් අවස්ථා දෙකකදී සමස්ත වියදමින් සියයට 60 ක ප්‍රතිශතයක් ලෙස යුරෝ 279,206.99 ක් හෙවත් රු.56,446,190 ක් හා මූලික අත්තිකාරමින් අඩුකිරීම් ලෙස සියයට 30 ක් ප්‍රතිශතය ලෙස යුරෝ 139,603.50 ක් හෙවත් රු. 28,223,096 ක් වශයෙන් හා එම වියදම් සඳහා වූ රඳවාගැනීම් සියයට 10 ක ප්‍රතිශතයක් ලෙස යුරෝ 46,534.50 ක් හෙවත් රු.9,407,698 ක් වශයෙන් සමස්ථ එකතුව ලෙස යුරෝ 465,344.99 ක් හෙවත් රු. 94,076,984 ක වටිනාකමට උපකරණ ගෙන්වා තිබුණි. එසේ වුවද සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ සටහන් අංක 04 හි කෙරීගෙන යන වැඩ තුළ වූ බඩල්ගම කර්මාන්තශාලාවේ ඉදිකිරීම් යටතේ එම සමස්ත වියදම කෙරීගෙන යන වැඩ ගිණුමට මාරුකර නොතිබූ බැවින් කෙරීගෙන යන වැඩ සහ දිගුකාලීන ණය රු. 94,076,984 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(කි) සමාලෝචිත වර්ෂයට පෙර වර්ෂයේ ආරම්භයේ සිටම කෙරීගෙන යන වැඩ ශේෂයන් ලෙස කර්මාන්තශාලාවල ඉදිකිරීම් හා යන්ත්‍ර සඳහා ගෙවන ලද එකතුව රු. 827,754,229 ක ශේෂයන් 5ක් ඇතුළත්ව ඇති අතර සමාලෝචිත වර්ෂය තුළදී ඒ වෙනුවෙන් කිසිදු වියදමක් හෝ ගෙවා නොතිබුණි. වර්ෂ අවසාන වන විටත් එම ශේෂයන් ප්‍රාග්ධනිත කිරීමට හෝ කටයුතු කර නොතිබුණු අතර මෙම යන්ත්‍ර සහ ඉදිකිරීම් ණය පදනමකින් නවීකරණ කටයුතු ඉටු කරනු ලබන බැවින් අරමුණුගත මෙහෙයුම් කටයුතු වර්ෂ 4 ක කාලයක සිට ඉටු කිරීමට නොහැකි වී තිබූ බැවින් ලබා ගන්නා ලද ණය මුදල රජයට වැය බරක් පමණක් වී තිබුණි.

(කී) සමාගමේ ඩොලර් තැන්පතුව සමාලෝචිත වර්ෂයේ ජූලි 06 දිනට කල් පිරෙන අතර එදිනට මහ බැංකු විනිමය හුවමාරු අනුපාත අනුව පොලී ආදායම රු.26,456,514 ක් විය. සමාලෝචිත වර්ෂයේ දින 188 ක් සඳහා ලද පොලී ආදායම රු. 13,589,685 ක් හා සමාලෝචිත වර්ෂයේ ඉතිරි දින 178 ක් සඳහා ලැබිය යුතු පොලී ආදායම ලෙස රු. 8,134,012ක් විය. මේ අනුව වර්ෂයට අදාළ මුළු පොලී ආදායම රු. 21,723,697 ක් වුව ද මූල්‍ය ප්‍රකාශන අනුව ඩොලර් තැන්පතු පොලිය රු. 31,134,260 ක් වූ බැවින් රු. 9,410,563 ක් වැඩියෙන් ආදායම ගිණුම්ගත කර තිබුණි. ලැබිය යුතු පොලී ආදායම ලෙස රු.17,340,571 ක් ගිණුම්ගත කර තිබූ බැවින් ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොලී ආදායම රු.9,206,559 කින් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

(කු) සමාලෝචිත වර්ෂය තුළ විකුණුම් පිරිවැයෙහි ඇතුළත් අමු කිරි මිලදී ගැනීම් පිරිවැය, ඇසුරුම් ද්‍රව්‍ය පිරිවැය, යන්ත්‍ර සූත්‍ර හා ගොඩනැගිලි අළුත්වැඩියා පිරිවැය හා රක්ෂණ පිරිවැයවල මූල්‍ය ප්‍රකාශනයන්හි එකතු වටිනාකම 6,417,291,006 වූ අතර කර්මාන්තශාලා ගිණුම් පරීක්ෂා කිරීමේදී

එම වටිනාකම 6,422,674,358 ක් වුයෙන් රු.5,383,352 ක වෙනසක් පැවතුණි. තවද ඉකුත් වර්ෂය සමඟ එම වටිනාකම් සැසඳීමේදී සියයට 14 සිට සියයට 354ක් තරම් වූ සැලකිය යුතු විචලනයක් පෙන්නුම් කර තිබුණි.

(කූ) වෙළෙඳ හා අනෙකුත් ගෙවිය යුතු උපලේඛනයේ ප්‍රධාන කාර්යාලය යටතේ දක්වා ඇති වෙළෙඳ ණයහිමි ශුද්ධ ශේෂය රු. 260,618,242 ක් වුව ද ප්‍රධාන කාර්යාලයේ ණයහිමි ශේෂ ලැයිස්තු අනුව ශුද්ධ ශේෂ එකතුව රු.244,950,678 ක් වූ බැවින් රු.15,667,564 ක වෙනසක් නිරීක්ෂණය විය.

(කෙ) අනෙකුත් ගෙවිය යුතු ශේෂයට අදාළව ඉදිරිපත් කර තිබූ පරිගණක පිටපත් අනුව පොළොන්නරුව කිරි කර්මාන්තශාලාවේ ශේෂයට රු.2,180,689 ශේෂයක් ඇතුළත්ව තිබුණ ද පොළොන්නරුව කිරි කර්මාන්තශාලාවේ මූල්‍ය ප්‍රකාශන තුළ එවැනි ශේෂයක් නොවීය.

(කේ) සමාගමේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වෙළෙඳ හා අනෙකුත් ගෙවිය යුතු ශේෂ සඳහා පොළොන්නරුව කර්මාන්තශාලාවේ රු.36,288,829ක ශේෂය සඳහාත්, අඹේවෙල කර්මාන්තශාලාවේ රු.19,423,807 ක ශේෂය සඳහාත් සහ දිගන කර්මාන්තශාලාවේ රු. 18,535,923 ක ශේෂය සඳහාත් ණයහිමි ශේෂ ලැයිස්තුවක් හා ණයහිමි කාල විශ්ලේෂණයක් විගණනයට ඉදිරිපත් නොවුණි.

(කෝ) බඩල්ගම නව කිරි කර්මාන්තශාලාවේ ඉදිකිරීම් හා යන්ත්‍ර උපකරණ ගෙන්වීම්වලට අදාළව වර්ෂ අවසාන වන විට මූලික අත්තිකාරම්න් යුරෝ 486,007.88 ක් ආවරණය කර ගැනීමට ඉතිරිව තිබූ අතර වර්ෂ අවසාන විදේශ විනිමය හුවමාරු ශේෂය වූ 225.54 ක (යුරෝ 1= රු.225.54) මත ගණනය කළ මුදල රු.109,614,217 ක් වුව ද සමාලෝචිත වර්ෂ ආරම්භක ශේෂය වූ රු.139,152,682 ක ශේෂයම වර්ෂ අවසාන ශේෂය ලෙස ගිණුම්වල පෙන්වා ඇති හෙයින් රු.29,538,465 ක් දිගුකාලීන අත්තිකාරම් අධිගණනය වී තිබුණි.

(කෝ) බැංකු ශේෂ තුළ මුදල් හා මුදල් සමාන දෑ යටතට නොගැනෙන හදුනා නොගත් එකතුව රු.253,328ක් වූ ශේෂ 3ක් 2020 දෙසැම්බර් 31 දින වන විටත් නිරවුල් කර නොතිබුණි.

(ග) විගණනයට ඉදිරිපත් කරන ලද උපලේඛනය අනුව ප්‍රධාන කාර්යාලයේ පෙර ගෙවීම් ශේෂය වූ රු.18,472,541 තුළ වසර 5 ඉක්මවූ එකතුව රු.12,881,934ක් වූ ශේෂය 2020 දෙසැම්බර් 31 දින වන විටත් නිරවුල් වී නොතිබූ අතර එම මුළු ශේෂය තුළ රු.307,361ක් වූ බැර ශේෂ ද විය. තවද උපලේඛනය අනුව ශේෂය රු.18,472,541ක් වුව ද මූල්‍ය ප්‍රකාශන අනුව එම ශේෂය රු.11,819,250ක් වූයෙන් රු.6,653,291ක වෙනසක් නිරීක්ෂණය වී තිබුණි

(ගා) අඹේවෙල කර්මාන්තශාලාවේ මිලදී ගැනීම් වෙනුවෙන් 2009,2010,2011,2015,2017 හා 2018 යන වර්ෂවලදී ලබා දුන් එකතුව රු.1,268,432ක් වූ අත්තිකාරම් 2020 දෙසැම්බර් 31 දින දක්වා නිරවුල් නොකර පැවති අතර විවිධ ණයගැති ශේෂය වූ රු.3,039,417 තුළ වසර 03 සිට වසර 17

දක්වා අයකර ගැනීමට නොහැකි තිබූ ශේෂය රු.2,739,197ක් විය. එම ණයගැතියන් වෙනුවෙන් තබා ඇති බැංකු ඇපකර මුදල් කර ගැනීමෙන් ණයගැති ශේෂ පියවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) මූල්‍ය ප්‍රකාශනයේ සේවක ණයගැති ශේෂය රු.164,864,339ක් වුවද විගණනයට ඉදිරිපත් කරන ලද උපලේඛනය අනුව ශේෂය රු.163,505,964ක් වූයෙන් රු.1,358,375ක වෙනසක් වූ අතර කර්මාන්තශාලා ගිණුම් අනුව එම ශේෂය රු.164,448,503ක් වූයෙන් රු.415,836ක වෙනසක් විය.

(ඈ) විශ්‍රාම ප්‍රතිලාභ ආයු ගණක අලාභය ලෙස රු.109,295,614 ක් විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් ගිණුමට බැර කර අනෙකුත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයට හර කර එම වටිනාකම විකුණුම් පිරිවැයටද බැර කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ විකුණුම් පිරිවැය එම වටිනාකමින් අඩු වී ලාභය වැඩිවී තිබුණි.

(ඉ) පොලී රහිත ණය යටතේ දීර්ඝ කාලයක සිට පැවත එන ජාතික කිරි මණ්ඩලයට ගෙවිය යුතු රු.2,108,063ක ශේෂය සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නිරවුල් වී නොතිබුණි.

(ඊ) භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ අංක TO/REV/05/33/6 හා 2023 සැප්තැම්බර් 27 දිනැති ලිපිය අනුව කර්මාන්තශාලා නවීකරණ ව්‍යාපෘතිය සඳහා ලබා දී ඇති ණය මුදලින් භාවිතා නොකරන ලද ණය ශේෂය මත අයකරන ලද බැඳීම් මුදල (Commitment charges) වූ රු.56,821,121වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලට ගැලපීම් කර නොතිබුණි.

(උ) විලම්භිත බදු ගණනය කිරීම සඳහා සමාගමේ වත්කම්වල බදු වන තාවකාලික වෙනස්කම් ශේෂය ලෙස රු.4,283,757,781ක් විය යුතු වුවත් විගණනයට ඉදිරිපත් කරන ලද විලම්භිත බදු බදු ගණනය කිරීමේ උපලේඛනයේ අනුව බදු වන තාවකාලික වෙනස්කම් ශේෂය ලෙස රු.4,043,212,846ක් දක්වා තිබූ බැවින් රු.240,544,935 ක් අඩුවෙන් දක්වා තිබුණු අතර එමනිසා ඊට අදාළ විලම්භිත බදු වගකීම රු.43,298,088 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂයේ EY සමාගමේ ආදායම් බදු ගණනය කිරීමේ වාර්තාව අනුව ඉදිරියට ගෙන ගිය බදු අලාභ වටිනාකම ලෙස රු.5,983,567,629 දක්වා ඇති නමුත් සටහන් අංක 14 අනුව විලම්භිත බදු ගණනය කිරීමේදී එම වටිනාකම රු.5,813,714,649 ලෙස ගැනීම නිසා රු.169,852,980 ක වෙනසක් නිරීක්ෂනය වූ අතර එමනිසා ඊට අදාළ විලම්භිත බදු වත්කම රු.30,573,536 කින් අඩුවෙන් ගණනය කර තිබුණි. මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 24.1 හි වර්ෂයේ බදු වියදම ගණනයේදී ඉඩ දිය හැකි ශුද්ධ වටිනාකම රු.790,669,720 ලෙස දක්වා තිබුණ ද ආදායම් බදු ගණනය කිරීමේ වාර්තාව අනුව එම වටිනාකම රු.668,740,389 ක් වූයෙන් රු.121,929,331 වෙනසක් විය. තව ද රජයෙන් ලැබිය යුතු මුදල් සඳහා හානිකරණ ප්‍රතිපාදන ලෙස ගිණුම් ගත කර ඇති රු.278,981,206 ක මුදල විලම්භිත බදු වත්කම් ගණනයේදී සලකා නොබැලීම නිසා විලම්භිත බදු වත්කම රු.50,216,617 ක් අඩුවෙන් ගණනය වී තිබුණි.

(ගෙ) 2016 වර්ෂයට පෙර සිට පැවත එන භාවිතයට නොගන්නා රු.15,699,277ක් වටිනා කිරිපිටි ඇසුරුම් තොග අඹේවෙල කර්මාන්තශාලාවේ පැවතියද 2020 දෙසැම්බර් 31 දිනට ඒවා යල් පැන ගිය තොග ලෙස හඳුනාගෙන නොතිබුණි. තවද සමාගමේ අවසන් තොගය තුළ රු.38,711,150ක් වටිනා වසර 20 ක් ඉක්මවූ සෙමින් නිකුත්වන ඉංජිනේරු තොගයක් ද සාමාන්‍ය තොගයේ රු.42,237,877ක් වටිනා සෙමින් නිකුත්වන තොගයක් හා වටිනාකම හඳුනාගත නොහැකි තොග පැවතුණු අතර එම තත්ත්වයන් සැලකිල්ලට ගෙන තොග වල ශුද්ධ උපලබ්ධි අගය ගණනය කර නොතිබුණි. එසේම දිගන කර්මාන්තශාලාවේ පැවති ඉංජිනේරු තොග වටිනාකම වූ රු.12,679,161ක් හා පොළොන්නරුව කර්මාන්තශාලාවේ පැවති ඉංජිනේරු තොග වටිනාකම රු.311,755ක් ඌණ ගණනය වී තිබුණු අතර තොග අයිතම 08ක් රු.12,715කින් අධි ගණනය වී තිබුණි. තවද පසුගිය වර්ෂවල සිට පැවත එන රු.12,096,362ක ඌන තොග සඳහා වෙන් කිරීමේ ශේෂයක් නිරවුල් නොකර තොගයෙන් අඩුකර පෙන්වා තිබුණි

(ගේ) සමාගම විසින් ඉදිරිපත් කරන ලද උපලේඛන අනුව නොමිලයේ නිකුත් කරන ලද තොග වටිනාකම රු.16,405,193ක් වුවද මූල්‍ය ප්‍රකාශනයන්හි නොමිලයේ නිකුත් කරන ලද තොග වටිනාකම 13,568,166 වුයෙන් රු 2.837.027 වෙනසක්ද දිගන කර්මාන්ත ශාලාවේ අවසන් තොගය තුළ ඇතුළත් නිමි මාර්ගස්ථ තොගය රු.7,984,542ක් හා නොනිමි තොගය ශේෂය රු.8,616,684ක් වුවද විගණනයට ඉදිරිපත් කරන ලද උපලේඛනය අනුව එම ශේෂ පිළිවෙලින් රු.7,430,582ක් හා රු.7,932,019ක් වූයෙන් රු.553,960ක් හා රු.684,665ක වෙනසක් නිරීක්ෂණය විය.

(ගො) සමාලෝචිත වසරේ මෝටර් රථ රු.6,107,960 කින් වැඩියෙන් ක්ෂය කර තිබුණු බැවින් සමාලෝචිත වර්ෂයේ ලාභය එම වටිනාකමින් අඩුවෙන් නිරූපණය වී තිබුණි. පෙර වසරේ මෙම මෝටර් රථය රු.2,343,300 කින් වැඩියෙන් ක්ෂය කර තිබූ බැවින් ඒ නිසා සමුච්චිත ක්ෂය රු.8,451,259 වැඩියෙන් ද සමුච්චිත ලාභය එම ප්‍රමාණයෙන් අඩුවෙන්ද දක්වා තිබුණි.

(ගෝ) වෙළඳ හා වෙනත් ලැබීම් ශේෂයේ අඩුවීම රු.116,129,364ක් වුව ද මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ එම වටිනාකම රු.108,094,364ක් වූයෙන් රු.8,035,000 ක වෙනසක් විය.

(න) සමාලෝචිත වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ භාවිතයට අයිතිව ඇති වත්කම් (Right to use assets) වෙනුවෙන් ක්‍රමක්ෂය ලෙස රුපියල් 13,321,663 ක් දැක්වුවද ඊට අදාළ පෙර වසරේ සංසන්දනාත්මක අගයන් දක්වා නොතිබුණි.

ඉහත විස්තර කර ඇති පරිදි, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ඇතුළත් ප්‍රමාණාත්මක අයිතම විකල්ප ක්‍රම මගින් තහවුරු කිරීමට හෝ සත්‍යාපනය කිරීමට මට නොහැකි විය. මේ හේතුවෙන්, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සැකසෙන වටිනාකම් හෝ අයිතමයන් වල වාර්තාගත හෝ වාර්තා නොකළ වටිනාකම් හෝ ගනුදෙනු සම්බන්ධයෙන් කිසියම් ගැලපීමක් කිරීමට අවශ්‍ය දැයි මට නිශ්චය කිරීමට නොහැකි විය.

1.3 සමාගමේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන සමාගමේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබාගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැළපෙනවා ද යන්න සලකා බැලීමයි.

මණ්ඩලයේ 2020 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තවදුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුව ද, මතය ව්‍යාචනය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2007 අංක 7 දරන සමාගම් පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

2.1.1 2007 අංක 7 දරන සමාගම් පනතේ 163 (2) (ඇ)වගන්තියේ සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා හට ලබා ගැනීමට නොහැකි වූ අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සමාගම පවත්වාගෙන ගොස් ඇති බව නිශ්චය කිරීමට මා හට නොහැකි විය.

2.1.2 මෙම වාර්තාවේ මතය ව්‍යාචනය සඳහා පදනම ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සමාගමේ මූල්‍ය ප්‍රකාශන, 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තියෙහි අවශ්‍යතාවයන්ට අනුකූල වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප බව.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සමාගම සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

	නිකිරීති/විධානයට යොමුව	විස්තරය
(අ)	අංක පීඊඩී/12 දරන 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය	
	(i) 6.5.1 වගන්තිය	ගිණුම් වර්ෂය අවසන් වී දින 60ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන සහ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණේ 2023 අගෝස්තු 11 වන දිනය.ඒ අනුව දින 910 ක් ප්‍රමාද වී තිබුණි.
	(ii)4.2.6 වගන්තිය	කාර්යසාධන වාර්තා/ ප්‍රගති වාර්තා පිළියෙල කර ඉදිරිපත්කළ යුතු නමුත් 2020 වර්ෂය වෙනුවෙන් එසේ වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.
	(iii) 5.1.2 වගන්තිය	ව්‍යාපාරික සැලැස්මට ඇතුළත් විය යුතු සංවිධාන ව්‍යුහය හා කාර්යය සාධන දර්ශක යන කරුණු 2019,හා 2020 වෙනුවෙන් පිළියෙල කරන ලද ව්‍යාපාරික සැලැස්මෙහි ඇතුළත් කර නොතිබුණි.
(ආ)	2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය	
	5(2) වගන්තිය	පිළියෙල කරන ලද ක්‍රියාකාරී සැලැස්මට අන්තර්ගත විය යුතු වාර්ෂික අයවැය ලේඛනයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය හා වර්ෂය සඳහා ණය ආපසු ගෙවීමේ සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

2.2.3. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර සමාගමේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

(අ) බඩල්ගම කිරි සැකසුම් කර්මාන්ත ශාලාව ස්ථාපිත කිරීම සඳහා රු.9,718,217,432 ක (යූ.රෝ 63,935,641) කොන්ත්‍රාත් වටිනාකමකට 2016 වර්ෂයේ විදේශ කොන්ත්‍රාත් සමාගමක් සමග ගිවිසුම්ගතවී තිබුණු අතර එය 2019 වසරේදී අවසන් කිරීමට නියමිත විය. 2020 දෙසැම්බර් 31 දිනට රු.11,672,291,523 ක් වැය කර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරමින් පැවතුණි. බඩල්ගම කිරි කර්මාන්තශාලාව ඉදිකිරීමේ කොන්ත්‍රාත් කටයුතු රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයෙන් බැහැරව විදේශීය ඉදිකිරීම් සමාගමකට ලබා දී තිබුණි. මෙම ව්‍යාපෘතිය ලංසු නොමැති ව්‍යාපෘතියක් (Unsolicited Project) ලෙස ක්‍රියාත්මක වී ඇති අතර ඊට අදාළ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අතිරේක 23 හි 3 වගන්තිය යටතේ දක්වා ඇත්තේ විශේෂ තාක්ෂණික ඥාණයකින් යුත් කොන්ත්‍රාත්කරුවන් සොයාගත නොහැකි ව්‍යාපෘති වලට පමණක් මෙසේ Unsolicited ව්‍යාපෘති ලෙස ක්‍රියාත්මක කළ හැකි බවයි. නමුත් මෙවැනි කර්මාන්තශාලාවක් ඉදිකිරීම ජාත්‍යන්තර මිල කැඳවුම් මගින් කොන්ත්‍රාත්කරුවකු සොයා ගැනීමේ හැකියාවක් ඇති බැවින් ඉදිකිරීම් පිරිවැය සඳහා ගිවිසුම්ගත තිබූ රු.9,718,217,432ක (යූ,රෝ 63,935,641) මුදල අවම ලංසුව පිළිගත නොහැකිව තිබුණි. එම කිරි කර්මාන්තශාලාවට දිනකට දියර කිරි ලීටර් 400,000 ක් අවශ්‍ය බව ඇස්තමේන්තු කර තිබුණ ද වර්තමානයේ අඹේවෙල,පොළොන්නරුව,දිගන හා කොළඹ යන අනෙකුත් ක්‍රියාකාරී කර්මාන්තශාලා 04 සඳහා ආයතනයට එකතු කළ හැකි දෛනික දියර කිරි ප්‍රමාණය ලීටර් 200,000 ක් පමණක් වන බැවින් මෙම බඩල්ගම සැකසුම් කර්මාන්තශාලාවේ යන්ත්‍ර සම්පූර්ණ ධාරිතාවයෙන් භාවිතා කළ නොහැකි බව නිරීක්ෂණය විය.

(ආ) පොළොන්නරුව කිරි කර්මාන්තශාලාවේ ශීතාගාරය ඉදිකිරීම් යටතේ වූ ප්‍රසම්පාදන කටයුතු පරීක්ෂා කිරීම සඳහා අදාළ ගෙවීම්වල විස්තර ඇතුළත් ප්‍රසම්පාදන ලිපිගොනු, අංක FLS/C/MILCO/01/2020/2023/Info/01 දරන 2023 අගෝස්තු මස 21 දිනැති ලිපිය මගින් අයදුම් කර සිටි නමුත් විගණනට ඉදිරිපත් නොකිරීම මත විගණනයේ විෂයපථය සීමාවීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළ ගෙවා තිබූ රු. 16,169,330 ක වටිනාකමට අදාළ ගෙවීම් පරීක්ෂා කිරීමට විගණනයට නොහැකි වී තිබුණි.

2.3. වෙනත් කරුණු

(අ) සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුල ඇතුළත් ප්‍රධාන කාර්යාලයේ බදු සඳහා වෙන්කිරීම් ශේෂය තුළ වසර ගණනාවක සිට පැවත එන රු.8,425,296 ක ආදායම් බදු දඩ මුදල් වෙනුවෙන් සිදු කරන ලද වෙන්කිරීම් ශේෂයක් පැවත එන අතර සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාගමේ මූල්‍ය තත්ත්ව සටහන් අංක 18 හි ඇතුළත් වෙළෙඳ ණයහිමි ශේෂයට අදාළව විගණනයට ඉදිරිපත් කර ප්‍රධාන කාර්යාලයේ ණයහිමි කාල විශ්ලේෂණය අනුව වර්ෂ 01 ත් 05 ත් අතර කාලයක සිට පැවත එන ශුද්ධ ණයහිමියන් රු.5,825,286 ක් හා වර්ෂ 05 ට වඩා වැඩි කාලයක සිට පැවත එන ශුද්ධ ණයහිමියන් රු. 6,434,020 ක් පවතින බව නිරීක්ෂණය වී තිබුණි.

(ඇ) මිනිස් පරිභෝජනයට නුසුදුසු කිරිපිටි නිෂ්පාදනය කිරීම සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

(i) 2017 වර්ෂයේ ජූලී මස සිට අඹේවෙල නව කිරිපිටි යන්ත්‍රාගාර නිෂ්පාදන කටයුතු ආරම්භ කර තිබුණු අතර එදින සිට 2018 ජනවාරි මස 18 දින දක්වා නිෂ්පාදිත කිරිපිටි අතරින් පිරිවැය රු.මිලියන 475.2 ක් වූ මෙට්‍රික් ටොන් 720 ක ප්‍රමාණයක් දෝෂ සහිත බවත් ඒවා මිනිස් පරිභෝජනයට නුසුදුසු බව සමාගමේ රසායනාගාර වාර්තා මගින් තහවුරු කර තිබුණු අතර පේරාදෙණිය ගන්නෝරුව පශු වෛද්‍ය පර්යේෂණ ආයතනය මඟින් කළ පරීක්ෂාවට අනුව මෙම කිරිපිටි වමාරා කන සතුන්ගේ ආහාර සඳහා අමුද්‍රව්‍යයක් වශයෙන් යොදා ගැනීම සුදුසු බවට 2018 අගෝස්තු 07 දින එම ආයතනය විසින් දන්වා තිබුණි. පාරිභෝගිකයන්ගෙන් පැමිණිලි ලැබීමෙන් පසු නැවත ගබඩාව වෙත ගෙන්වා ගත් කිරිපිටි තොගයෙන් කිලෝග්‍රෑම් 666,075 ක ප්‍රමාණයක් 2020 දෙසැම්බර් 31 දින වන විටත් ගබඩාවේ පැවති අතර ඒ හේතුවෙන් ගබඩාවේ අනෙකුත් මෙහෙයුම් කටයුතුවලට බාධා සිදු වී ඇති අතර මෙම පාඩුව සම්බන්ධයෙන් විනය පරීක්ෂණයක් පවත්වා නොතිබුණි.

(ii) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1 (ඇ) උප වගන්ති අනුව ලංසු සඳහා තරඟකාරිත්වය සීමා කිරීම් ඇති කිරීමක් හෝ එසේ හැඟවීමක් සිදු නොකළ යුතු අතර උනන්දුවක් දක්වන ඕනෑම පාර්ශවයන්ට ලංසු සඳහා සහභාගිවීමට කටයුතු සැලසිය යුතුය, යන්නට පටහැනිව මිනිස් පරිභෝජනයට නුසුදුසු කිරිපිටි කිලෝග්‍රෑම් 666,075 ක තොගය සත්ත්ව ආහාර සඳහා අමුද්‍රව්‍යක් වශයෙන් අලෙවි කිරීමට ලංසු කැඳවීමේදී ලංසු සඳහා ආරාධනය කළ ලිපියේ "සම්පූර්ණ කිරිපිටි තොගයම එකවර මිලදී ගත යුතුයි" යන කොන්දේසි මඟින් ලංසු කරුවන් ඉදිරිපත් වීම සීමා කර තිබුණු බව නීරීක්ෂණය වූ අතර එම නිසා ඉහත තොගය 2020දෙසැම්බර් 31 දින වන විටත් ගබඩා තුළ පැවතුණි.

(ඇ) පොල්ගහවෙල කර්මාන්තශාලාවේ ණයගැති කාල විශ්ලේෂණය අනුව වසර 04ත් 16ත් අතර වූ ගව ආහාර ණයගැති ශේෂය රු.3,306,178ක් වූ අතර එය මුළු ගව ආහාර ණයගැති ශේෂයෙන් සියයට 18 ක් වූ අතර වසර 11ත් 16ත් අතර වූ ප්‍රවාහන ණයගැති ශේෂය රු.4,648,233කි.මෙම ශේෂ දිගුකාලීනව පැවත එන ණයගැති ශේෂ වන අතර අයකර ගැනීමෙන් තොරව පැවතුණි.

(ඉ) පොළොන්නරුව කර්මාන්තශාලාවේ මුළු ණයගැති ශේෂය රු.52,488,032ක් වූ අතර ඉන් රු.50,441,873ක් ම මාස 06 ඉක්මවූ විකුණුම් වන අතර කර්මාන්තශාලාවේ සාමාන්‍ය ණයට විකුණුම් පියවීමේ කාලය ඉන්වොයිසි දින සිට දින 30ක් වුව ද එසේ අයකරගැනීම් සිදුනොකර පුද්ගලික ආයතනයක් වෙත 2018 වර්ෂයේදී රු.9,005 ක් සහ අධ්‍යාපන අමාත්‍යාංශය වෙත 2018 වර්ෂයේදී රු. 534,140 ක් හා 2019 වර්ෂයේදී රු. 40,875,996 ක් වශයෙන් එම ආයතන වෙතම නැවත විකුණුම් සිදුකර තිබුණි. අධ්‍යාපන අමාත්‍යාංශය වෙත සිදුකර විකුණුම් සඳහා බැංකු සුරක්ෂන ලබාගෙන නොතිබුණි.

(ඊ) එකතුව රු.6,896,851ක් වූ ප්‍රධාන කාර්යාලයෙහි අත්තිකාරම් ශේෂය තුළ ඇතුළත් 2017,2018 හා 2019 වර්ෂවලදී විවිධ කාර්යයන් ඉටුකිරීම වෙනුවෙන් ලබාදුන් එකතුව රු.958,973ක් වූ අත්තිකාරම් ශේෂ 2020 දෙසැම්බර් 31 දක්වාම නිරවුල් කර නොතිබුණි. තව ද කිරි එළදෙනුන් මිලදී ගැනීම වෙනුවෙන් රු.3,049,500ක අත්තිකාරම් මුදලක් ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට 2020 ඔක්තෝබර් 28 දින ගෙවා තිබුණද හාණ්ඩ ලැබීම් පත්‍රිකාව (GRN) ඉන්වොයිසිය සමඟ එකඟ නොවීම හේතුවෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගැනීමෙන් තොරව නිරවුල් නොකර පැවතුණි. ඉහත රු.6,896,851ක් වූ අත්තිකාරම් ශේෂයෙහි ඇතුළත් රු.724,900 ක් වූ අත්තිකාරම් ශේෂ 2023 අගෝස්තු 15 දක්වාම නිරවුල් කර නොතිබුණි.

(උ) අඹේවෙල කර්මාන්තශාලාවේ අංක 2065230 දරන ජංගම ගිණුමට අදාළව බැංකු සැසඳුම් ප්‍රකාශනයට අනුව මුදල් පොතේ ශේෂය රු.6,812,986 ක් වුව ද මූල්‍ය ප්‍රකාශනයන්හි එම ශේෂය රු.6,763,927ක් වූයෙන් රු.49,050 ක වෙනසක් පැවති අතර පොළොන්නරුව කර්මාන්තශාලාවේ අංක 005100160000970 දරන ගිණුමට අදාළව බැංකු සැසඳුම් ප්‍රකාශනයට අනුව මුදල් පොතේ ශේෂය රු.6,392,960 ක් වුව ද මූල්‍ය ප්‍රකාශනයන්හි එම ශේෂය රු.6,252,967ක් වූයෙන් රු.139,993ක වෙනසක් පැවතුණි.

(ඌ) මූල්‍ය ප්‍රකාශන තුළ දීර්ඝ කාලයක සිට පැවත එන රජයෙන් ලැබිය යුතු වටිනාකම රු.94,333 ක් වූ ශේෂය සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් 2020 දෙසැම්බර් 31 දක්වාම ගෙන නොතිබුණි.

ඩබ්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

මූල්‍ය (ප්‍රද්ගලික) සමාගම මූල්‍ය විශ්ලේෂණ

ප්‍රධාන මූල්‍ය තත්වයන්
රු. මි. වලින්

		2020 Jan to Dec	2019 Jan to Dec	2018 Jan to Dec	2017 Jan to Dec	2016 Jan to Dec	2015 Jan to Dec	2014 Apr to Dec	2013/2014 Apr to Mar	2012/2013 Apr to Mar	2011/2012 Apr to Mar
මෙහෙයුම් ප්‍රතිඵල											
පිරිවැටුම(ශු.)	රු. මිලියන	11,104.71	10,313.82	11,612.34	10,161.30	8,679.47	7,584.73	5,627.62	7,019.77	6,385.23	5,263.15
මුළු වියදම		10,965.40	11,256.17	12,094.13	10,767.49	8,352.38	7,597.03	5,385.66	6,879.36	6,683.26	5,518.86
දළ ලාභය	රු. මිලියන	1,401.15	396.28	226.94	375.96	835.60	572.76	770.97	1,005.69	486.43	221.90
බදු වලට පෙර ලාභය	රු. මිලියන	225.76	(862.71)	(683.45)	(434.93)	339.33	3.82	248.16	161.11	(267.47)	(244.79)
ආදායම් බදු වියදම	රු. මිලියන	-	-	201.66	(171.26)	(12.25)	(16.12)	(6.20)	(20.70)	(30.56)	(10.92)
බදු වලට පසු ලාභය	රු. මිලියන	225.76	(862.71)	(481.79)	(606.19)	327.08	(12.30)	241.96	140.41	(298.02)	(255.71)
ශේෂ පත්‍රය											
ප්‍රකාශිත ප්‍රාග්ධනය	රු. මිලියන	319.45	319.45	319.45	319.45	319.45	319.45	319.45	319.45	319.45	319.45
රදවාගත් ඉපයුම්	රු. මිලියන	- 28.79	- 145.25	785.18	1,183.74	1,665.98	1,257.79	1,230.94	911.97	745.60	1,035.31
නිදන් අරමුදල	රු. මිලියන	1.69	1.69	1.69	1.69	1.69	1.69	1.69	1.69	1.69	1.69
යන්ත්‍ර සුත්‍ර උත්ශ්‍රේනිගත / ප්‍රතිස්තාපන සංචිතය	රු. මිලියන	25.00	25.00	25.00	25.00	25.00	25.00	25.00	25.00	25.00	25.00
ප්‍රත්‍යාගණන සංචිතය	රු. මිලියන	336.45	336.45	336.45	336.46	336.46	336.46	336.46	336.46	336.46	336.46
කොටස් හිමියන්ගේ අරමුදල	රු. මිලියන	653.81	537.35	1,467.78	1,866.34	2,348.58	1,940.39	1,913.53	1,594.57	1,428.20	1,717.91
ජංගම නොවන වත්කම්	රු. මිලියන	19,165.43	19,580.81	19,471.51	17,511.40	14,763.67	12,261.55	8,143.18	2,244.07	2,123.36	2,275.34
ශුද්ධ ජංගම වත්කම්/(බැරකම්)	රු. මිලියන	801.22	211.35	769.51	1,090.41	1,670.87	(243.15)	(143.37)	431.48	445.67	537.72
දීර්ඝ කාලීන /(විලම්භිත බැරකම්)	රු. මිලියන	19,312.84	19,254.81	18,773.24	16,735.47	14,085.96	10,078.01	6,086.27	1,080.98	1,140.84	1,095.14
අනුපාත											
කොටසක ඉපයුම්	රු.	3.65	(27.01)	(15.08)	(18.98)	10.24	(0.39)	7.57	4.40	(9.33)	(8.00)
කොටස් හිමි අරමුදලට මුළු වත්කම්	වාර	32.90	41.11	15.30	11.10	7.41	7.24	5.40	2.84	2.94	2.37
කොටසකට ශුද්ධ වත්කම්	රු.	20.47	16.82	45.95	58.42	73.52	60.74	59.90	49.92	44.71	53.78
ස්කන්ධ ආදායම	%	34.53	(160.55)	(32.82)	(32.48)	13.93	(0.63)	12.64	8.81	(20.87)	(14.88)
දළ ලාභ අනුපාතය	%	12.62	3.84	1.95	3.70	9.63	7.55	13.70	14.33	7.62	4.22
ශුද්ධ ලාභ අනුපාතය	%	2.03	(8.36)	(4.15)	(5.97)	3.77	(0.16)	4.30	2.00	(4.67)	(4.86)
ජංගම වත්කම් අනුපාතය	වාර	1.52	1.09	1.35	1.52	2.73	0.88	0.94	1.23	1.27	1.43
ක්ෂණික වත්කම් අනුපාතය	වාර	0.79	0.62	0.67	0.69	1.85	0.05	0.66	0.91	0.94	1.04